තිමූර්ගේ බලකාය

අර්කාදි ගයිදාර්

තිමූර් සහ බලකාය

අර්කාදි ගයිදාර්

- පරිවර්තනය -

චූලානන්ද සමරනායක

තිමූර් සහ බලකාය

© චූලානන්ද සමරනායක

ප්‍රථම මුද්‍රණය - 2019
දෙවන මුද්‍රණය - 2022
ISBN 978-955-0745-57-9

ප්‍රකාශනය

රුසියාව ප්‍රකාශකයෝ
34, කනගරත්න පෙදෙස,
ලක්‍ෂපතිය, මොරටුව.
071 488 1182

පරිගණක පිටු සැකසුම සහ
කවර නිර්මාණය

ප්‍රමුදිත ග්‍රැෆික්ස්
නො. 07, ආනන්දාරාම පාර,
මොරටුමුල්ල, මොරටුව.
076 038 1680

මුද්‍රණය

තියෝ ග්‍රැෆික්ස්
අංක 143, උඩහමුල්ල දුම්රියපොළ පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
011 2 820220

තිමූර් සහ බලකාය

අර්කාදි ගයිදාර්

රුසියාව
ප්‍රකාශකයෝ

පෙරවදන

සමහර මිනිස්සු දිගු කාලයක් ජීවත් වෙති. එහෙත් මිහිමත සිය සළකුණු නොතබා, නැතිනම් අප්‍රසන්න සළකුණු ඉතිරි කර නික්ම යති. ඒ අතර තවත් සමහරු ඉතා කෙටි කාලයක් දිවි සැරියෙහි යෙදී සදානුස්මරණීය මතකයන් ඉතිරි කර නික්ම යති. එවන් මිනිසුන් නික්ම ගිය පසුව ලොවෙහි ඇතිවන හිදැස පිරවීම ලෙහෙසි නැත. එසේම එවැන්නකු මිහි මත සරනා කාලය දශක කිහිපයක් වුවද එය මානව ඉතිහාසයෙහි වෛවර්ණ පිටුවක් බවට පත්වෙයි.

අර්කාදි පෙත්‍රොවිච් ගයිදාර් නම් සෝවියට් ලේඛකයා හැඳින්විය හැක්කේ එසේ කෙටි කලක් තුළ ලොවෙහි ස්වර්ණමය සටහන් ඉතිරි කර නික්ම ගිය නිර්මාණකරුවකු, විප්ලවවාදියකු ලෙසිනි. වයස අවුරුදු දහසයේදී රෙජිමේන්තුවක අණ දෙන නිලධාරියකු වශයෙන් ජනතාව උදෙසා සටනට ගියාවූද, වයස අවුරුදු තිස් හතේදී නාසිවාදයට එරෙහි සටනෙහිදී දිවි පුදන්නාවූද අර්කාදි ගයිදාර් සෝවියට් සාහිත්‍යයේ මතුනොව සෝවියට් විප්ලවයෙහිද අමරණීය චරිතයක් බව අවිවාදිතය. ඔහු උපත ලබන්නේ 1904 ජනවාරි 22 දිනදීය. ඔහු උපත ලබනුයේ සාර් පාලනය යටතේ පැවති පැරණි රුසියාවෙහිය. ල්ගොව් නගරය යනු ඔහුගේ උපන් බිමයි. ගුරු යුවළකට දාව මෙලොව එළිය දකිනා ඔහුගේ සැබෑ නම අර්කාදි පෙත්‍රොවිච් ගොලිකොව් වූ අතර පසුව ඔහු සිය නම ලෙස ගයිදාර් තෝරා ගනියි. අතීතයෙහිදී අසරු සේනාංක නික්මෙන්නට

පෙර ඔත්තු බැලීම පිණිස පෙරමගට යවන ලද පුද්ගලයා හඳුන්වන ලද්දේ ගයිදාර් නමිනි. ඉදින් සිය දිවියෙහිදීද දේශය වෙනුවෙන් ඔත්තු සේවා සෙබලකු ලෙසද මෙහෙ කළ ඔහු ගයිදාර් යන්න තම නමට ඈඳා ගැනීමෙහි අරුමයක් නැති බව ඒ අනුව අපට පෙනෙයි. අර්කාදි සිය ළමා විය ගෙවනුයේ සිය පියා පළමු ලෝක මහා සංග්‍රාමයට නික්මෙන අයුරු දකිමිනි. සිය පියා අනුව යමින් යුදබිමට යාම පිණිස අර්කාදිද කරනුයේ නිවසින් පලා යාමය. එහෙත් නිවසින් කිලෝ මීටර් අනූවක් දුරදී ඔහු නතර කරනු ලැබ නැවත නිවෙස කරා එවනු ලැබිණි. මෙයින් අපට අර්කාදිගේ දිවිය තුළ හුත් නිර්භීත සටන්කරුවා හඳුනාගත හැකිය. මේ නිර්භීත යෞවනයාගේ සෙවනැළි අපට ඔහුගේ නිර්මාණ දිවිය පුරාම දකින්නට ලැබෙයි.

1917 සෝවියට් විප්ලවය සමගම අර්කාදිගේ පියා විප්ලවීය හමුදාවෙහි රෙජිමේන්තු කොමසාරිස්වරයකු ලෙස පත්කරනු ලැබූ අතර අර්කාදි හට බොල්ෂෙවික්වරුන් සහ විප්ලවය වඩාත් සමීප වන්නට පටන් ගැණින. පියා සිය දිවියෙන් සැලකිය යුතු කාලයක් සිවිල් යුද පෙරමුණෙහි ප්‍රතිවිප්ලවවාදීන්ට එරෙහිව සටන් කරමින් විප්ලවය රැකගැනීමට අරගල කරද්දී අර්කාදිද නතර වනුයේ විප්ලවයෙහි සටන් පෙරමුණෙහිය. ප්‍රතිවිප්ලවවාදීන්ට එරෙහි ඔත්තු සෙබලකු ලෙස සිය විප්ලවවාදී දිවිය අරඹන ඔහු 1918 අගෝස්තු 29 දින මහත් ප්‍රහර්ෂයෙන් ඔද වැඩී විප්ලවීය පක්ෂ සාමාජිකත්වය ලබා ගති. එවිය ඔහුගේ වයස යාන්තම් දහහතරකි. ඉදින් 1941 ඔක්තෝබර් මස 26 වන දින උක්රයිනයේ ල්‍යාප්ල්‍යාවා නම් ගම ආසන්නයේදී සතුරු හමුදා විසින් ඝාතනය කරනු ලැබූ දිනය දක්වා ගෙවුන කෙටි දිවිය සැබෑ විප්ලවවාදී එකක් බවට පත්කරගැනීමට මේ අපූරු මිනිසා අදිටන්සහගතව සිටියේය.

ඔහු 1918 දී සෝවියට් රතු හමුදාවට බැඳෙනුයේ සිය වයස වැඩියෙන් දක්වමිනි. හමුදා පුහුණු පාසලකට යවන ලද ඔහුට එය නිම කිරීමට පෙරම විප්ලවයේ ආරක්ෂාව පතා සටන් බිමට යාමට සිදුවිණි. 1919 දී ඔහු පෙරමුණේදී තුවාල ලබා පසුව උණ සන්නිපාත රෝගයටද ගොදුරු වීය. එහෙත් යුද පෙරමුණ ඔහුගෙන් ඈත් කිරීමට මේ කිසිදු බාධකයක් සමත් වූයේ නැති. විප්ලවය ආරක්ෂා කිරීමේ ඓතිහාසික වගකීමට නොපැකිල උර දුන් ඔහු නැවත පෙරමුණට යන්නේ කුබාන් පලාතෙහි විප්ලවීය බලකායක අණ දීමේ වගකීම භාර ගනිමිනි. නමුදු 1924දී මුහුණ දුන් ෂෙල් වෙඩි ප්‍රහාරයක බරපතල කම්පනය හේතුවෙන් ඔහු පෙරමුණින් මුදා හරින ලද්දේය.

පාසල් වියෙහිදී අර්කාදි උග්‍ර සාහිත්‍ය ලෝලියෙක් විය. ඔහු වැඩියෙන් සමීප වූයේ ගොගොල්, පුෂ්කින්, තෝල්ස්තෝයි, ගොන්චාරොව්, පිසරොව්, දස්තයෙවුස්කි, ශේක්ස්පියර් සහ මාක් ට්වේන් වෙතය. අසීමිත කියවන්නකු වූ ඔහුගේ දිවියට මේ සම්භාව්‍ය ලේඛකයන්ගේ නිර්මාණ හරහා වැටුණේ අමිල ආලෝක දහරාවකි. මේ අතර විප්ලවවාදී දේශපාලනයෙහි අනුරාගික ඇලීම සමගින් ඔහු තුළ වර්ධනය වූ පංති ප්‍රේමය ඔහු විඩා රහිතව මිනිසා වෙනුවෙන් සේවය කරනා විප්ලවවාදියෙකු බවට පත් කළේය. සාහිත්‍ය ඇසුරත් විප්ලවවාදීන් ගේ ඇසුරත් සිය පියා ගේ ප්‍රයෝගික දිවියත් ඔහු මත ඇති කළ බලපෑමත් අර්කාදිගේ හැඩගැස්මට කල බලපෑම අතිවිශාලය.

අර්කාදි ගයිදාර් සැලකෙනුයේ සෝවියට් ළමා සහ යෞවන සාහිත්‍යය ගොඩනැගීමෙහිලා අනුපමේය සේවයක් කළ නිර්මාණකරුවකු ලෙසිනි. සැබැවින්ම ඔහුගේ නිර්මාණයන් තුළ ඔහුගේම දිවියෙහි සෙවනැල්ල වැටී ඇති ආකාරය ඉතා පැහැදිලිය. ඔහු සිය ලේඛණ හැකියාව කැප කළේ තමන් සිය දිවි නොතකා සටන් කළ විප්ලවයෙහි සාර ඵලයන් මතු පරපුරට උරුම කර දීම පිණිසය. එහිදී ඔහු සිය කෘතීන් හරහා සිය දේශයෙහි යෞවන පරම්පරාව විප්ලවය ආරක්ෂා කරනා, ජනතාවගේ විමුක්තිය උදෙසා මෙහෙ කරනා පිරිසක් බවට පත් කිරීමේ අවංක අභිලාෂයෙන් කටයුතු කළ බව පැහැදිලිය. ඔහුගේ කෘතීන් හී අපට හමුවන චරිත සැබෑ ලෙසම ජනතාව වෙනුවෙන් කැපවන ළමා විරු චරිතයන්ය. මෙය ව්‍යාජයක් නොවන්නේ අර්කාදිම සිය දිවියෙන් එසේ ආදර්ශ සැපයූ හෙයිනි. එහෙයින් ඔහුගේ කෘති තුළ අප දකිනුයේ අව්‍යාජත්වයයි.

චූලානන්ද සමරනායක
පසන් නිවස
පහලවත්ත
මානන්දූව
වස්කඩුව
071 420 40 92

සන්නද්ධ හමුදා බලකායක අණදෙන නිලධාරියා වූ කර්නල් ඇලෙක්සැන්ඩ්‍රොව් නිවසින් පිටව ගොස් ඒ වන විට මාස තුනක් ඉක්ම ගොසිනි. පෙනුන පරිදි නම් ඔහු සිටියේ ඔහුගේ බලකාය සමගිනි. මොස්කව් නගරාසන්නයෙහි ගම්බද පලාතක කුඩා නිවහනක් කුලියට ගෙන වාරාවසාන නිවාඩුවෙහි ඉතිරි කාලය එහි ගෙවන්නැයි විදුලි පණිවුඩයක් එවමින් ඔහු ගිම්හාන සෘතුව මැද භාගයේදී සිය දියණියන් වන ඔල්ගා සහ ජෙනී හට උපදෙස් දුන්නේය.

හිස බඳින මල් වැටුන සළුව පසුපසට තල්ලු කර ජෙනී ඔල්ගා ඉදිරිපිට කොසු මිටට වාරුවී සිය අක්කණ්ඩිය උපදෙස් දෙන ආකාරය පැඟිරි කරගත් මුහුණින් බලා සිටියාය:

'මං පහල තියෙන ලොරියට බඩු අරගෙන එන්නං. ඔයා ගේ පිරිසිදු කරන්න. ආයෙ මෙතන රවාගෙන කට ඇදකරගෙන ඉන්න ඕනැ නෑ. ඔයා යද්දි දොර අගුළු දාගෙන යන්න. පොත් ටික පුස්තකාලෙට ආපහු දෙන්න. දැන් ඔන්න අපි ගිහිල්ල එන්නං කියන්න ඔයාගෙ යාළුවො ඔක්කොම ලඟට දුවනව හෙම නෙවෙයි. කෙලින්ම ස්ටේෂන් එකට යන්න. එතනදි ඔයා තාත්තට මේ විදුලි පණිවුඩේ යවන්න ඕනැ. ඊට පස්සෙ කෝච්චියෙ නැගල කෙලින්ම විලා එකට එන්න. ජෙනී ඔන්න ඔයා මං කියපු විධිහටම කරන්න ඕනැ. ඔක්කොටම වඩා මං ඔයාගෙ සහෝදරී.....'

'ඉතිං මාත් එහෙමනෙ.'

'හරියට හරි. ඒ වුණාට මං ඔයාට වඩා වැඩිමල්නෙ. අනික, තාත්තා අපිට කරන්න කියල කිවුවෙ එහෙමයි.'

පහල මිදුලෙහි ලොරිය පණගැන්වෙන හඬ ඇසුණ විට ජෙනී සුසුමක් හෙලා කාමරය සිසාරා නෙත් හෙළුවාය. ඇගේ නෙත ගැටුණේ එහෙමපිටින්ම අවුල්ව ගිය කාමරයකි. ඇය විරුද්ධ පැත්තේ බිත්තියෙහි එල්ලුණ සිය පියාගේ ඡායාරූපයක පිලිබිඹුව දිස්වුණ දූහුවිලි බැඳුන කණ්නාඩිය කරා ගියාය.

එසේනම් කාරණා සිද්ධ වෙන්නේ එලෙසටය. ඕල්ගා වැඩිමහල් නිසා ඇය ගේ වදන්වලට දැනට කීකරු විය යුතුය. එනමුදු තාත්තාගේ නාසය, කට සහ ඇහි බැම පිහිටා ඇත්තේ ඇය, එනම් ජෙනීටය. ඒ සියල්ලටමත් වඩා තාත්තාගේ චරිත ලක්ෂණද උරුමව ඇත්තේ අක්කාට නොව ඇයට බව ඉදිරියේදී පෙනෙනු ඇත්තේය.

සිය හිස බැඳි සළු පටෙහි ගැටය තද කරගත් ඇය දෙපා ගස්සා සෙරෙප්පු යුවල පන්නා ඩස්ටරයක් අතට ගත්තාය. ඉන්පසුව වේගයෙන් මේස රෙද්ද ඇද දැමූ ඇය කරාමය යටින් බාල්දියක් තබා කොස්ස ඩැහැගෙන දොර වෙත කුණු ගොඩක් තල්ලු කරගෙන ගියාය.

ඉක්මනින්ම තෙල් දමා දල්වනු ලබන උදුන පටපට ගාමින් ඇවිලෙන්නට වූයේ ප්‍රිමස් උදුනින් "ස්ස්ස්" නද නික්මෙන්නට වීය. ගෙබිම වතුරින් නැහැව ගියේය. තහඩු සෝදන බේසම තුළ සබන් පෙණ සහිත ජලය පිරුණේය.

මේ අතරේ මහ මග යන්නෝ නෙවන මහලෙහි පුළුල්ව ඇර දමන ලද ජනේලයක් පිරිසිදු කරමින් ජනෙල් පඩිය මත නග්න දෙපතුලින් නිර්භයව නැග සිටිනා රතු පැහැ ඇඳුමක් හැඳි කෙල්ල දෙස අයාගත් මුවින් බලන්නට වූවෝය.

ලොරිය හිරු රැසින් නැහැවුන පුළුල් මාවත දිගේ වේගයෙන් ඇදී ගියේය. සිය දෙපා සූට්කේසයක් මත තබාගෙන සැහැල්ලු පොදියකට වාරුවී ඕල්ගා ලොරියෙහි පිටුපස කොටසෙහි වේවැල් පුටුවක හිඳ සිටියාය. ඇගේ උකුලෙහි රතු සහ කහ පැහැය මුසු බළල් පැටවෙක් බඩ ඉරිඟු මල් පොකුරක් සමගින් සෙල්ලම් කරමින් පසුවීය.

විසිවෙනි සැතපුම් කණුවට ළඟා වූ පසු මෝටර් රිය පේලියක් ඔවුන් පසුකර ගියේය. සිය රයිෆල් වල කට අහසට යොමුවන සේ තබාගෙන දූවමුවා බංකු මත පේලියට හිඳ සිටි සොල්දාදුවෝ ප්‍රමෝදයෙන් ගී ගයමින් පසුවූවෝය.

මේ ගායනයන්හී හඬ ඇසුණ සැණින් නිවෙස්හී දොරවල් සහ ජනෙල් විවෘත කෙරිණි. ඇවිස්සුණු ළමෝ වැටවල් මතින් සහ ගේට්ටු අතරින් දිව ආවෝය. අඩක් ඉදුණු ඇපල් ගෙඩි සොල්දාදුවන් වෙත වීසි කරමින් අත වනමින් ජයගෝෂා කළ ඔවුහු සොල්දාදුවන් රැගත් රිය පෙල දසුනින් අතුරුදන් වීමට පෙර ගනට වැවුණ වල් පඳුරු ගොමු සහ කටු ලැහැබ් පීරමින් අශ්වාරෝහක බලඇණි මෙන් රණ කෙළි ආරම්භ කළෝය.

මේ අතර ලොරිය විහිදී ගිය නිවාඩු නිකේතන භූමියක් වෙත හැරුණේ ඉත්ත වැලින් වැසී ගිය බිත්ති වලින් යුත් කුඩා දැවමුවා නිවෙසක් ඉදිරිපිට නතර වීය. ලොරියෙහි පැති දොරවල් විවර කළ රියදුරා සහ සහායකයා ඉන්පසු බඩු බෑමට පටන් ගත්තෝය. ඔල්ගා ඒ අතරේ වීදුරු දමන ලද ප්‍රවේශ දොටුව විවෘත කළාය.

එහි සිට බලන විට දිස්වූවේ පිලිවෙලකට නැති, අත්හැර දමනලද ගෙවුයනක දසුනකි. ගෙවුයනෙහි එහාම අන්තයෙහි ලෙලදුන් රතු පැහැ ධජයක් සහිත තට්ටු දෙකේ අබලන් මඩුවක් තිබිණි.

ඔල්ගා ආපසු ලොරිය කරා පැමිණියාය. එහිදී කඩිසර මහළු කතක් ඇගේ වැලමිටින් අල්ලා ඇද්දාය. ඒ යාබද නිවසෙහි වාසය කළ කිරිකාරියයි. ඇය මෙහි පැමිණ සිටියා නිවෙස අස්පස් කර ජනෙල් වීදුරු පිරිසිදු කරදීමට උපකාර වනු පිණිසය.

අසල්වැසි ස්ත්‍රිය සිය බුරුසු සහ බාල්දි සූදානම් කරගන්නා අතරේ ඔල්ගා බළල් පැටියාද තුරුළු කරගෙන ගෙවත්තට පියමැන්නාය.

චෙරි ගස්වල අතු මත උණුසුම් ලාටු කැටි ගැසී දිස්න දුන්නේය. කරන්ට්, ඩේසි සහ වෝම්වුඩ් මල් වල සැර සුවඳින් වාතලය පිරී පැවතියේය. මඩුවෙහි පෙඳ පාසි බැඳි පියස්ස සිදුරුවලින් පිරී පැවති අතර මේ සිදුරු අතරින් තදට අදින ලද කම්බි පිටතට විහිදුණේ අසල වූ තුරු වල පත් ගොන්න අතරෙහි ඒවා අතුරුදන්ව ගියේය. හේස්ල් පඳුරු ගොන්නක් පීරාගෙන ඇදුනු ඔල්ගා මුහුණෙහි ඇලීගිය මකුළු දැලක් පිස හැරීමට නතර වූවාය.

ඒ සිදුවූයේ කුමක්ද? මඩුවෙහි පියස්ස මත වූ කණුවෙහි එල්ලෙමින් තිබූ රතු ධජය එක්වරම අතුරුදහන්ව ගියේය.

දැන් ඔල්ගා හට වේගයෙන් කෙරුණ ප්‍රීතිමත් කෙඳුරුම්වල හඬ ඇසෙන්නට විණි. මඩුවෙහි ජනෙල් කවුලුවට වාරු කර තිබූ බර හිණිමග

වියලි අතු කිහිපයත් කඩාගෙන, බිම සිටුවා තිබූ බර්ඩොක් පඳුරු ද තලාගෙන එක්වරම බිම ඇද වැටුණේය.

ඒ සමගම වහලය තුළින් තදට ඇද තිබූ කම්බි පොපියන්නට පටන් ගැණින. බියපත් වූ බළල් පැටවා ඔල්ගාගේ අතද සූරාගෙන කටු පඳුරු මතට පැන්නේය. අන්දුන් කුන්දුන් වූ ඔල්ගා එහෙමම නැවතී හාත්පස නෙත් යොමා මහත් උනන්දුවෙන් සවන් දී සිටියාය. එහෙත් ගස් අතරින්, වැටට ඔබ්බෙන් නැතිනම් මඩුවෙහි අඳුරු ජනෙල් කවුළුව පිටුපසින් කිසිවක් අසන්නට හෝ දකින්නට ලැබුණේ නැති. ඇය ආලින්දය වෙත හැරුණාය.

'අර ළමයි රංචුව ආයෙත් මොකක් හරි උප්පරවැට්ටියකට අරාදිනව වගේ.' කිරිකාරිය ඔල්ගාට පවසා සිටියාය. 'ඊයෙත් ඔය රංචුව අපිට අල්ලපු වත්තෙ ඇපල් ගස් දෙකක් හොල්ලලා ඒවයෙ තිබ්බ ගෙඩි බිම දැම්මා. පෙයාර්ස් ගහක අතුත් කඩල දැම්මා. මහ නරකාදි කොල්ලො තමයි මේ නං. නියම තක්කඩි. පෙරෙයිදා මගෙ කොල්ලා හමුදාවට ගියා මගෙ රත්තරනේ. ඒකා යන්න කලින් එක ඇබින්දක් අඩි ගැහුවෙ නෑ. ගිහිල්ලා එන්නං අම්මෙ-මෙන්න ඒකා උඃරුවන් බබා යනව. මගෙ රන් පැටියා. හැන්දෑ වෙද්දි මට මං ගැනම දුක හිතෙන්න ගත්තා. ඔය කෙනකුට එහෙම දැනෙන්නෙ අන්න ඒ වගේ. ඉතිං මං හොඳටම ඇඬුව. ඔන්න රාත්තිරයෙදි කවුදෝ මිදුලෙ සෝදිසි මාදිසියක ඉන්නව වගේ දැනිල මං ඇහැරුණා. හොඳයිකො, මං මටම කියා ගත්තා. මං දැන් මේ ලෝකෙ තනිවෙච්චි එකී , මාව බේර ගන්න කිසි එකෙක් දැන් නෑ. ඔය නාකිච්චියෙක්ව කම්මුතු කරන්න මහ වෙලාවක් යන්නෙ nෑ. ගඩොල් කැටේකින් ඔළුවට පතබෑව නං ඇති. එතකොට මං කම්මුතුයි. ඒ වුණත් දෙවියන්වහන්සෙ කරුණාවන්තයි. මගෙ කිසි දෙයක් හොරකං කෙරුණෙ නෑ. උන් ටිකක් වෙලා හක්කලං කොරල යන්න ගියා. මගෙ මිදුලෙ පීප්පයක් තිබුණ. ඒක හදල තියෙන්නෙ ඕක් ලී වලින්. තුන්දෙනෙක් නැතිව උස්සනව බොරු. අන්න ඒ පීප්පෙ නං ගේට්ටුව ළඟට යනකං යාර විස්සක් විතර තල්ලු කරගෙන ගිහිල්ල තිබුණ. ඔන්න ඕක තමයි කතන්දරේ. ඒ කවුද උන්ට මොනවද ඕන කලේ, මම මේ කිසි දෙයක් දන්නෙ නෑ.'

ගොම්මන් යාමයේදී නිවෙස මුළුමනින්ම පිරිසිදු කර හමාර වූ පසුව ඔල්ගා ආලින්දයට පිවිසියාය. සිය පියාගෙන් උපන් දින ත්‍යාගයක් සේ ලැබුණ සුදු පැහැ එකෝඩියනයක් එය බහා තිබූ සම් කවරයෙන් මහත් ප්‍රවේශමෙන් පිටතට ගත් ඇය ඒ සිය දෙදණ මත තබා ගත්තී පටිය

උර මතින් දමාගෙන තමන් මේ මෑතකදී ඇසූ ගීතයක තාලය වාදනය කරන්නට පටන් ගත්තාය:

අනේ තවත් එකම වරක්
එනවා නම් ඔබ පරිස්සමින් මා වෙත
අනේ තවත් එකම වරක්....
ඊළඟ වාරෙදි.....
ආයෙම.....
පොලවට ඉහලින් වේගෙන්
ඉගිල්ලිලා යන ඔබ නම්
කවදාවත් දන්නේ නැත
පහල බලා ඉන්න අයගෙ
කාලය කෙතරම් දිගුදැයි
අනේ,
ගුවන් හටයිනේ, නියමුවන්නේ
ප්‍රහාරකයිනේ, සටන්කරුවනේ,
දූන් නම් නුඹලා ගොසිනි බොහෝ දුර
කවදද ආපසු එන්නේ මා වෙත?
කිව නොහැකිය මට නම් කවදාදැයි
මගේ එකම ඉල්ලීම නම් මෙයයි
කොහොමින් හරි ආපසු එනු මැන
කොයි මොහොතක හෝ කවර දිනක හෝ.....

එසේ ගායනා කරන අතරේ ඔල්ගා වරින් වර විමසිලිමත් ලෙස වැට අසල ඇති අඳුරු පඳුරු ගොමුව දෙස නෙත් හෙළුවාය.

ඉන්පසු එක්වරම හුන් තැනින්න නැගිට්ට ඇය පඳුරු ගොමුව දෙස බලා උස් හඬින් කතා කළාය:

'මෙහෙ බලනව! ඇයි ඔයා ඔතන හැංගිල ඉන්නෙ? ඔයාට මොනවද ඕනැ?'

ඒ සමග සුදු පැහැ සාමාන්‍ය ඇඳුමකින් සැරසුනු පුද්ගලයෙක් පඳුරු ගොමුව වෙතින් මතු වූවේය. සිය හිස මදක් ඇල කළ ඔහු විනීත ආකාරයෙන් ඇයට පිළිතුරු දුන්නේය.

'මං හැංගෙනව නෙවෙයි. මේ මාත් ඔය පොඩි පහේ ගායකයෙක්. මට ඔයාට බාදා කරන්න හිත දුන්නෙ නෑ. ඒක හන්දයි මං පඳුර පිටිපස්සට වෙලා කන්දීගෙන හිටියෙ.'

'ඒ වුනාට ඔයාට පාරට වෙලා අහගෙන ඉන්න තිබුණනෙ. ඒත් ඇයි ඔයා වැට උඩට නැග්ගෙ?'

'මම? වැට උඩට නැග්ගා?' පෙනුනේ ඒ මිනිසාට පැහැදිලිවම කේන්ති ගිය බවකි. 'මට සමාවෙන්න ඕනැ, මං බළලෙක් නෙවෙයිනෙ. අර අතන වැටේ පොඩි කපොල්ලක් තියෙනව. මං ඉතිං එතනින් රිංගල ආවා.'

'මට පේනව.' ඔල්ගා උපහාසයෙන් කීවාය. 'කොහොම වුනත් අර අතන ගේට්ටුව තියෙනවනෙ. අන්න ඒකෙන් ඔයා ආපහු පාරට රිංගනවනං හොඳයි.'

මිනිසා තමන්ට කී පරිදි කටයුතු කළේය. වදනකුදු නොදොඩා ගේට්ටුවෙන් පිටට ගිය ඔහු එහි අගුල තද කළේය. ඉන් ඔල්ගා සතුටට පත්වූවාය.

'පොඩ්ඩක් ඉන්න!' පඩිපෙල දිගේ පහලට බසිමින් ඇය කෑ ගැවාය. 'ඔයා කිවුවෙ ඔයත් ගායකයෙක් කියල නේද?'

'නෑ.' ඔහු පිළිතුරු දුන්නේය. 'මං ඉංජිනේරුවෙක්. හැබැයි මං විවේක තියෙන වෙලාවට අපේ වැඩපලේ තියෙන කලා සංගමයෙ සින්දු කියනව.'

'මට තේරෙනව.' ඔල්ගා එසේ කීවා එය මෙලොව තිබෙනා ඉතාම සාමාන්‍ය කාර්යය බව හදිසියේම වැටහී ගියාක් මෙනි. 'ඔයා කැමතිද මගෙත් එක්ක දුම්රිය නැවතුම් පලට එන්න? මගෙ නංගි එනකම් මම බලා ඉන්නෙ. දූන් හොඳටම පරක්කු වෙලා, අන්ධකාරත් වෙලා. ඒත් එයා එන ළකුණක් වත් නෑ. මං කාටවත් බය නං නෑ, ඒ වුණාට මම තාම මේ පලාතෙ පාරවල් දන්නෙ නෑ. පොඩ්ඩක් ඉන්නකො! ඇයි ඔයා ආයෙ ගේට්ටුව අරින්නෙ? ඔයාට මං එනකං එළියට වෙලා ඉන්න පුළුවනිනෙ.'

සිය අතවූ එකෝඩියනය පසෙක තැබූ ඇය සිය උර මතින් සළුවක් දමාගෙන පිනි බිංදු සහ මල් වල සුවඳින් පිරුණු අඳුරු වීදියට පිලිපන්නාය.

ජෙනී සමග කෝපයෙන් පසුවූ හෙයින් ඔල්ගා තමන් සමග දුම්රිය පලට යාමට පැමිණි ගමන් සගයා හා කතා කළේ ඉතා අඩුවෙනි. ඔහු

ඇයට තම නම ජෝර්ජ් ගරායෙව් බවත් තමන් වාහන නිපයුම් කම්හලක සේවය කරන බවත් පැවසීය.

දුම්රිය දෙකක්ම ගියද තවමත් ජෙනී පැමිණියේ නැති. ඉන්පසු තෙවැනි සහ අවසාන දුම්රියද පැමිණ පිටව ගියේය.

'මේ ළමය මට දෙන වදේ මොන තරම්ද කියල ඔයාට හිතාගන්නවත් බෑ!' ඔල්ගා කෑ ගෑවාය. 'මගෙ වයස අවුරුදු හතලිහක් නෑ අඩු ගානෙ තිහක්වත් වුනා නං මේක වෙනස්. වැඩේ කියන්නෙ එයාට දහතුනයි. මට දහඅටයි. එයා මේ මං කියන කිසි දෙයක් කරන්නෙ නැනෙ.'

'ආයෙ වයස අවුරුදු හතලිහක් වෙන්න ඕනැ නෑ.' ජෝර්ජ් තිර හඬින් පැවසුවේය. 'දහඅට වැඩිය හොඳයි. ආයෙ ඔය ගැන දුක්වෙන්න දෙයක් නෑ. ඔයාගෙ නංගි හෙට උදේට එයි.'

දුම්රිය වේදිකාව හිස්ව ගියේය. ජෝර්ජ් සිය සිගරැට් පෙට්ටිය පිටතට ගන්නා විටම වාගේ දරුනු පෙනුමැති කොල්ලෝ දෙදෙනෙක් අහංකාර තාලෙන් ඔහු කරා පැමිණ ගින්දර ටිකක් බලාපොරොත්තුවෙන් එහි සිට ගත්තෝය.

'ඉලන්දාරියා.' ගිනිකූරක් දල්වා එය වැඩිමල් කොලුවාගේ මුහුනට කිට්ටු කර අල්ලන ගමන් ජෝර්ජ් කතා කරන්නට ගති. 'ගින්දර ඉල්ලන්න කලින් හලෝ කියන්න පුරුදු වෙනව. තමුන්ල උද්‍යානෙ වැටට අලුතින් ගහපු ලෑල්ලක් හරිම දක්ෂ තාලෙට ගලවද්දි මට තමුන්ලව මීට කලින් මුණගැහිල තියෙනව. තමුන්ගෙ නම මිහායිල් ක්වාකින්, හරිද?'

කොලුවා වහා පසුපසට වූවේය. ගිනිකූර නිවා දැමූ ජෝර්ජ් නිවෙසට හැරලීම පිණිස ඔල්ගා හට සිය අත දිගු කළේය.

තමන් පවසන දේ නොඇසෙන දුරකට ඔවුන් ගිය පසුව තම අතවූ පෙඟුණ සිගරැට්ටුව කතේ ගසාගත් දෙවන කොල්ලා ඇද පැද මෙසේ ඇසීය.

'කවුද බං ඒ කරච්චල්කාරයා? මිනිහ මේ පලාතෙද?'

'මහ්-හු.' ක්වාකින් පරිහාසාත්මක හඬින් කීවේය. 'ඔය තිමූර් ගරායෙව්ගෙ මාමානෙ. මිනිහ මේ කරපු වැඩේට අපි ඔය තිමූරයව අල්ලගෙන උගෙ හොම්බ පොඩි කරන්න ඕනැ. ඌත් දැන් අපෙන් කැඩිල ගිහිල්ල වෙන කල්ලියක් හදාගෙන. පේන හැටියට උන් අපිට වැඩක් දෙන්නයි යන්නෙ.'

ඒ මොහොතේදී දුම්රිය වේදිකාව කෙලවර පහන් කනුව යට සිටිනා මහළු මහතකු කොල්ලන් දෙනොගේ නෙත ගැටුණේය. ඔහු සිය සැරයටියට වාරුවී පඩි පෙල දිගේ පහල බසිමින් සිටියේය.

ඒ යමින් සිටියේ එහිම වැසියකු වූ වෛද්‍ය කොලොකොව්කොව් ය. ගිනිකුරක් ඉල්ලමින් කොල්ලෝ දෙදෙන ඔහු පසුපස දුවන්නට වූවෝය. මහළු මහතා ඔවුන්ගේ පෙනුමට නැතිනම් හැසිරීමට ප්‍රිය නොකළ බවක් පෙණුනේය. ඒ ඔහු වහා ආපසු හැරී සිය සැරයටිය ඔවුන්ට උරුක් කළ බැවිනි. ඉන්පසු ඔහු නිදිමතින් මෙන් යන්නට ගියේය.

මොස්කව් දුම්රිය ස්ථානයෙහි සිට සිය පියා හට විදුලි පණිවුඩයක් යැවීමට ජෙනී හට වෙලාවක් නොලැබුණෙන් ඇය දුම්රියෙන් බට පසුව පලාතේ ඇති තැපැල් කාර්යාලය සොයා යාමට තීරණය කළාය.

පැරණි උද්‍යානයක් තුළින් සීනු මල් එකතු කරමින් ඉදිරියට ඇදුණ ඇය අවසානයේදී තමන් ගෙවතු මගින් මායිම් වූ හරස් පාරකට පැමිණියේ කෙසේදැයි නොදත්තාය. එහි වූ පාළු පෙනුම මගින් පැහැදිලිවම දක්වන ලද්දේ එය කෙසේවත් ඇය සොයා යමින් සිටිනා වතුයායෙහි අදාල කොටස නොවන බවයි.

ඒ ආසන්නයේම වාගේ මහ හඬින් බැණ වදිමින් අං දෙකින් අල්ලා මුරණ්ඩු එළු නාම්බකු ඇදගෙන යාමට වෙර දරමින් සිටි කුඩා, කඩිසර කෙල්ලක ඇගෙ නෙත ගැටුණේය.

'ඒයි, කරුණාකරල තැපැල් තන්තෝරුව තියෙන්නෙ කොහෙද කියල මට කියනවද?' ජෙනී ඇය ඇමතුවාය.

එහෙත් ඒ සමගින්ම එළුවා දඟලා ඇගෙන් මිදුණේ අං යුවල ගස්සා උද්‍යානය හරහා පිම්මේ දුවන්නට ගත්තෙන් අර කෙල්ලද කෑ ගාමින් ඌ පස්සේ පන්නා ගියාය. ජෙනී හාත්පස නෙත් හෙළුවාය. ගොම්මන් අඳුර පැතිරෙමින් තිබූ අතර අහල පහල කිසිදු කෙනෙකු දක්නට ලැබුණේද නැති. නිනව්වක් නැතිව අසල වූ ගේට්ටුවක් විවෘත කරගත් ඇය අලු පැහැ දෙමහල් නිවෙසක ආලින්දයට ගොඩවැදුණාය.

'කරුණාකරල මට කියනවද...' ජෙනී උස් එහෙත් විනීත හඬින් වසා තිබූ දොර ඉදිරිපිට සිට කතා කළාය. 'මෙතන ඉඳල තැපැල් කන්තෝරුවට යන හැටි.'

එහෙත් ඇයට පිළිතුරක් ලැබුණේ නැති. මදක් වේලා එහි සිටගත්වනම කල්පනාවේ පසුවූ ඇය අනතුරුව දොර විවෘත කර සාලයට ඇතුළුව කාමරයක් කරා ගියාය. නිවසෙහි කිසිවකුත් ඉන්නා බවක් පෙනුනේ නැති. තරමක වරදකාරී හැඟීමකින් මැඩී ගිය ඇය ආපසු පිටතට යාමට හැරුණද මේසය යට සිට එක්වරම කිසිදු හඬක් නොනගා මතුවූ දුඹුරු පැහැ විසල් බල්ලකු දැක එහෙමම නතර වූවාය. මද වේලාවක් ව්‍යාකුලත්වයට පත්ව සිටි ගැහැණු ළමයා දෙස විපරම්කාරීව බලා සිටි බල්ලා අනතුරුව පහත් ගෙරවුමක් සමගින් එළිපත්ත හරහා පැන්නේය.

'මෝඩයෙක් වෙන්නෙපා!' බියෙන් අතැඟිලි විහිදමින් ඇය කෑ ගැවාය. 'මං හොරෙක් නෙවෙයි. මං කිසි දෙයක් ගත්තෙත් නෑ. මේ බලාපං, මේ තියෙන්නෙ අපි ඉන්න ගෙදර යතුරු. මෙ තියෙන්නෙ තාත්තට යවන්න හදන විදුලි පණිවුඩේ. මගෙ තාත්තා නිලධාරියෙක්. තේරුණාද උඹට?'

බල්ලා සෙලවුනේවත් නැති. ඒ අතරේ විවෘතව පැවති ජනේලය කරා මහත් ප්‍රවේශමෙන් ගාටන ගමන් ජෙනී දිගටම කතා කළාය.

'පේනවද? උඹ ඔය ඉන්න තැනම ඉන්නව හොඳයි. උඹ හරිම හොඳ බලු රාලෙක්නේ. හරිම දක්ෂ හොඳම එකෙක්.'

එහෙත් ඇය ජනෙල් පඩියට අත තැබූ මොහොතේ ඒ හොඳ බල්ලා මොන තරම් දරුනු ගෙරවුමක්ද සමගින් ඉදිරියට පැන්නේද කිවහොත් ජෙනී වහාම අසල වූ සෝෆාවක් මතට පැන දෙකකුල් නවා ඒ මත ගුලි ගැසී හිඳ ගත්තාය.

'උඹ හොඳ එකානෙ.' අඬන්නට ඔන්න මෙන්න කියා සිටි ඇය කීවාය. 'ඕනෑ නං උඹ ගිහිල්ලා ඔය හොරුන්වයි ඔත්තුකාරයන්වයි අල්ලපංකො. ඒ වුණාට මේ මං-මං අහිංසක එක්කෙනෙක්නෙ. ඇත්තමයි!' බල්ලා වෙත දිව දිගු කළ ඇය මෙසේද කීවාය. 'මොට්ටයා!'

ජෙනී අතවූ යතුර සහ විදුලි පණිවුඩය සෝෆාව අසල වූ මේස දාරය මත තැබුවාය. දැන් ඉතින් තම නිවෙසෙහි හිමිකරුවන් එනතුරු බලා සිටිනු හැර කරන්නට වෙනත් දෙයක් නැති.

එසේ හෝරාවක් ගෙවී ගියේය.අනතුරුව තවත් හෝරාවක්...හොඳටම අඳුරු වැටී ගියේය. විවෘතව පැවති ජනේලය තුළින් දුරින් ඇදුණ දුම්රියක නළා හඬ, බල්ලන්ගේ බිරුම් හඬ සහ වොලිබෝලයක් පොළවෙහි වදිනා හඬ ඇසන්නට විය. කොහේදෝ තැනෙක යමෙක් ගිටාරයක්

වාදනය කළේය. මෙහි පමණක්, එනම් මේ නිවසෙහි පමණක් පාලුව සහ නිහැඬියාව රජයමින් පැවතියේය.

සෝෆාවෙහි තද ඇන්දට සිය හිස වාරු කරගත් ජෙනී නිහඬවම වැලපෙන්නට ගත්තාය. අවසානයේදී ඇය තද නින්දට වැටුණාය.

ඇය නැවත අවදිවන විට උදෑසන එළඹ තිබිණි.

වැසි දියෙන් දෝවනය කරන ලද සාරවත් තුරු ලතාවන් ජනේලයෙන් පිටත සර සර නදින් සැලෙමින් පැවතියේය. ආසන්නයේ කොහේදෝ තැනකින් ජල පොම්පයක හැඬලයකින් කිරි කිරි නදක් නික්මිණි. ඇයට කියතක රළු හඬද අසන්නට හැකි විණි. එහෙත් ඒ නිවෙස තුළ නම් පැවතියේ පෙර පැවති නිහැඬියාවමය.

අවදිව බලනා ජෙනී තමන්ගේ හිස සුමුදු කුෂන් කොට්ටයක් මත හොවා දෙපයද පොරෝණාවකින් වසා තිබෙන බව දුටුවාය. බල්ලාද කොහේදෝ ගොසිනි.

එහි අරුත කවුරු හරි අයෙකු රාත්‍රිය මෙහි ගත කර ඇති බවයි.

වහා නැගිටගත් ජෙනී සිය හිසකේ පස්සට ගස්සා හැරියාය. සිය පොඩි වුණ ගවුමද හරිගස්සාගත් ඇය සිය නිවසේ යතුර සහ යවන්නට නොහැකි වුණ විදුලි පණිවුඩයද ගෙන නිවසින් පිටවන්නට සැරසෙන විටම මේසය මත තබන ලද කරදාසි කැබැල්ලක් දුටුවාය. නිල් පැහැ පැන්සලකින් ඒ කරදාසි කැබැල්ලෙහි ලොකු අකුරින් මෙසේ ගියා තිබිණි:

'ඔයා ගෙදරින් යනකොට හොඳට දොර වහල යන්න මතක තියා ගන්න.' ඒ සටහනට 'තිමූර්' යනුවෙන් අත්සන් තබා තිබිණි.

තිමූර්? කවුද මේ තිමූර්? ඇය ඔහු සොයාගෙන ඔහුට ස්තුති කළ යුතුය.

ඇය.යාබද කාමරයට හිස පොවා බැලුවාය. එහි ලිවීම සඳහා අවශ්‍ය දෑ, අළු බඳුනක් සහ කුඩා කැටපතක් තබන ලද මේසයක් තිබෙනු ඇගේ නෙත ගැටිණි. කාමරයෙහි දකුණු පසට වන්නට පරණ, අබලන් රිවොල්වරයක් සහ රිය පදවන විට පළඳින සම් අත් මේස් යුවලක් තිබිණි. මේසයෙන් පිටට දිගුව පැවතියේ හොඳටම ගෙවී ගිය සහ

සීරුෑණ කොපුවක බහා ලූ තුර්කි කඩුවකි. සිය අතවූ විදුලි පණිවුඩය සහ යතුර එම මේසය මත තැබූ ජෙනී කඩුව අල්ලා බලා එය කොපුවෙන් පිටට ඇද එහි තලය සිය හිස මතින් සිටින සේ තබාගෙන කැටපතින් සිය පිලිබිඹුව නැරඹුවාය.

ඇය වෙතින් දුන් පලවූයේ දරුණු පෙනුමකි. මේ ආකාරයට ඇගේ ඡායාරූපයක් ගෙන එය මුළු පාසලටම පෙන්වන්නට හැකි නම් කෙතරම් දෙයක්ද! එවිට තම පියා වරක් තමාවද යුද පෙරමුණට කැටුව ගිය බව ඇයට කිව හැකිය. සිය වම් අතෙහි රිවෝල්වරයද තබා ගත්තේ නම් තත්වය වඩාත් හොඳට පෙනෙනු ඇත. මෙන්න මේ ආකාරයට. හැකි තරම් තදින් දෙබැම රැළි නංවා ගත් ඇය දෙතොල් තද කර පියා ගත්තී කැටපතට එල්ල කර රිවොල්වරයෙහි කොකා ඇද්දාය.

ඒ සමග කාමරය සවන් බිහිරි කරනවසුළු වෙඩි හඬින් පිරී ගියේය. දුම් වළාවකින් ජනෙල් කවුළුව වැසී ගියේය. කැටපත මේසය මතවූ අලු බඳුන උඩට වැටිණි. මේසය මත වූ සිය යතුර සහ විදුලි පණිවුඩය එහෙමම අමතකව ගිය ජෙනී සැණෙකින් කාමරයෙන් පිටට පැන මේ එපාකරවන තාලේ භයංකාර නිවෙසින් පිටව දෙපයට පින් දෙමින් දුවන්නට වූවාය.

ඒ පැත්ත බලා මේ පැත්ත බලන්නට පෙර තමන් දොළ ඉවුරකට පැමිණ සිටින බව ඇය දුටුවාය. දුන් ඇය අත ඔවුන්ගේ නිවසෙහි යතුර හෝ විදුලි පණිවුඩය යන දෙකින් එකක්වත් නැති. එසේම විදුලි පණිවුඩය යැවුවේ යයි කියන්නට රිසිට් පතක්ද නැති. ඒ නිසාම දුන් ඇයට ඔල්ගා හට සියල්ලම පැවසීමට සිදුවනු ඇතිඃ එනම් බල්ලා ගැන, පාලු නිවෙසක නිදාගත් හැටි, අර තුර්කි කඩුව ගැන, අන්තිමටම වෙඩි පහර ගැනත්. මෙ මොන අවාසනාවක්ද! අඩු ගණනේ තාත්තාවත් මෙහි සිටියා නම් ඔහු සියල්ල මනාව අවබෝධ කරගනු ඇත්තේය. නමුත් ඔල්ගා මේ කිසිවක් තේරුම් ගත්තේ නැති. ඔල්ගා කේන්ති ගනු ඇති. ඊටත් වඩා ඇය හඬන්නට පටන් ගනු ඇති. ඒ තම එපා කරපුම දෙයකි. ජෙනීටත් හඬන්නට නම් පුළුවන. එහෙත් ඒ හඬන්නට සිතුණ අවස්ථාවලය. එහෙත් ඔල්ගා කඳුලු පිරි දැසින් පසුවනු දුටු හැම අවස්ථාවකම ජෙනීට දැනුනේ තමන්ට දුරකථන කණුවක නැතිනම් ගසක හෝ දුම් කවුළුවක මුදුනටම නගින්නට ඇත්නම් කියාය.

තම සිත ප්‍රබෝධමත් කර ගැනීමට දියෙහි පිහිනූ ජෙනී අනතුරුව හෙමිහිට ඔවුන්ගේ නවාතැන සොයා ගමන් ඇරඹුවාය.

ආලින්දයෙහි පියගැට නැගගෙන ජෙනී නිවසට ඇතුළු වන විට ඔල්ගා සිටියා මුලුතැන්ගෙට වැදී ප්‍රිමස් උදුන දල්වන්නට උත්සාහ දරමිනි. පිය ගැටෙන හඬ ඇසුන විගසින් හැරුණ ඇය ගොළු එහෙත් කෝපය පලවන දැඩි බැල්මක් සිය සොහොයුරිය වෙත හෙළුවාය.

'හලෝ ඔල්ගා!' උඩම පඩියෙහි නතරව බලෙන් මුවගට මදහසක් නංවා ගනිමින් ජෙනී සිය සොහොයුරිය ඇමතුවාය. 'ඔල්ගා, ඔන්න ඔයා මට බණින්නෙ හෙම නෑ නේද?'

'නැතුව, මං බණිනවමයි.' ජෙනී වෙතින් දෑස් ඉවතට නොගෙන ම ඔල්ගා කෝපයෙන් බැණවැදුණාය.

'හරි, හරි, එහෙනං බනින එකයි ඇත්තෙ.' ජෙනී යටහත් බවින් යුතුව පැවසුවාය. 'ඒ වුණාට මං මොන තරං අමුතු අත්දැකීමක්ද අත්වින්දෙ කියල ඔයා දන්නවනං! අනේ ඔල්ගා ඔය විදිහට ඇහි බැම අඹරන්න එපා. කිසිම භයානක දෙයක් වුණේ නෑ. මගෙ අතින් ගෙදර යතුර නැතිවුණා, ඒ විතරක් නෙවෙයි මට තාත්තට විදුලි පණිවුඩෙත් යවන්න බැරි වුණා.'

දෑස් පියා ගත් ජෙනී එක හුස්මට සිය කතාව කියාගෙන යන්නට සූදානම් වූවාය.

එහෙත් හරියටම ඒ මොහොතේදී මහ හඬක් නගාගෙන ඉදිරිපස ගේට්ටුව ඇරී මුළු ඇඟ පුරාම කටු ගෙඩි තවරාගත් ලොම් පිරි එළුවෙක් තම අං යුවල පහතට නවාගෙන අනිත්ට සැරසී ඉදිරියට පැනගෙන ආවේය. ඌ පසුපසින්ම වාගේ පාවහන් රහිත දෙපතුලින් යුතුව දැරියක් කෑගාගෙන දිව ආවාය. ඒ ජෙනී හට පෙරදින හමුවූ දැරියමය.

මහත් ප්‍රවේශමෙන් සිදු කළ යුතුවූ තම කරුණු පැහැදිලි කිරීම කල් දමන්නට ලැබුණ අවස්ථාවෙන් වහා ප්‍රයෝජන ගත් ජෙනී එළුවා පලවා හැරීමට ගෙවත්තට දිව ගියාය.

හති දමමින් සිටි දැරිය එළුවාගේ අං තට්ටටුවෙන් අල්ලා ගන්නා විටම වාගේ ජෙනී ඇය පසු කළාය.

'ඔයාගෙ මොනව හරි නැති වුණාද?' අල්ලා ගත් එළුවාට අතින් සහ පයින් ගසන්නට ගත් දූරිය සිය කටයුත්ත නතර නොකරමින් දත්මිටිකාගත්වනම එසේ ඇසුවාය.

'නෑ.' වියවුලට පත් ජෙනී පිලිතුරු දුන්නාය.

'එහෙනං මේක කාගෙද? ඔයාගෙ නෙවෙයිද?' දූරිය ඔවුන්ගේ මොස්කව් නිවසෙහි යතුර ඉහලට ඔසවා පෙන්නුවාය.

'ඔව්, ඒක නං මගෙ තමයි.' හොරැහින් ආලින්දය දෙස බලමින් ජෙනී කෙඳිරුවාය.

'එහෙනං මෙන්න අරගන්න එකයි. මේ සටහනයි රිසිට් එකයි එක්කම. විදුලි පණිවුඩේ දූනටමත් යවලයි තියෙන්නෙ.' තවමත් දත්මිටි කාගත්වනම සිටි දූරිය හනික එසේ කියාගෙන ගියාය.

ඉන්පසුව කුඩා කරදාසි කවරයක් ජෙනී අතට දුන් ඇය මිට මොළවාගත් අතින් එළුවාට පහර දෙන්නට වූවාය.

ඒ අතරේ එළුවා ගේට්ටුව දෙසට යන්නට වූයෙන් දූරියද කෙලින්ම කටු සහ බූව සහිත වැල් ගාලක් මැදින් ඌ අනුව ඇදී ගියාය. එසේ ඔවුහු වේගයෙන් ගේට්ටුවෙන් පිටතට ඇදී අතුරුදන්ව ගියෝය.

පහර ලද්දිය එළුවා නොව තමන් වූ විටක මෙන් දෙවුර හකුළුවාගෙන ජෙනී කවරය ඇර බැලුවාය.

'මේ තියෙන්නෙ යතුර. තව විදුලි පණිවුඩේ යවපු රිසිට් එකත් තියෙනව. ඒ කියන්නෙ කවුරු හරි ඒක යවල. ඒත් ඒ කවුද? ආහ්, මෙක වෙන්නැති අර කියපු සටහන. ඒත් මේ දේවල්වල තේරුම මොකක්ද?'

නිල් පැහැ පැන්සලකින් ලොකු අත් අකුරින් ලියන ලද ඒ සටහන මෙපරිදියඃ

'ගෙදරදි කාටවත්ම බය වෙන්න ඕන නෑ. හැමදේම හරි, මං කාටවත් කියන්නෙ නෑ.' එය අත්සන් කර තිබුණේ තිමූර් යනුවෙනි.

මායා බන්ධනයකට හසුවූ විටෙක මෙන් ජෙනී නිහඬවම සටහන සිය සාක්කුවට දා ගත්තාය. අනතුරුව දෙවුර නගාගත් ඇය නැවත ඔල්ගා කරා ගියාය.

ඔල්ගා තවමත් කඳුළු පිරි දෑසින් යුතුව නොදල්වන ලද ප්‍රිමස් උදුන අසල සිටගත්වනම පසුවූවාය.

'ඔල්යා!' ජෙනී පශ්චාත්තාපී බවින් යුතුව කෑ ගැවාය. 'මං විහිළුවක් අනේ කළේ. මාත් එක්ක තරහ වෙන්න එපා. මම මුළු ගේමයි ජනෙලුයි සුද්ද කළා. මං ඇත්තටම මහන්සි වෙලා වැඩ කළා. මම බිම අතුල්ලල හේදුවා. ඩස්ටර් ඔක්කොමත් හේදුවා. මෙන්න යතුර, තව තාත්තට යවපු විදුලි පණිවුඩේට ලැබුණ රිසිට් එකත් ඔතන තියෙනව. දැන් කෝ මං ඔයාට හාද්දක් දෙන්න. මං ඔයාට කොච්චරක් ආදරේද කියල ඔයා දන්නවද! ඒක ඔප්පු කරන්න මං අර වහලෙන් කටු ගාලට පැනල පෙන්නන්නද?'

ඔල්ගා පිලිතුරු දෙන තුරු බලා නොසිටි ජෙනී වහා පැන ඇය බදා ගත්තාය.

'ඔව්, ඔව්, ඒ වුණාට මං මොන තරං දුකෙන්ද හිටියෙ.' ඔල්ගා අපේක්ෂා භංගත්වය පල කරන හඬින් කීවාය. 'ඔයා හැම වෙලාවෙම මහ තේරුමක් නැති විහිළුමයි කරන්නෙ. අනික තාත්ත මට කිවුවෙ-ඕක නවත්තන්න ජෙනී! ජෙනී දෙවියන්ගෙ නාමෙන් නවත්තන්න. මගෙ අත පුරාම බූමිතෙල් ගෑවිලා. මේ බලන්න ජෙනී, දැන් ඔයා කිරි ටිකක් සාස්පානට දාලා ඒක රත්වෙන්න ලිපෙන් තියන්න.'

'මට-මට විහිළු නොකර ඉන්නම බැනෙ.' ඔල්ගා සෝදන බේසම ඇති ස්ථානයට පිය නගද්දී ජෙනී මිමිණුවාය.

ඇය ප්‍රිමස් උදුන මත කිරි මුට්ටිය තැබුවාය. ඉන්පසුව සිය සාක්කුවෙහි ඇති සටහන අල්ලා බලා කතා කරන්නට වූවාය:

'ඔල්ගා, දෙවියන් කියල කෙනෙක් ඉන්නවද?'

'නෑ.' සිය මුහුණ කරාමය වෙත පහත් කරමින් ඔල්ගා පිලිතුරු දුන්නාය.

'හොඳයි එහෙනං කවුද උඩ ඉන්නෙ?'

'මේ මට පාඩුවෙ ඉන්න දෙනවද.' ඔල්ගා නොඉවසිල්ලෙන් කෑගැවාය. 'එහෙ ඇති කෙනෙක් නෑ.'

මොහොතක් තිහඬව සිටි ජෙනී නැවත පටන් ගත්තාය:

'ඔල්ගා, කවුද තිමූර් කියන්නෙ?'

'ඒ දෙවිකෙනෙක් නෙවෙයි. ඒ රජෙක්.' සිය මුහුණ සහ දෑත් සබන් යොදා සෝදන අතරේ ඔල්ගා නොරිස්සුමින් කීවාය. 'මධ්‍යකාලීන යුගයෙ හිටපු නපුරු අබ්බගාත රජෙක්.

'හොඳයි මේ කියන තිමූර් රජෙකුත් නෙවෙයි නං, නපුරුත් නැත්නං ඒ වගේම එයා මධ්‍යකාලීන යුගයෙ කෙනෙකුත් නෙවෙයි නං එතකොට එයා කවුද?'

'එහෙමනං ඒ කවුද කියන්න මං දන්නෙ නෑ. අනේ මට පාඩුවෙ ඉන්න දෙනවද. මොන එහෙකටද මේ තිමූරෙක් ගැන හාර හාර අහන්නෙ?'

'වෙන මොකුත් හන්ද නෙවෙයි එයා මං බොහොම ආදරේ කරන කෙනෙක් කියල හැඟීමක් මට දැනෙන හින්ද.'

'කවුද ඒ?' සබන් පෙණ තැවරුණ මුහුණින් එය විශ්වාස කිරීමට නොහැකි බව ඇඟවෙන බැල්මක් හෙලමින් ඔල්ගා ඇසුවාය. 'ඔයා මේ මොන විකාරද කියවන්නෙ? ඇයි ඔයා හැම තිස්සෙම ඔහොම එක එක කතා හදන්නෙ? ඇයි අනේ මට පාඩුවෙ ඉන්න දෙන්න බැරි! ඉන්නකො තාත්ත ගෙදර එනකං. එයා ඔයාගෙ ඔය ආදරේ ගැන බලාගනියි.'

'එයා බලයිද, ඒ කොහොමද?' ජෙනී හැඟුම්බරව කෑගැවාය. 'ඉතිං එයා ආවත් දිග කාලයක් ඉන්න නෙවෙයිනෙ. අනික එයා තනියෙම ඉන්න, කිසිම ආරක්ෂාවක් නැති කෙනකුට නරකට සලකන එකක් නෑ.'

'කවුද මේ තනියෙම, ආරක්ෂාවක් නැතුව ඉන්නෙ?' ඔල්ගා විමතියෙන් ඇසුවාය. 'ඔයාද? අනේ ජෙනී ඔයාට මොකද කරන්නෙ කියල මට නං තේරෙන්නෙ නෑ. ඔයා යන්නෙ කාගෙ ආරටද කියල මට තේරෙන්නෙ නෑ.'

ජෙනී හිස පහත් කරගත්තාය. කේතලයෙහි ඇති තිකල් මතුපිට පිලිබිඹුව ඇති සිය පමුහුණ දෙස බලමින් ඇය මහත් අභිමානයෙන් සහ චකිතයකින් තොරව මෙසේ පිළිතුරු දුන්නාය:

'තාත්ගෙ ආරෙට. තාත්ත විධිහටම තමයි. එයා වගේම, එයා විධිහටම තමයි. මේ ලෝකේ වෙන කිසිම කෙනෙක් විධිහට නෙවෙයි.'

වියපත් මහතා එනම් වෛද්‍ය කොලොකොල්චිකොව් බිත්ති ඔරලෝසුවක් අළුත්වැඩියා කරමින් සිය ගෙවත්තෙහි හිඳ සිටියේය.

ඔහු ඉදිරිපිට එල්ලාගත් මුහුණින් තික් එනම් ඔහුගේ මුනුපුරා සිටගෙන බලා සිටියේය.

නික් ගෙන් අපේක්ෂා කරන ලද්දේ සිය සීයා හට අත් උදව් දීමයි. සීයා ඉල්ලූ විගස දීමට සූදානමින් සැබැවින්ම පුරා පැයකටත් වැඩි කාලයක් ඔහු ඉස්කුරුප්පු නියනද අතැතිව එහි සිටගෙන බලා සිටියේය.

එහෙත් නිසි ලෙස සවි කිරීමට තැත් දරන ලද වානේ දුන්න සවි කිරීමට අපහසු වූ නමුදු සීයා නම් ඉතා ඉවසිලිවන්තව වැඩ කළේය. එහෙයින් නික් ගේ බලා සිටීමට අවසානයක් නැත්තාක් මෙන් පෙණුනි. මේ නම් මහම අමන වැඩකි. විශේෂයෙන්ම සීමා සිමාකොව්ගේ කෙස් කරළි ගැසුණ හිස දනටමත් කිහිප වතාවක් වැටට උඩින් දිස්වුණ හෙයිනි. සිමා යනු සැමවිටම සිදුවෙමින් පවතින සියල්ල ගැන දන සිටි හාදයෙකි. අනෙක මේ සිමා සිය දිව, හිස සහ දෑත් දිගු කරමින් කෙතරම් අමුතු, අද්භූත සංඥාවන් නික් වෙත නිකුත් කරමින් සිටියේද කිවහොත් බිම දිගාවී සිටි බල්ලකුගේ මුවට යමක් දැමීමට තැත් දරමින් දෙහි ගසක් යට හිඳ සිටි ඔහුගේ පස් හැවිරිදි නංගී ටාටා එක් වරම මහ හඬින් කෑගසා සීයාගේ කලිසමින් අල්ලා ඇද්දාය. ඒ සැණින් සිමා සිමාකොව්ගෙ හිස අතුරුදන් විණි.

කෙසේ හෝ අන්තිමේදී දුන්න නිසි තැන සවි කරන ලදී. 'මිනිහා හැම වෙලාවෙම මහන්සි වෙන්න ඕනැ.' පැසුණු හිසින් යුත් කොලොකොල්චිකොව් මහතා දහදිය නැගුණු සිය නළල ඔසවමින් නික් ඇමතීය. 'හරියට මෙතන මං එඬරු තෙල් වඩියක් දෙන්න හදනව වගේ මං දිහා බලා ඉන්න එකේ තේරුමක් නෑ. මට ඔය ඉස්කුරුප්පු නියන දීල මේ අඬුව අරගන්නව. ශ්‍රමය කියන්නෙ උතුම් දෙයක්. මයෙ කොල්ලෝ, තමුසෙට නං නැත්තෙම චරිතයේ උදාර බව කියන් එකමයි. උදාහරණෙට මේ ඊයෙ තමුසෙට අයිස්ක්‍රීම් හතරක් ලැබිලත් තමුසෙ එකක්වත් තමුන්ගෙ පුංචි නංගි එකක බෙදාගත්තෙ නෑ.'

'ලැජ්ජා නැති කෙල්ල එයා බොරුමයි කියන්නෙ.' නික් කෝපයෙන් බෙරිහන් දුන්නේය. ඔහු ඒ සමගම ටාටා දෙස දැවෙන දෑසින් බැල්මක් හෙළීය. 'මං තුන්පාරක්ම එයාට කටවල් දෙකක් කන්න දුන්නා. එහෙම කරලත් එයා මට විරුද්ධව කේලම් කියනව. ඒ මදිවට යන එන ගමන් අම්මගෙ මේසෙ උඩ තිබ්බ කොපෙක් හතරකුත් ගත්තා.'

'ඇයි තමුසෙ ඊයෙ රෑ කඹයක් ගැට ගහල ජනේලෙන් එලියට පැන්නෙ.' සිය හිස නොහරවාම ටාටා ශාන්තදාන්ත ලෙස කීවාය. 'තව තමුසෙ කොට්ටෙ යට ටෝච් එකකුත් තියාගන ඉන්නෙ. ඊයෙ නරක

කොල්ලෙක් අපේ නිදන කාමරේ ජනේලෙට ගල් ගැහුවා. ඒකා දිගටම එහෙම කළා. ගල් ගගහා ඌරුවන් බෑවා. ඌරුවන් බබා ගල් ගැහුවා.'

කිසිම ලැජ්ජාවක් නැති ටාටාගේ පැත්තෙන් සිදුවූ මේ විශ්වාසය කඩ කිරීම නිසා නික් තක්කුමුක්කුව ගියේය. ඔහු හිස සිට දෙපතුල දක්වාම වෙවුලන්නට පටන් ගති. එහෙත් වාසනාවට මෙන් ඔවුන්ගේ සීයාට සිය කාර්යය නිසා මේ ද්වේශ සහගත අපවාදයට අවධානය යොමන්නට නොහැකි වීය. නැතිනම් ඔහුට එය නොඇසුණාද විය හැකිය. කෙසේ වුවත් වාසනාවට මෙන් එවේලේ කිරිකාරිය සිය කිරි බඳුන්ද රැගෙන ගෙවත්තට ඇතුළු වූවාය. කිරි වත්කර දෙන අතරේ ඇය සිය මැසිවිල්ල පටන් ගත්තාය.

'අනේ රත්තරං දොස්තර මහත්තයෝ ඔහෙට හිතා ගන්නවත් පුළුවන්ද කවුදෝ හොරු රංචුවක් ඊයෙ රාත්තිරියෙ මගෙ වත්තට පැනල අර ඕක් ලීයෙන් කරපු පීප්පෙ හොරකං කරන්න හැදුවනෙ. මේ අද උදේ කවුද හාදයො දෙන්නෙක් මගෙ වහලෙ උඩ ඉන්නව දැක්ක කියල අහල පහල අය කියනව. උන් හිටියෙ දුම් කවුළුව උඩලු. කිසි ගානක් නැතුව කකුල් පද්ද පද්දා හිටියලු. තක්කඩි.'

'දුම් කවුළුව උඩ කිවුවා? මොන එහෙකටද උන් එහෙම දෙයක් කරන්නෙ?' වියවුලට පත් මහත්මයා ඇසීය.

එහෙත් හරියටම ඒ වෙලාවේ කන් බිහිරි කරවන සලං බලං සද්දයක් කුකුළු කොටුව දෙසින් මතුව ආවේය. මහළු මහත්මයා අතවූ ඉස්කුරුප්පු නියන ගැස්සී ගියේ අර දුන්නද ඉන් ලිහිල්ව උඩ විසිවී මහත් හඬක් නගාගෙන පියස්සේ හැපුනේය. සැමදෙනාම වෙනකක් තබා ටාටා සහ කම්මැලි බලු රාළ පවා එක්වරම ඒ කුමක්දැයි හැරී බැලුවෝය. එකදු වදනක් හෝ නොදොඩා නික් හාවකු මෙන් කැරට් පාත්තිය මතින් පැන වැට පිටුපසින් අන්තර්ධාන වීය.

කුකුළු කොටුවේ පරිද්දෙන්ම දඩ බඩ හඬක් නික්මෙමින් පැවති ගව ගාල අසලදී ඔහු නතර වූවේය. ඒ නාදය හරියට කවුරුන් හෝ යකඩ පීල්ලකට මිටියකින් පහර දෙන විටක මෙනි. මෙහිදී සීමා සිමාකොව් හමුවූයෙන් නික් ඔහුගෙන් කැළඹීම මුසු හඬින් ප්‍රශ්ණ කළේය.

'මං අහන්නෙ මොකද වෙලා තියෙන්නෙ? ඒ එලාම් එකක්ද?'

'නෑ! මං කියන්නෙ නෑ කියලයි. ඒක ඇවිල්ල පොදු රැස්වීමක සංඥාව.'

වැට පිරික්සා බැලූ ඔවුහු එහි වූ කපොල්ලක් තුළින් රිංගා ගියෝය එහිදී ඔවුන්ට ශක්තිමත් සහ පුළුල් දෙවුරින් යුත් ගෙයිකා නම් හාදයා හමුවිණි. ඒ සමගම වසීලි ලැදිගින්ද ප්‍රාදුර්භූත වූයේ ඔහුට පසුව තවත් කිහිප දෙනෙක්ම එහි ආවෝය. හඬ නොනැගෙන සේ ඉතා යුහුසුළුව ඔවුහු තමන්ම පමණක් දැන සිටි හොර පාරවලින් තම ගමනාන්තය කරා දිව ගියෝ ඒ යන අතර අදහස් හුවමාරු කරගන්නට වූවෝය.

'ඒ එලාම් එකද?'

'නෑ. ඒක අංක එක දරණ සාමාන්‍ය රැස්වීම.'

'මොකද රැස්වීමක්? මේක තුනකට පාරක් නවතින සද්දයක් නෙවෙයිනෙ. මේක එකදිගට දහපාරක් වදින පිස්සුවක්නෙ.'

'හරි, අපිට බලාගත්තැකිනෙ.'

'සහතිකයි, අපි බලමු.'

'වරෙල්ලා, පුළුවන් තරං හයියෙන් යමල්ලා.'

මේ සියල්ල සිදුවෙද්දී උස් සිරුරැති, කළු පැහැ කොන්ඩයකට උරුම කී වයස අවුරුදු දහතුනක පමණ කොල්ලෙක් ජෙනී පෙරදා රාත්‍රිය ගත කළ නිවහනෙහි විසිත්ත කාමරය තුළ හිඳ සිටියේය. ඔහු ඇඳ සිටියේ කළු කලිසමක් සහ අත් නැති තද නිල් පාට එසේම එහි ඉදිරිපස රතු පැහැ තරුවක් එම්බ්‍රොයිඩර් කරන ලද කමිසයකි.

අවුල්වූ, අළු පැහැ කොණ්ඩයක් සහිත මහළු මිනිසෙක් එහි පැමිණියේය. ඔහුගේ රළු සේද කමිසය ගෙදර මසන ලද්දකි. ඔහුගේ එල්ලා වැටෙන කලිසම අණ්ඩ වලින් පිරී ගොසිනි. ඔහුගේ වම් කකුලේ දණහිසට රළුපරළු ලෙස දැවයෙන් කරන ලද බොරු කකුලක් බැඳ තිබුණි. එක් අතකින් කරදාසි කැබැල්ලක් ගෙන සිටි ඔහු අනෙක් අතින් පරණ හමගිය රිවොල්වරයක් ගෙන සිටියේය.

'එලියට බැහැල යනකොට දොර හයියෙන් වහගෙන යන්න.' ඔහු සමච්චලයට කියවාගෙන ගියේය. 'හොඳයි, ඊයෙ රාත්‍රියෙ අපේ සෝපාවෙ නිදාගත්තෙ කවුද කියල තමුන්නැහෙ මට කියයිනෙ.'

'මං දන්න ගෑණු ළමයෙක්.' කොලුවා අකමැත්තෙන් පිළිතුරු දුන්නේය. 'මං ඒ වෙලාවෙ ගෙදර හිටියෙ නෑ. බල්ලා එයාට යන්න දීල නෑ.'

'ඒක නං පචයක්.' මහලු මිනිසා පරීක්ෂාකාරී ස්වරයකින් කීවේය. 'තමුන් ඒ ළමයගෙ නම දැනගෙන හිටිය නං අර තුණ්ඩුවෙ එයාගෙ නම ලියනවනෙ.'

'මං ඒක ලියද්දි එයාගෙ නම දැනගෙන හිටියෙ නෑ. හැබැයි දැන් මම දන්නව.'

'ඔයා ඒක දැනගෙන හිටියෙ නෑ? එතකොට තමුන් උදේ පාන්දර ඒ ළමයව තට්ට තනියෙම දාලා යන්න ගියා? මගෙ රත්තරං කොල්ලෝ, තමුසෙ නං එක පිච්චියක් තරම වටින්නෙ නෑ. තමුසෙව යවන්න තියෙන්නෙ පිස්සන් කොටුවට තමයි. එතකොට අර කමකට නැති කෙල්ල කණ්නාඩියත් බිඳල අළු බඳුනත් ඉවර කළා. හොඳ වෙලාවට රිවෝල්වරේට පුස් උණ්ඩ දාලා තිබ්බෙ. නියම මූනිස්සං දාල තිබ්බ නං මොකද වෙන්නෙ?'

'ඒ වුණාට මාමෙ- ඔයා නියම මූනිස්සං තියාගන්නෙ නෑ. මොකද ඔයාගෙ හතුරන්ගෙ කඩුයි රයිෆලුයි- එව්වා නිකං ලී වලින් හදපුවනෙ.'

එවිට මහල්ලාගේ මුහුණ හරහා මදහසක ඡායාවක් ඇඳී ගියේය. එහෙත් සිය එල්ලා වැටෙන කොණ්ඩය පසුපසට ගස්සාලූ ඔහු තද ස්වරයෙන් කතා කරන්නට වීයඃ

'බලාගෙන වැඩ කලොත් හොඳයි! මං හැමදේ ගැනම ඇහැ ගහගෙන ඉන්නෙ, තමුසෙ මොකක්ම හරි ජංජාලයකට අරාදින විත්තිය මට පේනව. හැබැයි රජෝ කල්පනාවෙන් වැඩ නොකළොත් හෙම මං තමුසෙව ආපහු අම්ම ගාවටම අරිනව.'

මහල්ලා කොර ගසමින් උඩු මහලට ඇදුණේය. ඔහු නොපෙනී ගිය සැණින් උඩ පැන්න කොලුවා ඒ මොහොතේ එතනට ගාටමින් ආ බල්ලාගේ ඉදිරි ගාත් දෙක අල්ලා ගෙන උගේ හොම්බ සිප ගත්තේය.

'ඔන්න රීටා, මෙදා පාරනං අපිට ගැලවෙන්න බැරි වුණා. ඒ වුනත් ප්‍රශ්ණයක් නෑ. එයා අද ඉන්නෙ සන්තෝසෙන්. තව මිනිත්තුවෙන් එයා සිංදු කියන්න පටන් ගනියි.'

සැබැවින්ම සිදුවූයේද එයමය. උඩු මහලේ හුන් මහල්ලා උගුර පෑදීය, ඉන්පසුව තාලයක් ඇල්ලූ ඔහු පහත් හඬින් ගීතයක් ගායනා කරන්නට පටන් ගත්තේය.

රෑ තුනක්ම ඔරලෝසුව බැඳගෙන මම උන්නා
අන්ධකාරෙ දිහා බලන් කන්දීගෙන උන්නා
සැක හිතෙනා හෙමි හෙමිහිට සද්ද බද්ද.....

'ඕක නවත්තපං, පිස්සු බලු රාළ!' තිමූර් කෑ ගැසුවේය. 'උඹ ඔය හදන්නෙ මගෙ කලිසම ඉරල දාන්න. උඹ මේ මාව කොහේද ඇදගෙන යන්න හදන්නෙ?'

කෙසේ වෙතත් ඉන් මොහොතකට පසුව සිය මාමාගේ කාමරය කරා යොමු වුණ තරප්පු පෙලෙහි දොර වසා දැමූ ඔහු බල්ලා ද සමගින් පහලට දිව ගියේ ආලින්දයට පිවිසියේය. එහි එක් කොණක කුඩා දුරකතනයක් අසලම නූලකින් එල්ලන ලද පිත්තල සීනුවක් පැද්දෙමින් බිත්තියෙහි වදිමින් තිබිණි.

සීනුව අල්ලා ගත් කොලුවා නූල ඇණය වටේ ඔතන්නට විය. එක්වරම නූල ගැස්සී ගොස් බුරුල් විණි. කොතනින් හෝ එය කැඩී ගොස් ඇති සෙයකි. කෝපයට පත් ඔහු රිසීවරය අරගති.

ඉන් හෝරාවකට පෙර ඔල්ගා මේසයක් අසල භෞතික විද්‍යා පොතක් පෙරලාගෙන සිටියාය. එහි පිවිසි ජෙනී කුඩා අයඩීන් බෝතලයක් අරගත්තාය.

'ජෙනී.' ඔල්ගා සැර හඬකින් කතා කළාය. 'ඔයාගෙ උරහිස්ස සීරුණෙ කොහොමද?'

'ආං, ඒ මං ඇවිදගෙන එද්දි වුණ දෙයක්.' ජෙනී වගකට නොගෙන කීවාය. 'මොකක් හරි කටු අත්තක් පැටළුණාද කොහෙද. අන්න එහෙමයි ඒක වුණේ.'

'එතකොට ඔය විධිහටම මං එද්දි කටු අතු පැටලෙන්නැත්තෙ ඇයි?' ඔල්ගා සරදම්කාරී ස්වරයෙන් ඇසුවාය.

'එහෙම වෙන්න ඉඩ තියෙනව. ඔන්න ඔයාට ළඟදි ගණිත විභාගෙ එනව. ඒකත් හරිම කටු අත්තක් තමයි. හූරගන්නෙ නැතුව බේරෙන්න බලන්න. ඔල්යා, ඔයා ඉංජිනේරුවෙක් නොවී දොස්තර කෙනෙක් වෙන්න.' සිය සහෝදරියගේ මුහුණ ඉදිරියෙන් කුඩා කණ්නාඩියක් අල්ලමින් ජෙනී කියවාගෙන ගියාය. 'ටිකක් ඔයා දිහා බලන්නකො. ඔයා ඇවිල්ල මොන විධිහෙ ඉංජිනේරුවෙක්ද? නියම ඉංජිනේරුවෙක් නං මෙන්න මේ වගේ මෙන්න ඕනැ. මෙන්න මෙහෙම. මෙහෙම. ඇය එසේ කියමින් මුහුණු තුනක් මවා පෑවාය. 'ඒ වුණාට ඔයා මෙන්න මේ වගේනෙ. මෙන්න මෙහෙම.' සිය දෑස් සුරුංඩි කළ ජෙනී දෙබැම රැළි නංවා ආදරණීය මදහසක් පෑවාය.

'මෝඩි!' සිය සහෝදරිය වළඳ සිප ගනිමින් කී ඔල්ගා අනතුරුව මුදු ලෙස ඇය පසෙකට තල්ලු කළාය. 'අන්න අරහෙට යන්න ජෙනී, නිකං මට කරදර කරන්න එපා. ඔන්න ළිඳෙන් වතුර ටිකක් අරං එන්න පුළුවන්නං ඔයා මෙතනට වඩා ප්‍රයෝජනයි.'

පිඟානක වූ ඇපල් ගෙඩියක් ඩැහැගත් ජෙනී මුල්ලකට ලිස්සා ගියා මිනිත්තු කිහිපයක් ජනේලයෙන් පිටත බලා සිටියාය. ඉන්පසුව එකෝඩියනයේ කවරය විවෘත කළ ඇය සිය සහෝදරිය ඇමතුවායඃ

'ඔල්යා, දන්නවද වැඩක්? අද කෙනෙක් මාව මුණගැහෙන්න ආව. නරක පෙනුමක් තියෙන කෙනෙක් නං නෙවෙයි. දුඹුරු පාට කොන්ඩෙ, සුදු පාට ඇඳුම, එයා මෙහෙම කිවුවා. පුංචි කෙල්ලේ ඔයාගෙ නම මොකක්ද? ජෙනී- මං කිවුවා.'

'ජෙනී මට වදදෙන්නැතුව ඔය එකෝඩියන් එක පැත්තකින් තියනවද.' හැරී බැලීමට හෝ පොත වෙතින් දෑස් ඉවත ගැනීමට වද නොවෙමින් ඔල්ගා කීවාය.

'එතකොට ඔයාගෙ අක්කගෙ නම' එකෝඩියනය අතපත ගාමින් ජෙනී කියාගෙන ගියාය. ' මං හිතන්නෙ ඔල්ග කියල, හරිද?'

'ජෙනී මට වදදෙන්නැතුව ඕක පැත්තකින් තියනවද.' සිය සහෝදරියට යළි එසේ කීවද ඇය දූන් ජෙනී කියනා දෙයට සවන් දෙන්නට සැරසෙමින් සිටියාය.

'ඔයාගෙ අක්ක හොඳට වාදනය කරනව. එයා කිවුවා. එයා සංගීත විද්‍යාලෙට ගිහින් ඉගෙනගන්න කැමතිද?' (ඒ වන විට ජෙනී එකෝඩියනය කවරයෙන් ඉවතට ඇද එහි පටිය උර වටා දමා ගනිමින් සිටියාය.) නෑ. මං එයාට කිවුවා. එයා ඉගෙන ගන්නෙ කොන්ක්‍රීට් ගැනනෙ. ඊට පස්සෙ එයා කිවුවා, ඔහ්, (ජෙනී එකෝඩියනයේ යතුරක් එබුවාය.) ඉතිං මං කිවුව..... බූම්! (ජෙනී තවත් යතුරක් එබුවාය.)

'වදකාර කෙල්ල! ඔය එකෝඩියන් එක තියන්නයි කිවුවෙ!' නැගිටිමින් ඔල්ගා කෑගැවාය. 'නාඳුනන මිනිස්සු එක්ක කතා කරන්න කවුද ඔයාට අවසර දුන්නෙ?'

'හරි, හරි, මං මේක පැත්තකින් තියන්නං.' ජෙනී කෝප ගනිමින් කීවාය. 'එයා එක්ක කතා කළේ මං නෙවෙයි. මාත් එක්කයි එයා කතා කළේ. මං ඔයාට ඉතුරු ටිකත් කියන්නයි හිතා හිටියෙ, ඒත් දැන් නං මම කියන්නෙ නෑ. ඉන්නකො තාත්තා එනකං. එයා ඔයාට හොඳ වැඩක් කරයි'

'මට? එයා හොඳ වැඩක් කරන්නෙ ඔයාට තමයි. ඔයා මට කිසි වැඩක් කරන්න දෙන්නෙ නැති හැටි.'

'නෑ, ඔයා.' හිස් බාල්දියක් ගෙන ආලින්දයට දිවයන ගමන් ජෙනී කෑගැවාය. 'ඔයා සිය පාරකටත් වඩා මාව බූමිතෙල් ගේන්න සබන්, වතුර ගේන්න යවපු හැටි මං එයාට කියන්නංකො. මොකද මං ඇවිල්ල අශ්වයෙක්වත්, ලොරියක්වත්, ට්‍රැක්ටරයක්වත් නෙවෙයිනෙ.'

වතුර බාල්දියක් ගෙන ආ ජෙනී එය බංකුව මත තැබුවද ඔල්ගා පොතින් හිස ඔසවා බැලීමටවත් කරදර නොවූයෙන් ඇය මුහුණ බෙරි කරගෙන ගෙවත්තට ගියාය.

තට්ටු දෙකේ පරණ මඩුව ඉදිරිපිට ඇති කුඩා විවෘත තණ ගොල්ලට ගිය ඇය සිය සාක්කුවෙන් කැටපෝලයක් ගෙන කාඩ්බෝඩ් වලින් තනන ලද පැරෂුට් භටයකු අහසට විද හැරියාය.

හිස පහතට සිටින සේ ඇද වැටෙන්නට ගත් පැරෂුට් භටයා එක්වරම කරණමක් ගැසූ අතර ඒ සමගින් කරදාසි පැරෂුටය ඔහුගේ හිසට ඉහලින් දිගහැරී ගියේය. එහෙත් ඒ සමගම ඇදී ආ සුළං දහරාවක් විසින් ඔහු මඩුවෙහි ජනේලයෙන් ඇතුලත වූ අන්ධකාරයට ගසාගෙන යනු ලැබිණි.

අනතුරක්! මේ පුංචි කාඩ්බෝඩ් වීරයා ගලවා ගැනීමට වහාම යමක් කළ යුතුය. ජෙනී වහලයේ සිට සෑම දිශාවටම තදට කම්බි ඇද ඇති මඩුව වටා දිවගියාය. අබලන් හිනිමග ජනේලයට හේත්තු කළ ඇය ඒ දිගේ නැග මඩුව තුළට පැනගත්තාය.

මොන තරම් අමුතුද! පෙනුනේ මඩුවෙහි කවුරුන් හෝ හිඳ ඇති සැටියකි. එහි එක් බිත්තියක ඇඹරුණු ට්වයින් නූල් වගයක්, ලන්තෑරුමක්, හරහට තබන ලද සංඥා කොඩි දෙකක් සහ අභිරහස් සංඥාවන් සහිත සිතියමක් එල්ලා තිබිණි. එක් මුල්ලක ගෝණියකින් වසන ලද පිදුරු ගොඩකි. ඒ අසලම උඩු අතට හරවන ලද සබන් පෙට්ටියකි.

නැවක සුක්කානමක් සේ පෙණුන විශාල රෝදයක් බිත්තිය ආසන්නයේ වහලයේ පාසි බැඳුන දූල අතරින් පිටට නෙරා විත් තිබිණි. ඊට ඉහලින් එල්ලෙමින් පැවතියේ නිවසේදී සාදන ලද දුරකථනයකි.

ජෙනී බිත්තියෙහි පැල්මක් අතරින් එබී බැලුවාය. පිටත පාලනයකින් තොරව වැවුණ ගෙවත්තේ තුරු පත් මුහුදක් මෙන් නළියමින් පැවතියේය.

අහසෙහි පරෙවියෝ පියාසැලූහ. ජෙනී අහසේ ඉගිලෙන්නේ පරෙවියන් නොව මුහුදු ළිහිණියන් බවත් කඹ , ලන්තෑරුම් සහ කොඩි වලින් යුත් පරණ මඩුව විශාල නැවක් ලෙසත් සිතෙහි මවා ගත්තාය. එහි කපිතාන්වරයා වනුයේ ඇයයි.

ඒ නම් හරිම විනෝදජනක වැඩකි. ඇය රෝදය කරකැවූවාය. තදට අදින ලද කම්බි කම්පනය වන්නට සහ ඉන් ගුම් නදක් නැගෙන්නට පටන් ගති. සුළඟ සියුරුහන් නද දීගෙන හරිතවන් රළ මත හැපුණේය. පෙනුණේ ඇගේ නෞකාව හෙමිහිට, එහෙත් අභිමානවත් අන්දමින් තරංගයන් අතරින් හැරෙනා බවකි.

'කෙලින්ම වරායට!' උස් හඬින් විධානය කළ ඇය සුක්කානමට බර දුන්නාය.

අන්න ඒ මොහොතේදී පියස්සෙහි වූ සිදුරු අතරින් ගලා ආ පටු, සෘජු හිරු කිරණ දහරාවන් කිහිපයක් ඇගේ මුහුණ සහ ගවුම මත වැටුණේය. එහෙත් මේ කිරණ දහරාවන් යනු තමන් ඉන්නා තැන සොයාගෙන තමන් සමග සටනට ඒමට තීරණය කර ඇති සතුරු යාත්‍රාවලින් නිකුත් කරනු ලබනා පරීක්ෂණ එළි දහරාවන් බව ජෙනී වටහා ගත්තාය.

කිරි කිරි නද දුන් සුක්කානම කරකවමින් ජෙනී මහානුභාවසම්පන්න ලීලාවෙන් විධාන නිකුත් කරමින් කෞකාව වමට සහ දකුණට හරවන්නට වූවාය.

ඉක්මනින්ම තියුණු පිරික්සුම් එළි දහරාවන් මැලවී පහව ගියේය. එහෙත් එහි අරුත හිරුමඩල වලාකුලක් පසුපස සැඟවුණා යන්න නම් නොවේ. එහි සැබෑ අරුත සතුරු බලකාය සමුදුරු පත්ලට කිඳා බසිමින් ඉන්නේය යන්නයි.

සටන හමාර විණි. ජෙනී දුහුවිල්ල බැඳි පිටි අත්ලෙන් නළල පිසදැම්මාය. හදිසියේම දුරකථනය නාද විණි. ජෙනී එය අපේක්ෂා කළේ නැති-ඇය සිතුවේ එය සෙල්ලම් දුරකථනයක් කියාය. දැන් ඇයට අසහනකාරී බවක් දැනෙන්නට පටන් ගැණිනි. ඇය රිසීවරය ඔසවූවාය. තියුණු හඬක් ඉන් ගලා ආයේය.

'හලෝ,හලෝ, කවුද ඔතන? කවුද මේ වයර් කඩල දාලා තේරුම් ගන්න බැරි සංඥා එවන මෝඩ බූරුවා?'

'මේ බූරුවෙක් නෙවෙයි.' ජෙනී වියවුලට පත්ව මිමිණුවාය. 'මේ මම ජෙනී.'

'තමුසෙ පිස්සු කෙල්ල!' සැබෑම උනන්දුවක් පල කරනා හඬකින් ඒ හඬ බෙරිහන් දුන්නේය. 'වහාම ඔය රෝදෙ අතැරල පන බේරගෙන දුවන එකයි! දැන් කොයි මොහොතෙ හරි උන් ඇවිල්ලා තමුසෙගෙ ඔලු ගෙඩිය පොඩි පට්ටම් කරල දායි!'

ජෙනී රිසීවරය පහත හෙළුවාය. එහෙත් ඇය එවිටද පමා වැඩිය. ජනේලයෙන් හිසක් එබිණි. ඒ ගෙයිකාගේ හිසයි. ඉන්පසුව සිමා සිමාකොව්, නික් කොලොකොල්චිකොව් සහ අනෙක් රංචුව එකා පසුපස එකා බැගින් ඇතුලට රිංගුවෝය.

'තමුසෙල කවුද?' බියෙන් තැතිගෙන ජනේලය වෙතින් මැත්වන ගමන් ජෙනී ඇසුවාය. 'යන්නයි කිව්වෙ! මේක අපේ වත්ත! මං තමුසෙලට එන්න කිවුවෙ නැනෙ!'

එහෙත් තදට උරෙනුර ගැටීගත් කොලු පවුරක් ජෙනී කරා ඇදෙන්නට වීය. කොණකට කොටුවූ ජෙනී මරහඬ නැගීය.

ඒ මොහොතේදී තවත් රුවක් අවුදින් ජනෙල් කවුළුව අඳුරු කළේය. ආපසු හැරුණ කොලු රැළ විසිර ගියෝය. ඒ සමග ජෙනී දුටුවේ තමන් උස්, කළු කෙස් ඇති, රතු තරුවක් පපුවෙහි එම්බ්‍රොයිඩර් කර ඇති නිල් පැහැ අත් නැති කමිසයක් ඇඳ සිටි කොලුවකුට මුහුණ පා ඉන්නා බවයි.

'සද්දෙ අඩු කරන්න ජෙනී!' ඔහු උස් හඬින් පැවසීය. 'ඔයා කෑ ගහන්න හොඳ නෑ. කවුරුවත් ඔයාට කරදර කරන්න එන්නෙ නැනෙ. අපි දෙන්නට දෙන්න අඳුනනව. ඔයයි මායි, මං තිමූර්.'

'ඔයාද තිමූර්?' කඳුළු පිරි දෑස අයා ගනිමින් ජෙනී එය අදහාගත නොහැකිව කෑගැවාය. 'එතකොට ඊයෙ රෑ මාව පොරෝනාවකින් වහල ගියේ ඔයා නේද? අර මේසෙ උඩ සටහනක් තියලත් ගියෙ? ඒ වගේම තාත්තට විදුලි පණිවුඩේ යවල යතුරයි රිසිට් එකයි මට ගෙනත් තිබ්බෙ? ඒත් ඇයි ඔයා එහෙම දෙයක් කළේ? මං කවුද කියල ඔයා දන්නෙ කොහොමද?'

මේ අවස්ථාවේදී ඇය කරා පැමිණි ඔහු ඇගේ අත ගෙන කතා කරන්නට වීයඃ

'ඔයා දැන් අපි එක්ක ඉන්න එක හොඳයි. වාඩිවෙලා අහගෙන ඉන්න. එතකොට ඔයාට හැමදේම තේරෙයි.'

ඉන්පසුව කොලු රැළ තිමූර් වටා ගෝනි වලින් වැසුණු පිදුරු මත හිඳගත්තෝය. තිමූර් ඔවුන් ඉදිරිපිට වත්තේ සිතියමක් දිගහැරගති.

ජනේලයට ඉහලින් බිත්තියෙහි වූ සිදුරක් ඉදිරිපිට එල්ලෙමින් පැවති කඹයක් මත මුර කපොල්ලක් ස්ථාපිත කරනු ලැබිණි. මුරභටයාගේ ගෙලෙහි ඔපෙරා කණ්නාඩි කුට්ටමක් එල්ලෙමින් තිබිණි.

තිමූර් නුදුරු ස්ථානයක හිඳ සිටි ජෙනී තම මුළු අවධානයම මේ අතිශය රහසිගත මූලස්ථානයෙහි පැවති සාකච්ඡාවෙහි ප්‍රගතිය කරා යොමු කළාය. තිමූර් කතා කරන්නට වූවේය:

'හෙට එළිවෙද්දී, හැමෝම නින්දෙ ඉන්න වෙලාවෙ කොලොකොල්චිකොවුයි මමයි මෙයා (ජෙනී පෙන්වමින්) කඩල දාපු වයර් ටික අලුත්වැඩියා කරනව.'

'අපෝ මෙයා නිදිමතයා.' ඉරි වැටුණු නාවුක ජර්සියකින් සැරසී සිටි මුනිස්සම් ඔළුවා එනම් ගෙයිකා බුම්මාගත්වනම බාධා කළේය. 'මිනිහ නැගිටින්නෙ උදේට කන්නයි දවල්ට කන්නයි විතරමයි.'

'ඒක අමු කෙප්පයක්!' උඩ පැන්න නික් ගොත ගසන්නට වූවේය. 'මං මුල්ම ඉ-ඉර එළි-ය-ය වැටෙන කො-කොටම නැ-නැගිටිනව.'

'හොඳයි, මම ඔය කියන මුල්ම ඉර එළිය දෙවෙනි එක මොකක්ද කියල දන්නෙ නෑ. හැබැයි මිනිහ නිදිමතයා කියල නං මම ටක්කෙට දන්නව.' ගෙයිකා මුරණ්ඩු ලෙස කීවේය.

මේ අවස්ථාවෙහිදී මුර භටයා තළාව පිම්බේය. කොලු රැළ වහා නැගිටගත්තෝය.

දූහුවිලි වලාවක් අවුස්සමින් අසු පිට නැගි කාලතුවක්කු බලකායක් මාවත දිගේ ගමන් කළේය. ලෝහ සහ සම් රැහැන් යොදා ඇති ශක්තිමත් අසුන් හරිත පැහැ උණ්ඩ පිරි කරත්ත සහ ටාර්පෝලින් රෙද්දෙන් වසන ලද කාලතුවක්කු ඇදගෙන ගියෝය.

හිරු එළියට පදම්ව ගිය සිරුරින් යුත් අශ්වාරෝහකයෝ සිය සෑදල මත සමබරව හිඳිමින් මදක් හෝ වැනෙන්නේ නැතිව එකා පසුපස එකා බැගින් වේගයෙන් වංගුවෙන් හැරුණෝ මුළු බලකායම වනපෙත තුළට වැදුණෝය. ඉක්මනින්ම බලකාය දසුනින් අතුරුදන් විණි.

'ඒ අය කෝච්චියට නගින්න ස්ටේෂන් එකට යන ගමන්.' නික් මහන්තත්තකමක් පාමින් කීවේය. 'මට එයාලව නිල ඇඳුමෙන් අඳුනග

න්න පුළුවනි. මට ඒ අය යන්නෙ සරඹ අභ්‍යාසයකටද, පෙරේට්ටුවකටද, එහෙමත් නැත්නං වෙන වැඩකටද කියල දූක්ක ගමන් කියන්න පුළුවනි.'

'මේ තමුසෙ ඇස් දෙක ඇරගෙන කට වහගෙන ඉන්නවද.' ගෙයිකා ඔහු නතර කළේය. 'මේ අපිටත් ඇස් පේනව. උඹල දන්නවද කොල්ලනේ, මේ පුස්සට රතු හමුදාවට බැඳෙන්න යන්න ඕනලු.'

'ඒක කරන්න බෑ.' තිමූර් මෙහිදී මැදිහත් වූවේය. 'ඒක හරියන වැඩක් නෙවෙයි.'

'ඇයි නැත්තෙ?' නික් මුහුණ රතු කරගනිමින් ඇසීය. 'එහෙනං ඔය කොල්ලො හැමවෙලාවෙම ගෙදරින් පැනල පෙරමුණට යන්නෙ කොහොමද?'

'එහෙම පුළුවන් වුනේ කලින්. දූන් හමුදාවෙ ලොක්කන්ටයි නිලධාරීන්ටයි එහෙම එන කොල්ලන්ට ගහල එලවන්න තදට නියෝග ලැබිල තියෙන්නෙ.'

'තමුසෙ කොහොමද ගහල එලවන්න කියල කියන්නෙ?' තවත් රතු පැහැ වෙමින් නික් කෑගැහුවේය. 'තමුසෙ කියන්නෙ- ඒ අයගෙම පැත්තෙ ඉන්න අයට?'

'අන්න හරි.' තිමූර් සුසුමක් හෙළීය. 'එයාලගෙම පැත්තෙ. දූන්, යාළුවනේ අපි අපේ වැඩේට බහිමු.'

කොලු රැළ නැවතත් තම තමන්ගේ ස්ථානයන්ට ගියෝය.

'අඳුනන්නෙ නැති කොල්ලො වගයක් වංගුව පාරෙ අංක 34 ගෙවත්තෙ තියෙන ඇපල් හොරකම් කරනව.' නික් බුම්මාගත්වනම කීවේය. 'උන් අතු දෙකකුත් කඩල. මල් පාත්තියකුත් එහෙමපිටින්ම පාගල දාල.'

'ඒ කාගෙ ගෙදරද?' තිමූර් සිය සටහන් පොත වෙත නෙත් හෙළීය. 'ඒක ක්‍රෑකොව් සොල්දාදුවන්ගෙ. දූන්, තමුන්ගෙන් කවුද අනෙක් උදවියගෙ ඇපල් වතුවලට පනින්න දක්ෂ කලින් හිටපු විශේෂඥයො?

'මේ මං.' අසහනයට පත් හඬක් අවදි විණි.

'මේ වැඩේ කරන්න පුළුවන්කම තිබ්බෙ කාටද?'

'ක්වාකින්ටයි මිතිහගෙ ගෝලයටයි. අර ඉලක්කමා කියන හාදය. උන් මිචුරින්ලගෙ ගහක් තෝරගෙන තියෙනව. ඒ ගහේ රත්තරන් පාට ඇපල් හැදෙන්නෙ.'

'ආයෙත් අර ක්වාකින්!' තිමූර් මොහොතක් කල්පනා කළේය. 'ගෙයිකා! උඹ මිනිහත් එක්ක කතා කළාද?'

'මං කතා කළා.'

'ඉතිං මොකද වුණේ?'

'දෙපාරක් හක්කට දමල ඇන්නා.'

'මිනිහ මොකද කළේ?'

'මිනිහත් මට පාරක් දෙපාරක් දමල ඇන්න.'

'උඹට හැම තිස්සෙම කියන්න තියෙන්නෙ ඌ මට ගැහුව මං ඌට ගැහුව කියන එක තමයි. හරියට ඒකෙන් මහ ලොකු දෙයක් වෙනව වගේ! අපි ක්වාකින්ගෙ වැඩේ විශේෂ එකක් හැටියට ගනිමු. ඊළඟට?'

'අංක 25 ගෙදර ඉන්න කිරිකාරිගෙ පුතාව අශ්වාරෝහක බලකායට කැඳවල.' මුල්ලක සිටි කොලුවෙක් කීවේය.

'අන්න ඒක නං හොඳ ප්‍රවෘත්තියක්.' තිමූර් අප්‍රසාදය පල කරන ආකාරයට හිස සලමින් කීවේය. 'අපි අපේ සළකුණ ගේට්ටුවෙ ගහල දවස් දෙකක් වෙනව. කවුද ඒක හයි කළේ-කොලොකොල්චිකොව් තමාද?'

'ඔව්.'

'එහෙනං ඇයි ඒකෙ උඩ වම් කොණ කුඩැල්ලෙක් වගේ වැනෙන්නෙ? තමුන් මොකක් හරි වැඩක් භාරගත්තනං ඒක හරියට කරන්න ඕනැ. ඒක දැක්කහම මිනිස්සු හිනාවේවි. ඊළඟට?'

වහා උඩ පැන සිටගත් සීමා සිමාකොව් සිය වාර්තාව කියවන්නට වූවේය.

'පුෂ්කාරියොව් පාරෙ අංක 54 නිවසේ එළුවෙක් නැතිවී ඇත. මම ඇවිදගෙන යද්දි වයසක උන්දෑ කෙනෙක් ගෑනු ළමයෙකුට තඩිබානු දුටිමි. මම කෑගැවෙමි. 'නෝනා ඔහොම ළමයින්ට ගහන එක නීති විරෝධියි.' එවිට ඇය මෙසේ පැවසුවාය. 'මෙකි එළිච්චිවව නැති කරගෙන. හමගහන්නයි වටින්නෙ.' 'කොහේදිද නැතිවුණේ?' 'අරහෙ අර කැලෑවට එහා අගලෙදි. ඌ කඹේ හපල කඩාගෙන ගිහිල්ල. වෘකයෙක් ගිලල දාල කියල කෙනෙක් හිතන්න පුළුවන්.

'පොඩ්ඩක් හෝව්! කාගෙ ගෙදරද?'

'පෝල් ගුර්යෙව්ගෙ. එයා ඉන්නෙ හමුදාවෙ. ගෑනු ළමය එයාගෙ දුව. එයාගෙ නම ඇනී. එයාට ගගහ හිටියෙ එයාගෙ ආච්චි. එයාගෙ නම දන්නෙ නෑ. එළිච්චි අළු පාටයි. පිට කලු පාටයි. උගෙ නම මන්කා.'

'වහාම ඒ එළිච්චිය සොයාගනු!' තිමූර් නියෝග කළේය. 'හතර දෙනකුගෙන යුත් භට පිරිසක් රැගෙන යනු. තමුන්, තමුන්, තමුන්. හොඳයි හාදයිනේ, ඔච්චරද?'

'අංක විසිදෙක ගෙදර හැම වෙලාවෙම ගෑනු ළමයෙක් අඬනව.' ගෙයිකා අකමැත්තෙන් කියා පෑවේය.

'ඇයි එයා අඬන්නෙ?'

'මං අහල බැලුවා. ඒත් එයා කියන්නෙ නෑ.'

'තමුන් වඩා හොඳ විධිහකට අහන්න එපායැ. කවුරු හරි එයාට ගහනව වෙන්න පුළුවනි. එහෙමත් නැත්තං එයාට නරක විධිහට සලකනව වෙන්නත් පුළුවනි.'

'මං ඇහුව, කියන්නෙ නෑ.'

'ලොකු ළමයෙක්ද?'

'වයස අවුරුදු හතරයි.'

'තමුන් නං මහම බේදවාචකයක් තමයි. අඩු ගානෙ එයා ලොකු කෙනෙක් නං කමක් නෑ..... තාම වයස අවුරුදු හතරයි. එක මිනිත්තුවක්-කාගෙ ගෙදරද ඒ?'

'ලුතිනන් පාවුලොව්ගෙ. මේ ළඟදි පෙරමුණේදී මැරුණෙ, අන්න එයාගෙ ගෙදර.'

'මං එයාගෙන් ඇහුවත් කිවුවෙ නෑ.' ගෙයිකා ගැන අප්‍රසාදයෙන් තිමූර් පරිහාසාත්මකව කීවේය. රවා බැලූ ඔහු මොහොතක් කල්පනා කළේය. 'හරි, කමක් නෑ. ඒක මට තියන එකයි.'

'කච්කින් ජේන හරියෙ ඉන්නවා!' මුරභටයා කෑ ගැසේය. 'මිනිහා පාරෙ අනික් පැත්තෙන් ඇවිදගෙන යනව. ඇපල් ගෙඩියකුත් කකා. තිමූර් අපි මිනිහට පහර දෙන්න බලකායක් යවමුද?'

'එපා, තමුන් ඉන්නා තැනම සිටිනු. මං ඉක්මනටම එනව.'

හිණිමග දිගේ පහළට බැස්ස ඔහු පඳුරු අතරින් නොපෙනී ගියේය. දැන් මුරභටයා සිය විස්තර ප්‍රචාරය කරගෙන යන්නට විය.

'ඔව්, ලස්සන පෙනුමක් තියෙන ගෑනු ළමයෙක් මගේ දර්ශණ පථයට පැමිණියා. නම නොදනී. ජෝගුවක් අතේ තියාගෙන ගේට්ටුව අසල සිටගෙන කිරි මිලදී ගනියි. ඇය නිවසෙහි සිටිනා කෙනෙක් විය යුතුමය.'

'ඒ ඔයාගෙ අක්කද?' තික් ජෙනීගේ ගවුම් අතින් අදිමින් ඇසීය. පිළිතුරක් නොලද්දෙන් ඔහු ඇයට බරපතල එමෙන්ම තරමක් තරහගිය හඬකින් අනතුරු ඇඟවීය. 'හැබැයි මෙතන ඉඳල එයාට කතා කරන්න හදනව හෙම නෙවෙයි, හරිද!'

'කටවහගන්නව!' සිය උරහිස ගස්සා ඔහුගේ අත මුදමින් ජෙනී සමච්චල් සහගත ලෙස බැන වැදුණාය. 'එන්නෙපා මෙතන මට නියෝග දෙන්න.'

'එයාට පාඩුවෙ ඉන්න දෙනව.' ගෙයිකා තික් හට සරදම් කළේය. 'එහෙම නැත්නං එයා තමුසෙට හොඳ ගුටියක් දෙයි.'

'කවුද? මේ මට?' එයින් තික් හොඳටම කෝප ගති. 'මොනවද එයාට තියෙන්නෙ? නියපොතු විතරයි! මට එහෙමද? මට තියම මස්පිඩු තියෙන්නෙ. මේ බලනව, මේ අත දිහා බලනව. දැක්කද? මගෙ කකුල් දිහාත් බලනව.'

'ඒ මොක වුනත් එයා තමුසෙට ගුටියක් නං දෙයි. ඔය මස්පිඩු තිබුණා නැතා බඩු හම්බුවෙයි. ඒයි හාදයිනේ, බලාපල්ලා! තිමූර් කව්කින් ට කිට්ටු කරනව.'

ගසකින් කඩා ගත් අත්තක් ඔහේ වනමින් තිමූර් කව්කින්ගේ මග අවුරාලීම සඳහා යමින් සිටියේය.

ඔහු එනු දුටු කව්කින් නතර විණි. ඔහු වෙතවූ ස්වභාවයෙන් බියක් හෝ විමතියක් පලවූයේ නැති.

'හායි, කොමිසාර්!' සිය හිස එක් ඇලයකට හරවමින් ඔහු සන්සුන් ස්වරයෙන් කීවේය. 'මේ තරම් කලබලෙන් කොහෙද යන්නෙ?'

'හායි, ලොක්කා!' තිමූර්ද ඒ අයුරින්ම පිළිතුරු දුන්නේය. 'මං මේ තමුසෙව මුණගැහෙන්න එනගමන්.'

'දකින්න ලැබීමත් සතුටක්. අපරාදෙ මගෙ ළඟ තමුසෙට දෙන්න දෙයක් නැතිඑක. මෙන්න මේක නං....' සිය කමිසය අතපත ගෑ ඔහු ඇපල් ගෙඩියක් දිගු කළේය.

'හොරකම් කරපු එකක්?' එහි රස බලමින් තිමූර් ඇසීය.

'අන්න හරි.' කව්කින්ද කීවේය. 'රන්වන් ඇපල්. එකම ප්‍රශ්ණෙ තාම හරියට ඉදිල නැති එක.'

'විනාකිරි ගානට ඇඹුලයි!' මුහුණ ඇඹුල් කරගත් තිමූර් ඇපල් ගෙඩිය වීසි කළේය. 'මේ බලනව. තමුසෙ මෙන්න මේ වගේ සළකුණක් අංක 34 ගෙදර වැටේ ගහල තියෙනව දැක්කද?' තිමූර් තම නිල් පැහැ කමිසයෙහි එම්බ්‍රොයිඩර් කර ඇති තරුවක් පෙන්වා සිටියේය.

'ඉතිං මං දැක්කයි කියල ඇති වැඩේ මොකක්ද?' කව්කින් ප්‍රවේශම් සහගතව කීවේය. 'සහෝදරය මම දවල් රෑ දෙකේම මගෙ ඇස් ඇරගෙන ඉන්නෙ.'

'එහෙනං මගෙ උපදේසෙට කන්දෙනව. මෙන්න මේ සළකුණ කොහෙදි හරි ඇහැ ගැහුණොත් දවල් හරි රෑ හරි, උණුවතුර ගහපු බළලෙක් වගේ පැනල දුවනව.'

'මං කියන්නෙ කොමිසාර්, තමුසෙ නං මහ ගිනි කන්නෙක්!' කව්කින් ඇද පැද කීවේය. 'ඔය ඇති ඒ කතාව.'

'මේ අහනව ලොක්කා, තමුසෙ නං කොටළුවෙක්.' තිමූර් සිය ස්වරය උස් නොකර කීවේය. 'මේක තමයි අපේ අන්තිම සාකච්ඡාව. අන්න ඒ හන්ද ඒක මතක තියාගෙන තමුසෙගෙ රංචුවට කියනව.'

මේ දෙදෙනා අතර වූ වදන් හුවමාරුව දකින කවුරු වුව සිතනු ඇත්තේ දෙදෙනාම ගජ මිතුරන් කියාය. එහෙයින් සිය කිරි බඳුනද අතැතිව ගේට්ටුව අසල සිටගෙන සිටි ඔල්ගා අර කව්කින් තම මැරයා සමග කතා කරනා පිරිමි ළමයා කවුරුදැයි කිරිකාරියගෙන් ඇසීම පුදුමයක් නොවේ.

'අනේ මං දන්නෙ නෑ.' කිරිකාරිය සැරෙන් කීවාය. 'මං හිතන්නෙ ඒත් තව මැරයෙක් විතරයි කියලයි. මං ඒකා ඔයාලගෙ ගේ වටේ කැරකෙනව දැකල තියෙනව. රත්තරනේ උන් ඔයාගෙ පුංචි නංගිට කරදර කරයිද කියල බලාගෙන.'

ඔල්ගා ඉන් අසහනයට පත්වූවාය. කොල්ලන් දෙදෙනා දෙස කෝප සහගත බැල්මක් හෙළූ ඇය ආපසු ආලින්දය කරා ගියා කිරි බඳුන පසෙක තබා, දොරද අගුළු දමා දූනට පැයකටත් වැඩි කාලයක් තිස්සේ ගේ පැත්ත පලාතේ නොආ ජෙනී සොයන්නට පිටත් වූවාය.

ආපසු මඩුව කරා පැමිණි පසුව තිමූර් කොල්ලන් හට තමන් සහ කව්කින් අතර වූ කතාබහ ගැන කියා සිටියේය. පසුදිනයේදීම උන් රංචුවට තර්ජනාත්මක ලිපියක් යැවීමට ඔවුහු ඉන්පසු තීරණය කළෝය.

හඬ නොනැගෙන සේ බමට බට කොලු රංචුව ආපසු සිය නිවෙස් බලා දිවුවෝය. සමහරු වැටෙහි කපොලු අතරින් රිංගා යද්දී තවත් සමහරු වැටට උඩින් පැන්නෝය.

තිමූර් ජෙනී වෙත හරුණේය.

'ඉතිං?' ඔහු ඇසීය. 'දැන් හැමදේම පැහැදිලිද?'

'සම්පූර්ණයෙන්ම.' ඇය පිළිතුරු දුන්නාය. 'අනෙක් අතට සම්පූර්ණයෙන්මත් නෙවෙයි. ටිකක් සරල කරල කියන්න.'

'හරි, ඉස්සෙල්ල පහලට බැහැල මගෙ පස්සෙන් එන්න. දැන් ඔයාගෙ අක්ක ගෙදර නෑ.'

ඔවුන් බිමට බට පසුව තිමූර් හිණිමග පසෙකට තල්ලු කර දැමීය.

දැන් එහි වූයේ අන්ධකාරයයි. එහෙත් ජෙනී පූර්ණ විශ්වාසයෙන් යුතුව තිමූර් පසුපස පියමැන්නාය.

ඔවුහු මහළු කිරිකාරියගේ නිවෙස අසල නතර වූවෝය. තිමූර් වටපිට බැලීය. පේන තෙක් මානේ කිසිවකුත් නැති. සිය සාක්කුවෙන් තෙල් සායම් ටියුබයක් පිටට ගත් තිමූර් ගේට්ටුව කරා ගියේය. සැපැවින්ම ගේට්ටුවෙහි වූ තරුවෙහි ඉහල වම් කොණ කුඩැල්ලෙක් මෙන් ඇලව ගොසිනි.

තිමූර් ඒ ඇඳය සකසා තරුව නිසි ලෙස පින්තාරු කළේය.

'ඔයා එහෙම කරන්නෙ ඇයි?' ජෙනී ඇසුවාය. 'කරුණාකරල මට ඒ ඇයි කියල තේරුම් කරල දෙන්නකො.'

තිමූර් ටියුබය නැවත සාක්කුවෙහි රුවා බර්ඩොක් පතකින් සායම් තැවරුණ අතැඟිල්ල පිසදා කෙලින්ම ජෙනී ගේ මුහුණ දෙස බලමින් කතා කරන්නට පටන් ගති.

'ඒ තරුවෙ තේරුම ඒ ගෙදර ඉන්න පිරිමියෙක් හමුදා සේවයට ගිහිල්ල කියන එකයි. ඒ වගෙම ඒ මොහොතෙ ඉඳන් ඒ ගෙදර තියෙන්නෙ අපේ ආරක්ෂාව සහ රැකවරණය යටතෙ කියන එකයි. ඔයාගෙ තාත්තා ඉන්නෙ හමුදාවෙද?'

'ඔව්!' ජෙනී මහත් අභිමානයෙන් සහ හැඟුම්බර බවින් කීවාය. 'එයා නිළධාරියෙක්.'

'ඒකෙ තේරුම ඔයත් අපේ ආරක්ෂාව සහ රැකවරණය යටතට වැටෙනව කියන එක.'

ඔවුහු තවත් නිවෙසක ගේට්ටුව අසල නතර වූවෝය. එහිද කළු පැහැයෙන් දාර සළකුණු කරන ලද රතු තරුවක් තිබිණි.

''දැක්කද ඒක?' තිමූර් ඇසීය. 'මේ ගෙදරිනුත් පිරිමි කෙනෙක් හමුදා සේවයට ගිහිල්ලා. හැබැයි එයා මැරිල. මේ තියෙන්නෙ ලූතිනන් පාව්ලොව්ගෙ ගෙදර. එයා මේ ලඟදි තමයි පෙරමුණේදි මැරුණෙ. එයාගෙ බිරිඳයි පුංචි දුවයි මෙහෙ තමයි ජීවත් වෙන්නෙ. අපේ යහපත් ගෙයිකා කල්පනා කරනව පුංචි ගෑණු ළමයෙක් හැම වෙලාවෙම අඬන්නෙ ඇයි කියල. ඔයාට ඉඩක් තියේ නං ජෙනී ඒ ළමය වෙනුවෙන් මොනව හරි කරන්න.'

ඔහු මේ සියල්ල පැවසුවෙ බෙහෙවින් සරල ආකාරයටය. එහෙත් සන්ධ්‍යාව උණුසුමින් යුක්ත වුවද තම පිට දිගේ සීතල හිරියක් දිවයන සෙයක් ජෙනීට දැණුනි.

ඇය බා ගත් හිසින් එහි සිටගෙන සිටියාය. යමක් පැවසිය යුතු නිසාවෙන් ඇය ප්‍රශ්ණයක් නැගුවාය. 'ඔය ගෙයිකා ඇත්තටම හොඳද?'

'ඔව්.' තිමූර් කීවේය. 'එයාගෙ තාත්තා නැවියෙක්. ඒ තාත්තා හැම වෙලාවෙම උත්සාහ කරන්නෙ ඔය මාන්නක්කාර කොලොකොල්චිකොව්ගෙ තියෙන ඔළු ගතිය අහක් කරන්න. හැබැයි ඉතිං මිනිහු හැම වෙලාවෙම එහෙමම තමයි.'

ඒ සමග කෝපාන්විත, විධානකාරී හඬක් මතුව ආවේය. 'ජෙනී!' ඒ ඇසුණ ඔවුහු කැරකී බැලුවෝය. ඔවුන් ආසන්නයෙන්ම වාගේ පිටුපසින් ඕල්ගා සිටගෙන සිටියාය.

ජෙනී තිමූර්ගේ අත අල්ලාගති. ඇයට වුවමනා වූයේ ඔහු සිය අක්කණ්ඩියට හඳුන්වා දීමටය.

එහෙත් සැර, හැඟීම් විරහිත සේ පෙනුන දෙවන ඇමතුම ඇයට දෙවරක් සිතන්නට බල කළේය.

තිමූර් වෙත සමාව ඉල්වන බැල්මක් හෙලමින් සහ වියවුලට පත් බව අඟවමින් දෙවුර ගස්සමින් ජෙනී ඕල්ගා කරා පියමැන්නාය.

'ජෙනී!' හයියෙන් හුස්ම ගනිමින් සහ අඬන්න ඔන්න මෙන්න ස්වභාවයෙන් ඔල්ගා ජෙනී ඇමතුවාය. 'මං ඔයාට අර කොල්ල එක්ක කතා කරන්න තහනම් කරනව. ඔයාට ඇහුනද?'

'ඒත් ඒ ඇයි ඔල්ගා?' ජෙනී මිමිණුවාය. 'මොකක්ද ප්‍රශ්ණෙ?'

'මං ඔයාට ඒ කොල්ල එක්ක ආස්සරේ තහනම් කරනව.' ඔල්ගා දැඩි ස්වරයෙන් පුනරුච්ඡාරණය කළාය. 'ඔයාට වයස දහතුනයි. මට දහඅටයි. මං ඔයාගෙ සහෝදරී. මං ඔයාට වඩා වැඩිමල්. අනික තාත්තා යද්දි මට කියල ගියේ.....'

'ඒත් ඔල්ගා, ඔයාට කිසිම දෙයක් තේරෙන්නෙ නෑ.' ජෙනී අපේක්ෂා විරහිත හඬින් කෑ ගැවාය. ඇය සිටියා වෙවුලමිනි. ඇයට සියල්ල විස්තර කිරීමට, තමන් සාධාරණ බව පෙන්වීමට ඇවැසි විණි. එහෙත් ඇයට ඒ කළ නොහැකි විණි. ඇයට ඒ සඳහා අයිතියක් නැති. එහෙයින් අසරණ ලෙස අත වැනූ ඇය කිසිවක් කීමෙන් වැලකුණාය.

කෙලින්ම නිවෙසට ගොස් ඇඳට වැටුණද බොහෝ වේලාවක් යනතුරු නින්ද ඇය කරා ආවේ නැති. එසේම නින්දට වැටුන පසුව ඇයට රාත්‍රියේ යමකු ජනේලයට තට්ටු කර තම පියාගෙන් ලැබුණ විදුලි පණිවුඩයක් බාරදෙන හඬ ඇයට ඇසුනේද නැති.

උදෑසන එඬේරා සිය දූවමුවා සංගුව පිම්බේය. සිය ගේට්ටුව විවෘත කළ කිරිකාරිය සිය එළදෙන පොදු සතුන් රංචුවට දක්කාගෙන ගියාය. ඇය වංගුවෙන් හැරෙනවාත් සමගම වාගේ ආකේසියා පඳුරක් පිටුපසින් පැන්න කොල්ලෝ පස්දෙනෙක් සිය හිස් බාල්දි වලින් හඬ නොනග න්නට ප්‍රවේශම් වෙමින් ළිඳ කරා දිවුවෝය.

'පුරවපං.'

'අපි ඒක ගමු.'

'ඔන්න.'

'ගන්න.'

එකා පසුපස එකා බැගින් කොල්ලෝ සිය දෙපතුල් පුරා සිසිල් දිය ඉහිරවාගනිමින් අංගනය කරා දිවුවෝ ය. එහිදී සිය බාල්දි වල වූ ජලය ඕක් ලීයෙන් කළ පීප්පයට හිස් කර නැවත ළිඳ වෙත දිවුවෝය.

තිමූර් දිය ඇදීමෙන් තේතබරිව සිටි සීමා සිමාකොව් කරා දිව ගියේය.

'කොලොකොල්චිකොව් දැක්කද? නෑ? එහෙනං මිනිහ අදත් පරක්කු වෙනකං නිදි. ඉක්මනට! වයසක උන්දෑ කොයි මොහොතෙ හරි ආපහු එන්න පුළුවන්.'

හොර රහසේම කොලොකාල්චිකොව් ගේ ගෙවත්තට රිංගාගත් තිමූර් ගසක් යට නතරව සියුරුහන් නාදයක් නැගීය. ඊට පිළිතුරු ලැබෙන තෙක් බලා නොසිටි ඔහු අසල වූ ගසකට නැග කාමරයට එබී බැලීය. තමන් රැඳී සිටි තැන සිට ඔහුට දැකිය හැකි වූ එකම දේ ජනේලය අසල වූ ඇඳක කෙලවර සහ පොරෝණාවකින් වැසුණ දෙපයක් පමණි.

ගසෙහි පොතු කැබැල්ලක් ඇඳට වීසි කළ ඔහු මෙසේ කෙඳිරීය:

'නික්, නැගිටපං, නැගිටපං බං.'

එහෙත් නින්දේ පසුවන්නා සෙලවුණේවත් නැති. එවිට තමන් අතවූ සාක්කු පිහිය ගත් තිමූර් දිග සිහින් අතු රිකිල්ලක් කපාගත්තේ එහි කෙලවරක් උල් කර එය ජනේලය තුළින් රිංගවීය. එහි කොණක පොරෝණාව පටලා ගත් ඔහු ගස්සා එය ඇද්දේය.

එවිට පොරෝණාව ජනේලය තුළින් ඇදී ආවේය. කාමරය තුළින් ගොරෝසු කෑගැමක හඬ මතුවිණි.

සිය පිජාමාවෙන් පමණක් සැරසී , නිදිබර දෑස් පිටට නෙරවාගෙන අළු පැහැ කොණ්ඩයකින් යුත් මහත්මයෙක් ඇඳෙන් පැන තමන් වෙතින් ඉවත ඇදී යන පොරෝණාව අල්ලා ගනිමින් ජනේලය කරා දිව ආවේය.

තමන් හදිසියේම මේ වැදගත් නාකි මහත්මයා හා මුහුණට මුහුණ ලා සිටින බව දුටු තිමූර් එහෙමම බිමට ඇද වැටුණේය.

මහළු මහත්මයා තමන් අතින් අල්ලාගත් පොරෝණාව එහෙමම ඇඳට වීසි කර බිත්තියෙහි එල්ලා ඇති සිය කානු දෙකේ තුවක්කුව ගෙන හනික උපැස් යුවලද පැළඳ ජනේලය තුළින් තුවක්කුව රිංගවා එහි කට අහසට යොමු කර දෑස් පියාගෙන වෙඩි තැබීය.

තිමූර් කෙතරම් බියපත්ව සිටියේදැයි කිවහොත් ලිඳ වෙත ලඟාවන තුරුම ඔහු දිවුම නතර කළේ නැති. මෙය සිදුවූයේ වැරදි අවබෝධයක් හේතුවෙනි. ඔහු නිදා ඉන්නා නික් යයි වරදවා වටහාගෙන තිබූ අතර අර මහළු මහත්මයාද ඔහු හොරකු සේ වරදවා වටහා ගෙන තිබිණි.

ඒ වෙලාවෙහි කිරිකාරිය තම වතුර බාල්දිද ගෙන ගේට්ටුව තුළින් යනු තිමූර් දිටීය.

ආකේසියා කොටයකට මුවා වූ ඔහු ඊළඟට කුමක් සිදුවන්නේදැයි බලනු පිණිස හරිබරි ගැහුණේය.

ලිඳ අසල සිට ආපසු ආ මහළු කාන්තාව අත වූ බාල්දිය ඔසවා එහි වූ ජලය පීප්පයට හැළුවාය. ඊළඟ මොහොතේදී ඇය වේගයෙන් පසෙකට පැන්නා ය. ඒ කට ළඟටම පිරී තිබූ පීප්පයෙන් වතුර ඇගේ ඇඟට වීසිවූ හෙයිනි.

මහත් සේ අන්දුන් කුන්දුන්ව හති ලමින් වටපිට බලමින් මහළු කාන්තාව සෑම පැත්තෙන්ම පීප්පය පරීක්ෂා කළාය. අනතුරුව සිය අත දමා ඇය වතුර ගෙන ඉඹ බැලුවාය. ඉන්පසුව හනික බරාඳය කරා ගිය ඇය දොරෙහි අගුළ නිසි ලෙස දමා තිබේදැයි බැලුවාය. අන්තිමේදී සිදුවූ දේ කුමක්දැයි වටහා ගත නොහැකි වූ ඇය යාබද නිවසෙහි දොරට තට්ටු කරන්නට වූවාය.

සිනහසෙන්නට ගත් තිමූර් සැඟව සිටි තැනින් එළියට ආවේය. ඔහු ඉක්මන් කල යුතු විණි. ඒ වන විටද ඉර නැගෙමින් පැවතිණි. තවමත් නික් පැමිණ නොසිටි අතර ඔවුන්ගේ සන්නිවේදන රැහැන් අළුත්වැඩියා කළ යුතුව තිබිණි.

ගෙවත්ත හරහා මඩුව කරා පියනගන අතරේ තිමූර් ගෙවත්ත කරා විවරව පැවති ජනේලයකින් ඇතුලට බැල්මක් හෙළීය.

පෝලෝ කමිසයකින් සහ කොට කලිසමකින් සැරසී සිටි ජෙනී ඇගේ ඇඳ අසල වූ මේසයක හිඳ මොනවාදෝ ලියමින් පසුවූවාය. ඇය වරින් වර මුහුනේ දැවටුන සිය කොණ්ඩය නොඉවසිල්ලෙන් පස්සට ගස්සා හැරියාය.

තිමූර් දුටු විට ජෙනී විමතිය හෝ බියක ලකුණක් පල කළේ නැති. ඇය කළ එකම දෙය ඔල්ගා අවදි නොකරන මෙන් ඔහුට ඉඟි කිරීමයි.

ඉන්පසු ලියා නිම නොවූ ලිපිය ලාච්චුවට දමූ ඇය පා ඇඟිලි තුඩින් කාමරයෙන් පිටතට ආවාය.

තමන්ගේ අසාර්ථක වීර ප්‍රයාණය ගැන තිමූර්ගෙන් විස්තර අසා දැනගත් විට ඇයට ඔල්ගාගේ සියළු උපදෙස් එහෙමම අමතකව ගියේ ඇය මහත් සතුටින් ඔහුට තමන් විසින් කඩා දමන ලද රැහැන් අළුත්වැඩියා කිරීමට උපකාර කිරීමට ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වූවාය.

එසේ සිය කාර්යය හමාර කළ පසුව තිමූර් පිටව යද්දී ජෙනී ඔහු ඇමතුවාය:

'ඇයි කියන්නනං මම දන්නෙ නෑ, හැබැයි මගේ අක්කට ඔයාව පේන්න බෑ.'

'එහෙමද වැඩේ.' ඉන් ඇවිස්සෙමින් තිමූර් කීවේය. 'මගෙ මාමත් ඒ වගේම තමයි. එයාටත් ඔයාව පේන්න බෑ.'

ඔහු පිටව යාමට සැරසුණද ඇය ඔහු නවතා ගත්තාය.

'මිනිත්තුවක් ඉන්න. ඔයා කොණ්ඩෙ පීරගත්තනං හොඳයි වගේ. අද උදේ ඉඳල ඔයාව පේන්නෙ කිසි පිලිවෙලක් නැති ගානට.'

ඇය තම පනාව අතට ගෙන එය තිමූර් හට දීමට සැරසෙන විටම ඔල්ගා ජනේලය අසල සිට කෝපයෙන් ඇයට කෑ ගා කතා කළාය.

'ජෙනී, ඔයා මොකද ඕතන කරන්නෙ?'

ඉන් මොහොතක් ගෙවෙද්දී සහෝදරියන් දෙදෙන සිටියේ ආලින්දයෙහි එකිනෙකා හට මුහුණ දීගත්වනමය.

'මං ඔයාට යාළුවන් තෝරල දෙන්න යන්නෙ නැනෙ.' ජෙනී අපේක්ෂා විරහිත අයුරින් තමාගේ පැත්තෙන් කරුණු කියන්නට වූවාය. 'මොන යාළුවොද? සාමාන්‍ය අය. ඔයාගෙ අක්ක කොයි තරං ලස්සනට වාදනය කරනවද! එයා එහෙමයි කියන්නෙ. ලස්සනට! එයා ඔයාට බණින හැටි අහන්නයි තිබ්බෙ. දන්නවද? මං මේ ඔක්කොම තාත්තට ලියල අරිනව.'

'ජෙනී, ඔය කොල්ල රස්තියාදුකාරයෙක්, ඔයා මෝඩ පැංචියෙක්.' තම කෝපය පාලනය කරගැනීමට සැරසෙමින් ඔල්ගා සැරෙන් කීවාය. 'කැමති නං තාත්තට ලියල අරින එකනෙ. හැබැයි ඔයා අර කොල්ල එක්ක ආයෙත් ඉන්නව මං දැක්කොත් හෙම අපි ඒ මොහොතෙම

මෙහෙන් පිටවෙලා මොස්කව් යනව. මං කිවුවොත් කිවුවා, ඔයා දන්නවනෙ, නේද?'

'ඔව් මං දන්නව ඒකාධිපතියො.' ජෙනී කඳුළු පිරි දෑසින් කීවාය. 'මං ඒක හොඳට දන්නව.'

'එහෙනං මෙන්න මේක කියවන එකයි.' ඕල්ගා කීවාය. ඒ සමග ඇය පෙරදා රාත්‍රියේ ලද විදුලි පණිවුඩය මේසය මත තබා පිටව ගියාය.

විදුලි පණිවුඩයෙන් කියවුණේ මෙයයි.

'යන අතර මග පැය කීපයකට මොස්කව් වල නතර වෙනව. දිනයයි වෙලාවයි පස්සෙ දන්වන්නං, තාත්තා.'

ජෙනී සිය දෑස් පිසදැමුවාය. විදුලි පණිවුඩය දෙතොලට තද කර මෙසේ මිමිණුවාය.

'අනේ ඉක්මනටම එන්න තාත්තෙ, ඔයාගෙ පුංචි ජෙනීට හරි කරදරයි තාත්තෙ.'

එළිච්චිය නැතිකර ගැනීම සම්බන්ධයෙන් පුංචි ඇනී හට දොස් පැවරූ මහළු කාන්තාවගේ නිවෙසට දර කරත්ත දෙකක් යවන ලද්දේය.

තමන්ට ලැබුණ දර තොගය ගොඩ ගසනා මේ අත්තම්මා ඔහේ ඒවා ගෙනවුත් බිම දැමූ නොසැලකිලිමත් රියදුරන්ට බැන වදිමින් පිඹින්නට කොඳුරන්නට වූවාය. ඒ ඇගේ වයසට නොගැලපෙන බර වැඩකි. වෙහෙස නිසාවෙන් තද කැස්සක් සැදුණ ඇය විවේකයක් ගැනීමේ අටියෙන් පඩිපෙලෙහි හිඳ ගත්තාය. ඉන්පසු පැලවලට වතුර දමනා පෝච්චියක් ගෙන එළවළු කොරටුව කරා ගාටන්නට වූවාය. ගෙවත්තෙහි ඉතිරි වූ එකම පුද්ගලයා වූයේ ඇනී ගේ තුන් හැවිරිදි මල්ලී පමණි. බෙහෙවින් උද්‍යෝගී පැංචකු වූ ඔහු අත්තම්මා නොපෙනී ගිය සැණින් කෝටුවක් ගෙන බංකුවක සහ උඩු යටිකුරු කර ලෙරලන ලද නාන බේසමක බලි අඳින්නට වීය.

මේ අතරේ අයාලේ ගිය එළිච්චිය - සමහර විට මේ එළිච්චිය අගලට එහා පඳුරු ගොමුවෙහිදී බෙංගාලි කොටියකුට හසුවුනා වන්නටත් බැරි නැත- සොයන්නට ගිය සීමා සිමාකොව් තම සගයකු වනපෙත අද්දර නවතා අනෙක් සිවුදෙනා සොයා ගෙවත්ත කරා දිව ආවේය.

ඔහු බාලම ළමයාගේ කටට වල් ස්ට්‍රෝබෙරි අහුරක් දමා අතට දිළිසෙන කාක් පිහාටුවක් දෙද්දී ඔහුගේ බලකාය මහත් වේගයෙන් දර ගොඩ ගසන්නට පටන් ගත්තෝය.

ඉන්පසුව සීමා සිමාකොව් අත්තම්මා එළවළු කොරටුවේ රඳවා ගැනීමේ අරමුණින් ගෙවත්තේ වැට අද්දරින් දිව ගියේය. චෙරි සහ ඇපල් ගස් ඉතා සමීපව වැවී තිබූ ස්ථානයකදී නතර වුණ ඔහු වැටෙහි සිදුරකින් එබී බැලීය.

එවිට ඔහු දුටුවේ අත්තම්මා ඒප්‍රණය පුරවා පිපිඤ්ඤා කඩාගෙන ආපසු එන්නට සූදානම් වන බවයි.

ඔහු හෙමිහිට වැටට තට්ටු කළේය. ඉන් අත්තම්මා තිගැස්සී ගියාය. ඉන්පසුව කෝටුවක් අතට ගත් සීමා සිමාකොව් ඉන් ඇපල් ගසක අතු සොලවන්න වූවේය. ඒ ඇසූ අත්තම්මා කවුරුන් හෝ හොරෙන් වැටෙන් පැන ඇපල් කඩන්නට සැරසෙන්නේ යයි සිතුවාය. තමන් කඩා ගත් පිපිඤ්ඤා එහෙමම බිම දමූ ඇය ලොකු කහඹිලියා අත්තක් කඩාගෙන වැට මායිමට ගොස් එහි සැඟවුණාය.

සීමා සිමාකොව් යළිත් වරක් සිදුර අතරින් එබී බැලුවද මෙවර නම් ඔහුට මහළු කාන්තාව දකගත නොහැකි විණි. ඉන් විස්සෝපයට පත් ඔහු උඩ පැන වැටෙහි එල්ලී ප්‍රවේශමෙන් එහි නගින්නට වීය.

ඒ අවස්ථාවේදී ජයග්‍රාහී හඬක් නගමින් සැඟව සිටි ස්ථානයෙන් ඉදිරියට පැන්න මහළු කාන්තාව සීමා ගේ අතට කහඹිලියා ඉත්තෙන් පහර දෙන්නට වූවාය.

ඒ වන විට සිය කාර්යය අවසන් කර සිටි අනෙක් කොල්ලෝ පිටතට දුවමින් සිටි ගේට්ටුව කරා සීමා කලබලයෙන් දැත් වනමින් පසුබැස්සේය.

යළිත් වරක් අර කුඩා දරුවා හැර අන් කිසිවෙක් නොමැතිව ගෙවත්ත පාළුවට ගියේය. ලී පතුරක් අතට ගත් ඔහු එය ලී ගොඩ අද්දර තබා බර්ච් පොත්තක් අදින්නට වූවේය. එළවළු කොරටුවේ සිට ආපසු එන අත්තම්මාට දක්නට ලැබුණේ එලෙස වැඩෙහි යෙදී ඉන්නා දරුවා ය. ඇය අයාගත් දෑසින් පිලිවෙලට ගොඩගසා ඇති දර තොගය දෙස බැලුවාය.

'මං මෙහෙ නැති අල්ලපනල්ලෙ කවුද මෙතන වැඩ කළේ?' ඇය ඇසුවාය.

එවිට තමන් ඇදගෙන ආ බර්ච් පොත්තද දර ගොඩට එක් කළ කුඩා දරුවා ජයග්‍රාහී විලාශයෙන් කතා කරන්නට විය. 'ඔයාට පේන්නැද්ද අත්තම්මෙ මේ මමනෙ ඒක කළේ.'

කිරිකාරියද ගෙවත්තට පැමිණියෙන් මේ මහළු කාන්තාවෝ දෙදෙන එකතුව වතුර පීප්පය සහ දරගොඩ ට සිදුව ඇති අමුතුම ජරමරය ගැන මහත් කැළඹීමෙන් කතා කරන්නට වූවෝය. ඔවුන් කුඩා දරුවාගෙන් හෝඩුවාවක් ගන්නට තැත් කළද ඉන් දැනගත හැකිවූයේ ඉතා සුළු විස්තරයක් පමණි. ඔහු කීවේ එක්වරම කිහිප දෙනෙක් ගෙවත්තට කඩා පැන තම කටේ වල් ස්ට්‍රෝබෙරි අහුරක් ඔබා පිහාටුවක්ද අතට දී තමන්ට කකුල් හතරක් සහ කන් දෙකක් ඇති හාවකුද අල්ලා දෙන බවට පොරොන්දු වූ වගයි. ඉන්පසු දර ගොඩ ඇසිරූ ඔවුහු පලා ගියෝය.

ඇනී ගෙවත්තට පැමිණියාය.

'ඇනී.' අත්තම්මා කතා කළාය. 'මේ දැන් ටිකකට කලින් අපේ වත්තට ආවෙ කවුද කියල දැක්කද?'

'නෑ, මං එළිච්චිව හොයන්න ගිහිල්ල හිටියනෙ.' ඇනී මුහුණ ඇඹුල් කරගෙන පිළිතුරු දුන්නාය. 'මං අද මුළු උදේම එළුවව හොය හොයා හිටියෙ.'

'උන් එළිච්චිව හොරකම් කරලා.' කිරිකාරිය වෙත හැරෙමින් අත්තම්මා වැලපුණාය. 'අනේ මොන තරං හොඳ එළිච්චියක්ද ඒකි. ඒකි එළිච්චියක් නෙවෙයි නියම කොබෙයියෙක්.'

'මරු කොබෙයියා!' සිය අත්තම්මා වෙතින් ඈතට ඇදෙමින් ඇනී නහයෙන් පිඹිනාය. 'ඌ අං දෙක දික් කරගෙන අහිත්ත පතිනකොට ආයෙ ගැලවෙන්න හම්බුවෙන්නෙ නෑ. කොබෙයියන්ට අං ඇත්තෙ නැනෙ.'

'ඇනී, කටවහගන්නයි කිවුවෙ. කිසිම කමකට නැති මෝඩ කෙල්ල!' අත්තම්මා කෑගෑවාය. 'ඒකි එහෙම ගාය නැති එකෙක් කියල මං කියන්නෙ නෑ. මට ඕන වුනේ ඒකිව විකුණන්න. අනේ මගෙ කොබෙයිය ඉගිලිලා ගිහින්.'

ඒ මොහොතේදී කිරි කිරි ගාමින් ගේට්ටුව ඇරී ගියේය. සිය අං යුවලින් පොලව පහුරු ගාමින් එළිච්චිය එහි පැනගෙන කෙලින්ම කිරිකාරිය වෙත දිවුවාය. වහාම තම බරැති කිරි පීප්පය ඒ යහපත් කාන්තාව කෙලින්ම තිවසේ ආලින්දයට පැනගත්තී ලතෝනියක් පිට

කළාය. ඇය පසුපස දිව ගිය එලිච්චිය බිත්තිය අද්දරටම ගොස් නතර වූවාය.

ඒ එලිච්චියගේ අං යුවලෙහි කිසියම් දැන්වීමක් අමුණා ඇති බව සැවොම දුටුවේ එවිටය.

මං එළිච්චියක්-බලාගෙනයි
තනි වචනේ එළිච්චියක්- පරිස්සමින්
ඇතිට තැලුවොත්
පලිගන්නෙමි මම

මේ අතරේ වැට කෙලවරට ඔබ්බෙන් මහත් සේ සතුටට පත් කොල්ලෝ හොඳ හැටි සිනාවෙන්නට වූවෝය.

පොළවෙහි කෝටුවක් සිටවූ සීමා සිමාකොව් වේගයෙන් නටමින් ඒ වටා යන අතරේ මහත් අභිමානයක් පාමින් ගායන්නා කරන්නට වූවේය.

නොම වෙමු අපි මැර කොල්ලෝ
නොම වෙමු අපි රස්තියාදුවෝ
ඇත අප හට හොඳ විනයක්
අපගේ වැඩ පිළිවෙලට කෙරෙත්
වෙමු අපි සැමදෙන තියමුවෝ
අපි සැමදෙන වෙමු තියමුවෝ

ඉන්පසු සියල්ලෝම සියොත් රැනක් මෙන් නිහඬව වේගයෙන් විසිර ගියෝය.

ඉටු කරන්නට තවත් වැඩ කන්දක් තිබුණද ඒ සියල්ලටම වඩා වැදගත් කාර්යය වී තිබුණේ මීශා කව්කින්හට අවසන් නිවේදනයක් ලැබෙන්නට සැලැස්වීමය.

එහෙත් එසේ අවසන් නිවේදනයක් සකසන්නේ කෙසේදැයි කිසිවකුටත අවබෝධයක් නොවී. එහෙයින් තිමූර් මේ ගැන සිය මාමාගෙන් විමසා සිටියේය.

සැම රටකටම මෙවන් නිවේදන සැකසීම සඳහා තමන්ගේම වූ පිළිවෙලක් තිබෙන බව පවසා සිටි මාමා කෙසේ වෙතත් එය

විනීතාකාරයෙන් කිරීම සඳහා අවසනට මෙවන් වදන් ඇතුලත් කිරීම හොඳයයි පවසා සිටියේය.

'ඇමතිතුමනි, කරුණාකර මගේ උපරිම ගෞරවය පිළිගනු මැනවි.'

මෙවදන් ඇතුලත් කළ පසුව අවසන් නිවේදනය නිලලත් තානාපතිවරයෙක් මාර්ගයෙන් සතුරු රටට භාරදිය යුත්තේය.

එහෙත් මේ වදන් නම් තිමූර්ට හෝ අනෙක් කොලු පිරිසගේ හිතට ඇල්ලුවේ නැති. සියල්ලම පළමුව මේ රස්තියාදුකාර කව්කින්හට කවරාකාරයේ හෝ ගෞරවයක් පිරිනැමීමට ඔවුන් තුළ කිසිදු අදහසක් තිබුණේ නැති. දෙවනුව කව්කින් හා නඩයට තානාපතිවරයෙක් තබා පිලිගත් දූතයෙක්වත් සිටියේ නැති.

මේ කරුණ ගැන දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඔවුහු සැපරෝශ්යෙ කොසාක්වරුන් තුර්කි සුල්තාන් හට යැවූ ආකාරයේ සරල අවසන් නිවේදනයක් කව්කින් හට යැවීමට තීරණය කළෝය. ඔවුහු කොසැක්වරුන් ඒ ලිපිය ලියනා ආකාර ගැන වූ සිතුවම් දැක තිබුණ සේම මේ නිර්භීත භාදයන් තුර්කින්ට, තතාරයන්ට සහ පෝලන්තයන්ට එරෙහිව සටන් කළ ආකාරය ගැන පොත පතින් කියවා සිටියෝය.

ඔල්ගා සහ ජෙනී වාසය කළ නිවස ඉදිරිපිට වූ නිවසෙහි සෙවණ පිරි ගෙවත්තේ කළු පැහැයෙන් මායිම් කරන ලද රතු තරුව සවි කරන ලද ගේට්ටුව පිටුපස පැහැපත් කොණ්ඩයක් හිමි කුඩා ගැහැණු ළමයෙක් බොරළු පාරක් දිගේ ගමන් කරමින් සිටියාය. ලස්සන, තරුණ කාන්තාවක් වූ ඇගේ මව වෙහෙසින් සහ දුක්බර පෙනුමින් යුතුව ජනේලය අසල පැද්දෙන පුටුවක හිඳ සිටියාය. ජනෙල් පඩිය මත වන මලින් සැදි විසල් මල් කළඹක් දක්නට ලැබුණේය.

ඇය ඉදිරියේ විවෘත කරන ලද ලිපි සහ විදුලි පණිවුඩ ගොන්නකි. ඒවා එවා තිබුණේ ඇගේ ඥාතීන්, මිතුරන්, දන්න හඳුනන්නන් සහ නාඳුන්නන් විසිනි. ඒ සෑම පණිවුඩයක්ම හද පිරි සොව පල කළේය. හරියට කොහේදැයි කිව නොහැකි එසේම කිසිදු දෙයක් ගැන පොරොන්දු නොවනා වනපෙතක් ඉතා දුර සිට දෝංකාරයන් මගින් වනපෙත හරහා යන සංචාරකයකු අමතන පරිද්දෙන් ඒ ලිපි මගින් ඇය අමතන බවකි. එසේම කෙසේවත් ඇය තනිවී නොමැති බවත් ඇය අසල බොහෝ අය සිටිනා බවත් පවසන බවකි.

පැහැපත් කොණ්ඩය හිමි ගැහැණු ළමයා තම අතවූ බෝනික්කියගේ කොණ්ඩ කරල් දෙක සහ දෑත බිම වදින සේ ඇය උඩු යටිකුරු කර හරවාගෙන ගේට්ටුව අසල නතර වූවාය. කාඩ්බෝඩ් කැබැල්ලක අඳින ලද හාවෙක් වැට මත්තේ වැනෙමින් සිටියේය. හාවාගේ මුහුනෙහි පෙනුමද විසුළු සහගතය තරමක් දුක්මුසුය. කුඩා බැලලයිකාවක් මෙන් හාවා සිය ගාත් වලින් ඉස්සී පැද්දෙමින් සිටියේය.

මේ ආශ්චර්යමත් දසුන දැකීමෙන්-ඇයට නම් ඒ ඉතා ආගන්තුක, සිතාගන්නවත් බැරිතරම් පුදුම සහගත දෙයකි- පිනා ගිය ගැහැණු ළමයා බෝනික්කිය එහෙමම බිම දමා වැට කරා දිව ගියාය. සතුටු වන්නටම බලා සිටින්නාක් මෙන් පෙණුන හාවාද කෙලින්ම ඇගේ දෑත මත පතිත වූවේය. ඒ සමග ජෙනීගේ සිනා පිරි මුහුණ වැට පිටුපසින් මතු විය.

කුඩා ගැහැනු ළමයා හිස නගා ජෙනී දෙස බැලුවාය.

'ඔයා මාත් එක්ක සෙල්ලම් කරන්න එනවද?' ඇය ඇසුවාය.

'නැතුව. මං ඔතනට පනිනවට ඔයා සතුටුද?'

'මෙතන කටු පඳුරු වගයක් තියෙනව.' මදක් කල්පනා කිරීමෙන් පසුව ගැහැනු ළමයා පිලිතුරු දුන්නාය. 'ඊයෙ මගෙ අතේත් කටුවක් ඇනුනා.'

'ඒකට බයවෙන්න එපා.' පහලට පනිමින් ජෙනී කීවාය. 'මං ඒවට බය නෑ. කෝ මට ඊයෙ ඔයාගෙ අතේ ඇනුන කටුව පෙන්නන්න. මේකද? කෝ පොඩ්ඩක් බලන්න. මං ඒක අරන් දාන්නං. ඊට පස්සෙ ඒක විසි කරල දාන්නං. මං ඒක කටුව බිමදාලා පාගල ඒකට කෙල ගහනව. හරිද? දූන් අපි සෙල්ලම් කරමු. ඔයා හාවව ගන්න. මං බෝනික්කිව ගන්නං.'

ජෙනි තම අසල්වැසියාගේ නිවෙසේ වැට අද්දර තාවර වන බව ආලින්දයේ සිටි ඔල්ගා දුටුවද ඇයට සිය නැගණියගේ වැඩ වලට මැදිහත් වීමට අවශ්‍ය වූයේ නැති. අද උදෑසන කඳුලු සැළු තරම හොඳටම ප්‍රමාණවත්ය. එහෙත් ජෙනී ඒ වැටට නැග අසල්වැසියාගේ වත්තට පනිනු දුටු විට නම් ඔල්ගා කලබල වන්නට වූවාය. වහා නිවසින් එළියට බට ඇය වැට කරා ගොස් ගේට්ටුව විවර කළාය.

ඒ වනවිට ජෙනී සහ අර කුඩා ගැහැනු ළමයා නිවසේ ජනේලය අසල කාන්තාවක් ලඟින් සිටගෙන සිටියෝය. ඇය තම දියණිය දුක්බර පෙනුමැති හාවා කෙතරම් ලස්සනට බැලලයිකාව වාදනය කරන්නේදැයි පෙන්වන අයුරු බලා සිනහ පෑවාය.

සිය හෝදරිය ගෙවත්තට ඇතුළුවනු දුටු අවස්ථාවේදී ජෙනී වෙතතින් පලවූ වියවුල් සහගත බැල්ම දුටු කාන්තාව ඔල්ගා පසුවන්නේ කේන්තියෙන් බව අනුමාන කළාය.

'කරුණාකරල එයා එක්ක අමනාප වෙන්න එපා.' ඇය සන්සුන් හඬින් ඔල්ගාට කීවාය. "එයා මගෙ කෙලි පැංචිත් එක්ක සෙල්ලම් කරනව. එච්චරයි. මේක අපිට මහ දුක්බර කාලයක්...." කාන්තාව නිහඬ වූවාය. 'මං ඇස් දියවෙනකං අඬල ඉන්නෙ. මෙයා...' සිය කුඩා දියණිය වෙත අත දිගු කළ ඇය පහත් කෙඳිරුම් ස්වරයෙන් කතා කළාය. 'මේ ළඟදි තමුන්ගෙ තාත්ත යුද පෙරමුණේ මැරුණ කියලවත් මෙයා දන්නෙ නෑ.'

දූන් නම් මේ ලැජ්ජාවීමට ඔල්ගාගේ අවස්ථාවයි. ඒ අතරේ ජෙනී මඳක් දුරින් සිට සිය අක්කණ්ඩිය දෙස දොස් පවරනසුළු බැල්මක් හෙළුවාය.

'අනික මං ඉන්නෙ තට්ට තනියම.' කාන්තාව කියාගෙන ගියාය. 'මගෙ අම්ම ඉන්නෙ හුඟ දුර. තයිගා වල. මගෙ සහෝදරයො හමුදාවෙ. මට සහෝදරියො නෑ.'

ජෙනී ගේ උර මත අතක් තැබූ කාන්තාව ඇයට ජනේලය පෙන්වූවාය.

'ඒයෙ රෑ අර අතන මල් පොකුරක් තිබ්බෙ ඔයාද?' ඇය ඇසුවාය.

'නෑ.' කල්පනා කරන්නට නොනැවතී ජෙනී පිළිතුරු දුන්නාය. 'ඒක කළෙ මම නෙවෙයි. මං හිතන්නෙ ඒක කළේ අර අපේ....'

'අපේ කවුද?' ඔල්ගා ජෙනී වෙත ප්‍රශ්නාර්ථය හඟවන බැල්මක් හෙළුවාය.

'මම දන්නෙ නෑ.' ජෙනී ඉන් බියපත් වූවාය. 'මම නං නෙවෙයි. මං ඒ ගැන කිසි දෙයක් දන්නෙ නෑ. අර බලන්න කවුද එනවා.'

නිවස ඉදිරිපිට නතර කරන ලද කාරයකින් ගුවන් හමුදා භටයෝ දෙදෙනෙක් බැස්සෝය. ගේට්ටුව විවර කළ ඔවුහු නිවෙස කරා වූ පාර දිගේ ඇවිදගෙන ආවෝය.

'එයාල එන්නෙ මාව බලන්න.' කාන්තාව කීවාය. 'මං ඇයි කියල දන්නව. එයාල මගෙන් අහන්න එන්නෙ මට වෙන තැනකට යන එක වැඩිය හොඳ නැද්ද කියලයි. එයාල අහන්නෙ මං ක්‍රිමියාවට හරි

කෝකසස් වලට හරි යන්න කැමති නැද්ද කියලයි. ඒ කියන්නෙ සෞඛ්‍ය නිකේතනයකට හරි නිවාඩු නිකේතනයකට හරි යන්න.'

සෙබළු දෙදෙනා ඇයට සිය ආචාරය පිරිනැමුවෝය. කපිතාන්වරයකු වූ ජ්‍යෙෂ්ට නිලධාරියා හට ඇගේ අවසන් වදන් ඇසුණා විය යුතුය. ඔහු ඇයට මෙසේ කියන්නට විණි.

'නෑ, අපි ආවෙ ඔයාට ක්‍රිමියාටවවත්, කොකේසියාවටවත්, සෞඛ්‍ය නිකේතනයකට වෙන එකක් තියා නිවාඩු නිකේතනයකටවත් යන්න කියන්න නෙවෙයි. ඔයා අම්මව බලන්න ඕනැය කියල කිවුව නේද? අන්න එයා ඔයාව බලන්න එනව. ඉර්කුට්ස්ක් වලින් එයා අද පිටත් වෙනව. විශේෂ ගුවන් යානයකින් එයාව ඉර්කුට්ස්ක් වලට එක්කගෙන ඇවිත්.'

'කවුද එයාව එක්ක ආවෙ?' මහත් සතුටින් ඔකඳව ගිය හඬකින් කාන්තාව කෑ ගැවාය. 'ඔයාලද?'

'නෑ.' කපිතාන්වරයා පිළිතුරු දුන්නේය. 'අපේ ඒ වගේම ඔයාගෙ සහෝදරයො.'

එහි දිව ආ කුඩා ගැහැනු ළමයා කිසිදු බියකින් තොරව අමුත්තන් දෙස බැලුවාය. ඇයට මේ නිල් පැහැති නිල ඇඳුම හොඳට හුරු බව ඉතා පැහැදිලිය.

'අම්මේ.' ඇය සිය මව ඇමතුවාය. 'මට ඔංචිල්ලාවක් බැඳල දෙන්නකො. එතකොට මට ජ්ක පදින්න පුළුවනි. හරියට තාත්ත වගේ මට ඈත, ඈතට යන්න පුළුවනි.'

'අනේ අනේ බෑ.' ඇගේ මව කෑ ගැවාය. ඇය සිය දියණිය වඩාගෙන ගතට තුරුළු කරගත්තාය. 'නෑ, නෑ, කවදාවත්ම එහෙම ඈතට යන්න එපා...... තාත්තා වගේ....'

දූඩි පෙනුමැති යටි රැවුල්කාර මහල්ලන් සහ හොඳින් රැවුල බා සිටි සුර දූතයන් නිරූපණය වන සිතුවමින් සැදි දේවස්ථානය පිටුපස, තෙල් පැසෙනා විසල් කල්දේරම් සහ එහෙ මෙහෙ දුවනා යක්ෂයන් සහිතව අඳින ලද අවසාන විනිශ්චය දින සිතුවමට දකුණට වන්නට, ඩේසි මලින් ගැවසී තණ බිමට ඔබ්බේ මාලේ ඔව්රාශ්නි වීදියෙහි කව්කින් සිය රංචුවද සමගින් කාඩ් ක්‍රීඩාවෙහි නිරතව සිටියේය.

තමන් අත මුදල් නොවූයෙන් ඔවුහු පරාජිතයාට දඬුවම් පමුණුවන ඔට්ටු වලට සෙල්ලම් කළෝය. ඒ අනුව පරාජිතයාගේ දෑස් බැඳ ඔහුට තණ බිස්සේ උඩුබැල්ලෙන් මලාක් මෙන් වැතිර සිටින්නට නියම කෙරිණි. ඉන්පසු ඔහුගේ අතට ඉටිපන්දමක් දෙනු ලැබිණි. ඒ දිගු කෝටුවකි. එසේ මියගිය පුද්ගලයා නැවත පනගන්වන්නට ඔහුගේ කරුණාවන්ත සහෝදරයන් ඔහු කෙරේ අනුකම්පාවෙන් ඔහුගේ බත්කෙණ්ඩාවලට ගසමින් යටි පතුල් කහඹිලියා වලින් පාරමින් දඟලද්දී ඔහුට අතැති කෝටුවෙන් ඔවුන් පලවා හැරීමට සිදුවිණි.

ඔවුන් එසේ සිය ක්‍රීඩාවෙහි උච්චස්ථානයට පැමිණ සිටින අවස්ථාවේදී වැටට එහා පැත්තේ සිට කන් සිදුරු කරවනසුළු නළා හඬක් මතුව ආවේය.

ඒ සමගම තිමූර් සහ පිරිවර ඔවුන් ඉදිරියේ පෙනී සිටියෝය.

නික් කොලොකොල්චිකොව් එනම් කණ්ඩායමේ ට්‍රම්පට්කරුවා සිය අතේ පිත්තල නළාවක් තබාගෙන සිටියදී නග්න දෙපතුලින් සිටි ගෙයිකා සැර මුහුණක් මවාගෙන එතුම් කරදාසියකින් සකසන ලද විසල් ලිපි කවරයක් අත තබාගෙන සිටියේය.

'මේ මොන සර්කස් එකක්ද මෙතන කරන්නෙ?' වැට මතින් එබෙමින් ඔවුන් තොම්මරයා යනුවෙන් හඳුන්වන ලද කොල්ලා ඇසීය. 'මීෂා!' ඔහු උර මතින් බලමින් කෑ ගැසේය. ඔය සෙල්ලම නවත්තනවා. මෙතන තමුසෙව මුණගැහෙන්න නියෝජිත කණ්ඩායමක් ඇවිත් ඉන්නවා.'

'මේ මං ඉන්නෙ!' වැට උඩින් එබෙමින් කව්කින්ද පිළිතුරු දුනි. 'හායි ගෙයිකා! ඔය තමුසෙ එක්ක ඉන්න පොකිරිස්සා කවුද?'

'මේ ලියුම ගන්නවා.' ගෙයිකා අවසන් නිවේදනය ඔහුට දුන්නේය. 'තමුසෙට කල්පනා කරන්න පැය විසිහතරක් තියෙනව. මං හෙට මේ වෙලාවටම තමුසෙගෙ උත්තරේ අරන් යන්න එනව.'

තමන්ට පොකිරිස්සා යනුවෙන් අපහාස කිරීම හේතුවෙන් කෝපයට පත්ව සිටි නික් කොලොකොල්චිකොව් සිය නළාව ඉහළට ඔසවා හකුපාඩා පුම්බා මහ හඬින් එය පිම්බේය. ඒ අනුව වැට දිගට මහත් උනන්දුවෙන් බලා සිටි කොලු නඩය ඉදිරියේ කණ්ඩායම් දෙක අභිමානවත් නිහැඩියාවකින් දෙපසට බෙදී ගියේය. 'මේ මොන උලව්වක්ද?' ලිපි කවරය අතගා බලමින් සහ කට බලියාගෙන ඉන්නා කොල්ලන් දෙස බලමින් කව්කින් ඇසීය. 'අපි මෙතන අපේ වැඩක්

බලාගෙන ඉන්නකොට මෙන්න අපිට එක එක තර්ජන දාන්න එනව. නළා පිඹිනව. නෑ යාළුවනේ මට නං මේකෙ අගමුල තේරෙන්නෙ නෑ.'

ඉන්පසු ලිපි කවරය ඉරා විවෘත කළ ඔහු වැට උඩ හිඳගෙන එය කියවන්නට වීය.

'අනෙක් මිනිසුන්ගේ ගෙවතු සුද්ද කරනා රංචුවේ නායක මිකායිල් කව්කින්,' 'ඒ මමනෙ.' ඔහු උස් හඬින් විස්තර කළේය. 'සම්පූර්ණ පට්ටමම දාල තියෙන්නෙ.' ' සහ ඔහුගේ' කව්කින් දිගටම කියවාගෙන ගියේය. 'විලි ලැජ්ජා නැති සහායක පීටර් ජ්‍යාතකොව් නැතහොත් නොම්මරයා-ඒ කියන්නෙ තමුසෙනෙ.' ඔහු මහත් තෘප්තියෙන් නොම්මරයාට පැහැදිලි කළේය. 'තියමෙට තියෙනව. විලි ලැජ්ජා නැති- මාර පට්ටමක්නෙ උන් තමුසෙට දීල තියෙන්නෙ. මේ මෝඩයට දාන්න උන්ට ඔයිට වඩා සරල පට්ටමක් තිබ්බෙ නැද්ද හැබෑට? -එසේම මේ කුප්‍රකට කණ්ඩායමේ අනෙක් සියළු සාමාජිකයන් හට කෙරෙන -අවසාන නිවේදනයයි. ඒක නං මොකක්ද කියන්න මට තේරෙන්නෙ නෑ.' කව්කින් උපහාසාත්මකව කීවේය. 'ඒක නං හරියට බණින්න පාවිච්චි කරන වචනයක්ද කොහෙද.'

'ඒක ජාත්‍යන්තර වචනයක්. ඒකෙ තේරුම උන් අපිට බැටේ දෙන්න යනව කියන එකයි.' කොණ්ඩය කොටට කපා සිටි ඇලෙක්ස් නමින් යුත් කොලුවා කීවේය. ඔහු සිටියේ නොම්මරයා අසලම හිඳගෙනය.

'එහෙනං ඇයි උන් කෙලින්ම ඒක නොකියන්නෙ?' කව්කින් ඇසීය. 'ඔන්න අපි පලවෙනි වගන්තිය කියවන්න හදන්නෙ.'

'අප විසින් සවි කරන ලද සංඥා-එනම් රතු තරුව සහ මියගිය විරුවකු ඉන්නා බව ඇඟවෙන කළු පැහැ වාටිය සහිත රතු තරුව- නොතකා නුඹලා සාමකාමී පදිංචිකරුවන්ගේ ගෙවතු කරා රාත්‍රී කඩාවැදීම් සිදු කරන බව සලකා බැලූ අපි නුඹලා එනම් බියගුළු තක්කඩින් හට......'

'උඹලට මේක අල්ල ගන්න පුළුවන්ද? නිකමට අහපල්ලකො උන් බණින තාලෙ.... පර බල්ලො!' බලයෙන් මුවගට නගා ගත් සිනහවක් සහිතව කව්කින් කියාගෙන යන්නට වීය.

'මෙසේ නියෝග කර සිටිමු. මිහායිල් කව්කින් නම් වන නුඹ තම අපකීර්තිමත් ගජයා වන නොම්මරයාද සමගින් තමන්ගේ කැත රංචුවේ නම් ලැයිස්තුවක්ද රැගෙන අපගේ පණිවුඩකරුවා දන්වන ස්ථානයකට හෙට උදෑසන නොඉක්මවා පැමිණිය යුතු බවට නියෝග කරමු.'

'මේ නියෝගය පැහැර හරින්නේ නම් අපට අපගේ මනාපය පරිදි ඉදිරි පියවර ගැනීමට අපට නිදහස ඇතැයි අපි කල්පනා කරමු.'

'උන් ඔය නිදහස කියන එකෙන් කියන්නෙ මොකක්ද?' කව්කින් කල්පනා කරන්නට වීය. 'අපි උන්ව කොහේවත් හිර කළේ නෑනේ.'

'ඒකත් ඔය තවත් ජාත්‍යන්තර වචනයක්. ඒකෙ තේරුම උන් අපිට වැඩක් දෙන්න යනව කියන එකයි.' කොණ්ඩය කොටට කැපූ ඇලෙක්ස් යළිත් තේරුම් කළේය.

'එහෙනං ඇයි උන් ඒක කෙලින් නොකියන්නෙ?' කව්කින් නොරිස්සුමෙන් කීවේය. 'ගෙයිකගෙ පැවැත්ම අන්තිම නරකයි. හුග කාලෙකින් මිනිහ අඬල නැති පාටයි.'

'මිනිහ අඬන්නෙ නෑ.' ඇලෙක්ස් කිවේය. 'මිනිහගෙ අයිය නැවියෙක්.'

'ඉතිං අපිට මොකද.'

'මිනිහගෙ තාත්තත් නැවියෙක්. ඒ හන්ද මිනිහ අඬන්නෙ නෑ.'

'උඹට ඒකෙන් ඇති වැඩේ මොකක්ද?'

'මගෙ මාමත් නැවියෙක්.'

'ඔය කෙහෙල්මල නවත්තපං.' කව්කින් බැණවැදුණේය. 'තාත්ත, අයිය, මාම, මොකක්ද මේකෙ තේරුම? උඹ කොණ්ඩෙ වැවුවනං හොඳයි ඇලෙක්ස්. පේන්නෙ හරියට උඹව අච්චිට පිච්චිලා වගේ. උඹ ඔය මොනවද කොඳුරන්නෙ?' ඉන්පසු ඔහු නොම්මරයා වෙත හැරුනේය.

'අපි හෙට මේ පණිවුඩකාරයන්ව අල්ලගෙන ඔය තිමූරයටයි උගෙ නඩේටයි හොඳ පාඩමක් උගන්නන්න ඕනැ.' අවසාන නිවේදනයෙන් හිත රිදුණ නොම්මරයා බුම්මාගෙන කීවේය.

එසේ ඔවුහු විසිර ගියෝය.

දේවස්ථානයෙහි සෙවණට ගිය පසුව ලොක්කා සහ ඔහුගේ සගයෝ මහා බලවත්, යක්ෂයන් පව්කාරයන්ව සදා පැහෙනා නිරයට ඇදගෙන යන ආකාරය නිරූපණය කර ඇති සිතුවම ඉදිරිපිට නතර වූවෝය. එහිදී කව්කින් නොම්මරයා ඇමතීය.

'මේ බලපන්, උඹ අර පුංචි කෙල්ල ඉන්න වත්තට පැනල තියේද? මං අහන්නෙ අර තාත්තා මැරිච්ච ගෙදර?'

'අන්න හරි, ඇයි මොකද?'

'උඹ දන්නවනෙ, ඒක මෙහෙමයි.' කව්කින් සිතුවමට ඇඟිල්ලෙන් අනිමින් නුරුස්නා ලෙස මිමිණීය. 'මං ඔය තිමූරයගෙ සංඥාවල් පඩේකට මායි කරන්නෙ නෑ. මට දවසක ඕකව කීතු කරන්න පුළුවනි....'

'හරි.' නොම්මරයා එකඟ විය. 'දැන් උඹ මොන එහෙකටද ඔය විත්තරේ ඉන්න යක්කුන්ට ඇඟිල්ලෙන් අනින්නෙ?'

'මෙන්න මේක හින්ද.' කව්කින් කපටි විරිත්තීමක් පාමින කීවේය. 'උඹ මගෙ යාළුවෙක් වුනත් නොම්මරයො, උඹ මනුස්සයෙක් නෙවෙයි. උඹත් ඇවිල්ල මේ ඉන්න කැත, මහත යක්ෂයෙක් වගේම තමයි.'

උදෑසන කිරිකාරිය කිරි බෙදන්නට පැමිණෙන වට් ඇගේ පුරුදු ගණුදෙනුකරුවන්ගෙන් තිදෙනකු නිවසේ සිටියේ නැති. එවිට කිරිද රැගෙන වෙළඳපලට යාමට පමා වැඩි හෙයින් ඇය කිරි භාජනයද කර තබාගෙන ගෙවල් ගානේ යන්නට පටන් ගත්තාය.

එසේ කිසිදු වාසියක් නැතිව ගෙයක් ගෙයක් ගානෙ කරක්ගැසීමෙන් පසුව ඇය අන්තිමේදී විවේක ගැනීම සඳහා තිමූර්ගේ නිවෙස අසල නතර වූවාය.

ඇයට ගෙවත්තෙන් ගැඹුරු, මිහිරි ගැයුමක හඬ ඇසෙන්නට විය. එහි අරුත නිවෙසේ අය සිටින බවකි. සමහර විට ඇයට කිරි ටිකක් විකුණාගැනීමට වාසනාව තිබෙන්නට පුළුවන.

ගේට්ටුව තුළින් ගෙවත්තට පිවිසෙද්දී මේ මහළු කාන්තාව මෙසේ කෑ ගැවාය.

'කිරි, කිරි.... කිරි ගන්නෙ කවුද?'

'බෝතල් දෙකක් දෙන්න.' ගොරෝසු හඬකින් ඊට ප්‍රතිචාර දැක්විණි.

සිය කිරි භාජනය බිමට පහත් කරමින් හැරී බැලූ කිරිකාරිය කෙස්ස සුදුවුණු, ඉරුණු ඇඳුමින් සැරසුණු මහළු මිනිසෙක් කොරගසමින් සහ කඩුවක් වනමින් පඳුරක් පිටුපසින් මතුවනු දුටුවාය.

'සර්, මං ඇහුවෙ කිරි ඕනැද කියලයි.' තැතිගැන්මෙන් පසෙකට පනිමින් කාන්තාව ඇසුවාය. 'මගෙ දෙයියනේ ඔහේගේ පෙනුමෙ

තියෙන බයංකාරකම විතරක්! ඔහේ මොන එහෙකටද ඔය කඩුව පාවිච්චි කරන්නෙ? තණකොළ කපන්නද?'

'බෝතල් දෙකක්. අන්න මේසෙ උඩ ජෝගුව තියෙනව.' කෙටියෙන් එසේ පිළිතුරු දුන් මහළු මිනිසා සිය කඩුවේ තුඩ පොලවට බර කළේය.

'ඔහේ දැකැත්තක් ගත්තනං හොඳයි මහත්තයා.' කඩිමුඩියේ කිරි ටික ජෝගුවට වත් කරමින් ඒ අතර මහළු මිනිසා දෙස බියමුසු බැලුම් හෙලමින් කිරිකාරිය කීවාය. 'ඊට පස්සෙ ඔය කඩුව වීසිකරල දාන එකයි. ඔය වගේ කඩුව වනල ඔහේ කවුරු හරි අසරණයෙක්ව මැරෙන්න බය කරයි.'

'ගාන කීයද?' සිය බාච්චු කලිසමෙහි සාක්කුවට අත දමමින් මහළු මිනිසා විමසා සිටියේය.

'වෙනද ගානම තමයි.' කිරිකාරිය පිළිතුරු දුන්නාය. 'ලීටරයට දෙසිය අසූවයි. මං වැඩියෙ ඉල්ලන්නෙ නෑ.'

සිය සාක්කුව අවුස්සා බැලූ මහළු මිනිසා ඉන් විශාල අබලන් රිවෝල්වරයක් පිටුට ඇද්දේය.

'අපෝ, පස්සෙ ගෙවුවත් කමක් නෑ.' සිය බඳුන ඩැහැ ගනිමින් පැකිලෙමින් කී කිරිකාරිය වහා පිටවන්නට මානබැලුවාය. අනේ තිකං කරදර වෙන්න එපා අයියෝ.' සිය උර මතින් ආපසු හැරී බලමින් දුවන්නාක් මෙන් ඇය ගේට්ටුව කරා ඇදුණාය. 'සල්ලි පස්සෙ ගන්න පුළුවන්.'

වහා ගේට්ටුවෙන් පිටට පැනගත් ඇය ගේට්ටුව වසා එහා පැත්තේ හිඳ කේන්තියෙන් කෑ ගැවාය.

'නාකි යක්ෂය, තමුසෙව කම්මුතු කරන්නයි වටින්නෙ. මෙහෙම ඉබාගාතෙ යන්න දෙන්න හොඳ නෑ. ඇත්ත. ඇත්ත. තමුසෙට හරි යන්නෙ හිරගෙදර තමයි.'

දෙවුර හැකිළූ මහළු මිනිසා තමන් කල් තියා සූදානම් කරගෙන සිටි රූබල් තුනේ නෝට්ටුව සාක්කුවට දමාගෙන රිවොල්වරයද සිය සිරුර පිටුපසට කරගත්තේය. ඒ වෛද්‍ය කොලොකොල්චිකොව් එනම් වියපත් මහතා ගෙවත්තට ඇතුළු වෙමින් සිටි හෙයිනි.

සිය සැරයටියට වාරු වෙමින් ඒ මහතා ඉතා අවධානී විලාශයෙන් බොරළු පාර දිගේ ඉදිරියට ඇදුණේය. විකාර පෙනුමැති මහළු මිනිසා දුටු

විට කැස්සක් පිට කළ වෛද්‍යවරයා සිය උපැස් යුවලද හරි ගස්වාගෙන මෙසේ ඇසීය.

'යහපත් මනුස්සයෝ, මේ ගෙදර අයිතිකාරයව මුණගැහෙන්නෙ කොහොමද කියල මට කියන්න පුළුවන්ද?'

'මමම තමයි මේ ගෙදර ඉන්නෙ.' මහළු මිනිසා පිළිතුරු දුන්නේය.

'එහෙමනං...' තම පිදුරු තොප්පියට තට්ටුවක් දමමින් වෛද්‍යවරයා කියන්නට විණි. 'අර තිමූර් ගරායෙව් කියන ඉලන්දාරිය තමුන්ගේ ඥාති පුත්තරයෙක්ද කියල මට කියනවද?'

'එහෙම තමයි. ඔය කියන ඉලන්දාරිය මගෙ බෑනා නෙවැ.'

'එහෙමනං මට මෙන්න මේක ඔහෙට කියන්න වීම ගැන හරිම වේදනයි.' මහළු මිනිසා විසින් අතහැර දමන ලද තැනම තවමත් තිබූ කඩුව දෙස බියෙන් මෙන් බලමින් සිය උගුර පාදාගත් වෛද්‍යවරයා කතාව පටන් ගති. 'මේ ඊයෙ උදේ ඔහේගෙ බෑන පොඩ්ඩ මගෙ ගෙදර කොල්ලකන්න හැදුව.'

'මොකක්? මගෙ තිමූර් ඔහෙගෙ ගෙදර මංකොල්කන්න හැදුවා?'

'නැතුව, ටිකක් හිතල බලන්නකො.' මහළු මිනිසා සිය සිරුර පිටුපසට කර සඟවන්නට තැත් දරන්නේ කුමක්දැයි බලන්නට තැත් දරමින් සහ කැළඹීමට පත්වෙමින් වියපත් මහතා කතාකරගෙන ගියේය. 'මං නිදා ඉඳිද්දි මිනිහ මගෙ ෆ්ලැනල් පොරෝණාව හොරකම් කරන්න හැදුව.'

'කවුරු? තිමූර්? ඔහෙගෙ පොරෝනාව උස්සන්න හැදුව්?' මහළු මිනිසා එහෙමපිටින්ම අවුල්ව ගිය සැටියකි. රිවෝල්වරය සඟවාගෙන සිටි අත එක්වරම ඔහුගේ සිරුර පැත්තෙන් එල්ලා වැටුණි.

දූන්නම් වියපත් මහතා පැහැදිලිවම බියපත් විය. තමන්ගේ අභිමානය හැකි උපරිමයෙන් රැක ගනිමින් වහ වහා ගේට්ටුව කරා ඇදුණ ඔහු සනසනසුළු ස්වරයෙන් කතා කරන්නට විය.

'මං ඒක සහතික ඇත්ත කියල දිවුරන්නං- ඒත් කාරණාව..... කාරණාව.... මගෙ ආදරණීය මහත්තයා! මං මේ ඉල්ලා හිටින්නෙ කරුණාකරල ලඟට එන්නනං එපා. මගෙ හිතේ කිසිම අදහසක් නෑ.... ඒත් ඔහෙගෙ මේ අමුතු පෙනුම.... හැසිරීම....'

'මෙහෙ බැලුවනං.' වෛද්‍යවරයා වෙත ඇදෙමින් මහළු මිනිසා විධානය කළේය. 'අනිවාර්යයෙන්ම මෙතන මොකක්ම හරි වැරදි අවබෝධයක් වෙලා තියෙනව.'

'මගෙ හොඳ මහත්තයෝ!' දිගටම පසුබසිනා අතර රිවෝල්වරය දෙස මෝහනයවූවාක් වැනි බැල්මක හෙලමින් වියපත් මහතා බෙරිහන් දුන්නේය. 'අපේ මේ සංවාදෙ නරක තැනකටයි යන්නෙ. මං කියන්නෙ අපේ වයස් ගැන හිතලයි. මේ කතාව යන්නෙ බොහොම නරක තැනකට.'

වහා ගේට්ටුවෙන් පිටට පැනගත් ඔහු මෙසේ නැවත නැවත කියමින් යන්නටගියේය.

'නෑ,නෑ, අන්තිම නරක තැනකට. අන්තිම කැත තැනකට.'

මහළු මිනිසා ගේට්ටුව කරා ළඟා වූයේ නදියෙහි පිහිනීම සඳහා යමින් සිටි ඔල්ගා බියෙන් පලා යමින් සිටි මහතා හා මුහුණට මුහුණ ලා සිටි අවස්ථාවේදීය.

හදිසියේම මහළු මිනිසා අත් දෙකම වනමින් ඔල්ගා හට නවතින්නයි කෑගැවේය. ඒ සමගම එළුවකුගේ බඳු ජවසම්පන්න බවකින් කානුව මතින් පිනූ වියපත් මහතා ඔල්ගාගේ අත ඩැහැගත්තේ එක් නිමේෂයක් තුළ දෙදෙනාම වීදි කොණෙන් අතුරුදන් වූවෝය.

මහළු මිනිසා මහ හඬින් සිනහවෙන්නට ගති. පැහැදිලිවම තමන් ගැනම මහත් ප්‍රමෝදයට පත් ඔහු සිය බොරු කකුල අද්දමින් ගයන්නට විය.

පොලවට ඉහලින් ඉගිලෙන
ඔබ කවදාවත් නොදනී
බලාඉන්නවදූයි කියා
මොන තරමක් කල් අප සැම
ඔබේ ගුවන් යානය ගැන

ඉන්පසු ඔහු තම දණහිසෙහි බැඳ තිබූ පටිය ලිහා දැමීය. ඒ සමගම බොරු කකුල තණ බිස්ස මත ඇද වැටිණි. සිය බොරු කොණ්ඩයද ගලවා දැමූ ඔහු වහා නිවෙස තුළට දිව ගියේය.

ඉන් මිනිත්තු දහයකට පසුව තරුණ එමෙන්ම සතුටින් පිරි ඉංජිනේරු ජෝර්ජ් ගරායෙච් පියගැටපෙල දිගේ පහලට දිව ආවේ මඩුවෙන් සිය

යතුරු පැදිය ගෙන රීගා නම් බැල්ලට අඬගසා ඇයට නිවෙස බලාගැනීමේ කාර්යය පවරා යතුරු පැදිය පණගන්වා, බියපත්ව පලා ගිය ඔල්ගා සොයා නදිය කරා වේගයෙන් ඇදෙන්නට වූවේය.

පෙරවරු එකොළහට ගෙයිකා සහ තික් තම අවසන් නිවේදනයට පිලිතුරු අපේක්ෂාවෙන් මගට බැස්සෝය.

'කෙලින්ම යමු.' ගෙයිකා තික් හට ගෙරවීය. 'තමුසෙ බොහොම සැහැල්ලු ඒ වගේම විශ්වාසෙන් ඇවිදින්න ඕනැ. ඒ වුණාට තමුසෙ යන්නෙ හරියට පණුවෙක් අහුලගෙන කන්න යන කිකිළියෙක් වගේනෙ. තමුසෙගෙ අනෙක් හැමදේම හොඳයි. කලිසම, කමිසෙ හැමදේම. ඒ වුණාට තමුසෙ කිසි වැදගැම්මක් නෑ කියලයි පේන්නෙ. මං කියනවට තරහ ගන්න එපා. මං මේ තමුසෙට හොඳක් කියන්නෙ. දැන් ඔය ඇවිදින ගමන් තොලකට ලෙවකන්නෙ මොන එහෙකටද? වහාම ඔය දිව කට ඇතුලට දාගෙන ඒකට නියම තැන තියෙන්න අරිනව. ආ, තමුසෙ මෙතන මොකද කරන්නෙ?' හදිසියේම සිය මගට පිලිපන් සිමා සිමාකොව් ගෙන් ගෙයිකා ඇසීය.

'තිමූර් මටත් මේකට සම්බන්ධ වෙන්න කිවුව.' සිමාකොව් කරකර ගැවේය. 'ඒ ගැන තමුසෙල මොකුත් දනගෙන නොහිටියට කාරියක් නෑ. තමුසෙලට තමුසෙලගෙ රාජකාරිය පැවරිල තියෙනව. මට මගෙ එක තියෙනව. තික්, කෝ මට තමුසෙගෙ නළාව පිඹින්න දෙනව. එක පාරකට විතරක්. කොල්ලො අද තමුසෙ මහ වැදගත් පාටයිනෙ. ගෙයිකා අනේ උඹ පිස්සු හුටං. යකෝ මේ වගේ මෙහෙයුමකට යද්දි අඩුම ගානෙ බූට් ජෝඩුවක් හරි සපත්තු ජෝඩුවක් හරි දාගන්න එපායැ. කකුලට මොකුත් නොදා යන තානාපතියෙක්ව කවද හරි දැකල තියේද? හොඳයි හොඳයි-තමුසෙ ඔය විදිහට යනව. මං මගෙ විදිහට යන්නං. අපි බලමුකො.'

'මොන පිස්සු විකාරයක්ද.' ගෙයිකා හිස සැලීය. 'වචන තුන හතරකින් කියන්න පුළුවන් දේට වචන සිය ගානක් නාස්ති කරනව. නළාකරුව, තම නළාව හඬවනු. අපි වැට ළඟට ඇවිත්.'

'වහාම මිකායිල් කව්කින් මෙහි කැටුව එනු.' වැට මතින් එබී බැලූ කොලුවාට ගෙයිකා විධාන කළේය.

'කරුණාකරල දකුණු පැත්තෙන් එන්න. එතකොට ඔහෙල පිලිග න්න ගේට්ටුව ඇරල තියෙන හැටි පෙනෙයි.' කව්කින් අනෙක් පැත්තේ හිඳ පැවසීය.

'අපි නොගිහින් ඉමු.' ගෙයිකාගේ අතින් අදිමින් තික් කෙඳිරීය. 'උන් අපිට ගහයි.'

'තමුසෙ කියන්නෙ උන් ඔක්කොම අපිට විරුද්ධය කියලද?' ගෙයිකා උපහාසාත්මකව කීවේය. 'තික් නළාව පිඹපං. හයියෙන්! අපි කතාකරගත්තු තැනට යනව, එච්චරයි.'

මළකඩ කෑ යකඩ ගේට්ටුව තුළින් පිවිසුණු ඔවුහු තමන් කොලු රංචුවකට මුහුණ ලා සිටින බව දුටුවෝය. එහි ඉදිරිපෙළම සිටියේ නොම්මරයා සහ කච්කින්ය.

'අපේ නිවේදනයට දෙන උත්තරේ එහෙනං දෙන එකයි.' ගෙයිකා ස්ථිරසාර හඬින් කියා සිටියේය.

කච්කින් සිටියේ මදහස පාමිනි. නොම්මරයා සිටියේ ඔරවමිනි.

'අපි මේක කතා කරල බේරුමක් කරගමු.' කච්කින් පැවසීය. 'මොකද ඔය තරං කලබල, ටිකක් වාඩි වෙලා කතා කරමු.'

'අපේ ලියුමට උත්තරේ දෙන එකයි.' ගෙයිකා සැරෙන් අවධාරනය කළේය. 'ඊට පස්සෙ කතා පුළුවනි.'

දුර්වලසේ පෙනුන මැලවුන නළාකරුවා තමන් පසෙකින් තබාගෙන නග්න දෙපතුලින්, සිය දෑස් හොඳටම සිහින් කරගෙන, නාවුක ඇඳුමින් සරසී ඉන්නා සෘජු, ශක්තිමත් සිරුරින් යුත් ඔහු මේ බොරුවට කතා කරන්නේද නැතිනම් යුක්තියේ බලය තමන්ගේ පැත්තේය යන් විශ්වාසයෙන් යුතුව ඇත්තටම ඔහු මෙහි සිටගෙන හිඳිමින් සැබෑ ලෙසම පිළිතුරක් ඉල්ලා සිටින්නේද යන් කීම අසීරුය.

'එහෙනං මෙන්න ගන්න එකයි.' කච්කින් ඔහු අතට සටහනක් දෙමින් කීවේය.

ගෙයිකා ඒ කරදාසිය දිගහැරියේය. ඔහු ඒ කරදාසිය මත දුටුවේ කැත වචනයක් සහිතව නාසයට තබා සිටිනා මහපටැඟිල්ලක තුරුටු බලියකි.

ගෙයිකා සන්සුන් ඉරියව්වෙන් ඒ කරදාසිය දෙකට ඉරා දැමීය. ඔහුගේ මුහුණේ මස් පිඩුවකුදු සැළුණේ නැති. හරියටම ඒ මොහොතේදී කොල්ලන් දෙදෙනා අත් කිහිපයක ග්‍රහණයට කොටු විණි.

එහෙත් ඔවුහු ඊට විරෝධය පල කළේ නැති.

'මේ වගේ අවසන් නිවේදනයක් ගෙනාවට උඹලගෙ මූණ පොඩි කරන්නයි වටින්නෙ.' ගෙයිකා කරා එමින් කච්කින් කීවේය. 'ඒත් අපි එච්චර තදට උඹලට සලකන්නෙ නෑ. අපි අද රෑ වෙනකම්ම උඹලව මෙහෙ හිර කරල තියනව.' ඔහු එසේ කියමින් දේවස්ථානය පෙන්වීය. 'අපි ඒ වගේම අද රෑ අංක 24 ගෙවත්ත සුද්ද කරනව.'

'නෑ, උඹලට එහෙම කරන්න ලැබෙන්නෙ නෑ.' ගෙයිකා නොසැලී පිලිතුරු දුන්නේය.

'බලපල්ලකො, අපි ඒක කරනව.' ගෙයිකාගේ මුහුණට පහරක් දෙමින් නොම්මරයා කෑගැවේය.

'උඹලට ඔහොම මට සිය පාරක් වුනත් ගහන්න පුළුවනි.' ගෙයිකා කීවේය. සිය දෑස් තදින් පියාගත් ඔහු නැවත ඒවා විවර කළේය. 'නික්.' ඔහු ධෛර්යසම්පන්න හඬින් කතා කළේය. 'ඔළුව කෙලින් තියාගෙන ඉන්නව. අද පොදු රැස්වීම්වලට කැඳවන අංක එක සංඥාව දේවි කියල මට හිතෙනව.'

ඉන්පසුව අත්අඩංගුවට පත් දෙදෙනා වසන ලද යකඩ ජනෙල්වලින් යුතු කුඩා දේවස්ථානය කරා රැගෙන යනු ලැබීය. දොරවල් දෙකම වසා දමන ලද අතර පිටතින් ඊට පොලුද සවි කරන ලදී.

'ඉතිං.' අත්දොක පොකුටු කර මුවට ලං කර නොම්මරයා කෑ ගෑවේය. 'දැන් කොහොමද වැඩේ, දිනුවෙ උඹලද අපිද?'

ඇතුලින් ආවේ ඇහෙන නෑහෙන තරමේ ගැඹුරු හඬකි.

'නෑ, මොට්ටයො උඹල දැනගනිල්ල, මෙයින් පස්සෙ කිසිම දෙයක් උඹලගෙ වාසියට වෙන්නෙ නෑ.'

නොම්මරයා පිලිකුලින් කෙල ගැසීය.

'උගෙ අයියා නැවියෙක්.' කොණ්ඩය කොටට කපා සිටි ඇලෙක්ස් මුඩුම ලෙස කීවේය. 'උගෙ අයියයි මගෙ මාමායි එක නැවේ වැඩ කළා.'

'ඉතිං මොකද බං?' නොම්මරයා තර්ජනාත්මක හඬින් ඇසීය. 'උඹ කවුද කපිතාන්ද?'

'උඹ මිතිහට ගැහුවෙ මිතිහට මොකුත් කරගන්න බැරි තාලෙට අල්ලං ඉඳිද්දි. ඒක සාධාරණද?'

'හිටපං මං උඹටත් පාරක් දෙන්න.' ගුගුරා හැළුණ නොම්මරයා ඇලෙක්ස් වෙත අත දිගු කළේය.

එකිනෙකා බදා ගත් කොල්ලෝ දෙදෙන තණ බිස්ස මත පොදියට පෙරලී ගියෝය. අනෙක් පිරිස ඔවුන්ගේ දෑත් සහ දෙපයින් අල්ලා අදිමින් ඔවුන් වෙන් කිරීමට තැත් දැරුවෝය.

එහෙත් වැට අද්දරින්ම වාගේ වූ දෙහි ගසක ගනට වැවුණු කොළ අතරින් සීමා සිමාකොව්ගේ හිස එක් නිමේෂයකට මතුවනු මේ කවුරුත් දුටුවේ නැති.

හෙම්හිට ගෙවත්තට බට සීමා එළවළු පාත්ති අතරින් තිමූර් සහ අනෙක් කොලු රැළ පිහිනමින් සිටි නදිය කරා පිම්මේ දිව ගියේය.

සිය හිස තුවායකින් ආවරණය කරගත් ඔල්ගා උණුසුම් ඉවුරෙහි වැලි මත දිගාවී පොතක් කියවමින් සිටියාය.

ජෙනී සිටියා පිහිනමිනි. හදිසියේම ඇගේ පිටුපසින් ආ යමෙක් ඇය බදා ගති.

ඇය වහා හැරී බැලුවාය.

'හලෝ.' උස් සිරුරින් සහ කළුවන් දෑසින් යුත් කෙල්ලක ඇය ඇමතුවාය. 'මාව එවුවෙ තිමූර්, මගෙ නම ටාතියා. මමත් ඉන්නෙ එයාගෙම කණ්ඩායමේ තමයි. එයා හින්ද ඔයා ඔයාගෙ අක්ක එක්ක රණ්ඩු වුණ එක ගැන එයාට කණගාටුයි. ඔයාගෙ අක්කට හොඳටම කේන්ති ගිහිල්ල ඇති නේද?'

'එයාට කනගාටුවෙන්න එපා කියන්න.' මුහුණ රත් පැහැ ගැනෙද්දී ජෙනී කීවාය. 'ඔල්ගට කොහාමටවත් කේන්ති ගිහිල්ල නෑ. එයා චුට්ටක් තදයි, එච්චරයි.' අසහනයට පත් ආකාරයෙන් අතවැනූ ඇය අපේක්ෂා භංග වූ හඬින් මෙසේද කීවාය. 'අනේ සහෝදරී, අපේ තාත්ත ගෙදර එනකං ටිකක් ඉවසල ඉන්නකො.'

අනතුරුව ඔවුහු තරමක් වම්පසට වන්නට ඇති තියුනු බෑවුමක් සහිත ඉවුර කරා ඇදුණෝය. එහිදී ඔවුන්ට ඇනී මුණගැසිණි.

'හලෝ, මාව අඳුරන්න පුළුවන්ද?' අන් අවස්ථාවල පරිදිම මෙහිදීද ඇය දත්මිටිකාගත්වනම වේගයෙන් කතා කළාය. 'අඳුරගත්තා? මම නං ඔයාව ටක් ගාල අඳුනගත්තා. මෙන්න තිමූර් ඉන්නව.' ඇය කොල්ලන්ගෙ න් පිරී පැවති එහා ඉවුර පෙන්නුවාය. 'මට එළුවව හොයල දුන්නෙ කවුද

කියල මං දන්නව. ඒ වගේම දර ගොඩගැහුවෙ කවුද, මගෙ මල්ලිට ස්ට්‍රෝබෙරි දුන්නෙ කවුද කියලත් මං දන්නව. ඒ වගේම මං ඔයාවත් අඳුනනව.' ඈය ටානියා වෙත හැරෙමින් කීවාය. 'මං වතාවක් ඔයා අඬ අඬ එළවළු කොරටුවෙ වාඩි වෙලා ඉන්නව දැක්කා. ඔයා එහෙම අඬන්න නරකයි. ඒකෙන් වෙන හොඳක් නැහැ. ඒයි එක විධිහකට ඉඳිං යක්ෂයො. නැත්නං මං උඹව වතුරට තල්ලු කරනව.' පඳුරක මුලට ගැටගසා සිටි එලිච්චියට ඈය බැන වැදුනාය. ඉන්පසු ඈය සිය ඇඳුම උනාලූවාය. 'එන්න, අපි වතුරට පනිමු.'

ජෙනී සහ ටාන්යා එකිනෙකා දෙස බැලුවෝය. ඉර අව්වට පිච්චී ගිය, අහිගුණ්ඩික කෙල්ලක මෙන් දිස්වුණ ඈය වෙතින් පලවූයේ විසුළුකාර පෙනුමකි.

අත් පටලාගෙන ඉවුරු ගැට්ටේ කෙරවරටම ගිය ඔවුහු පහත සුළි නගමින් ගලා බසිනා තිල්වන් දිය දහර දෙස බැලුවෝය.

'ඉතිං, පනිමුද?'

'ඔව් පනිමු.'

ඒ සමගම ඔවුහු එකටම දියට පැන්නෝය.

ඔවුන් එසේ දියෙහි කිමිදී උඩ මතුවන විටම ඔවුන් අසලින් තවත් කෙනෙක් මතුවූවේය.

ඒ ඇඳසිටි කමිසය,කොට කලිසම සහ සෙරෙප්පු යුවලද සමගින් දියට පැන්න සීමා සිමාකොව්ය.

දිය බේරෙන කොණ්ඩය පස්සට ගස්සා හරිමින් සහ දිය කළඹමින්, නහයෙන් පිඹිමින් ඔහු අනෙක් ඉවුර කරා වේගයෙන් පිහිනා ගියේය.

'කරදරයක් ජෙනී, මහ කරදරයක්.' උර මතින් ආපසු බලමින් ඔහු කෑගැවේය. 'උන් ගෙයිකවයි, නික්වයි හිර කරලා.'

ඔල්ගා පොත කියවමින්ම කඳුගැටයේ ඉහලට පිය මැන්නාය. උස් නදී ඉවුර මතින් විහිදුණ අඩි පාර මාවත හරහා යන ස්ථානයේදී ඈයට සිය යතුරු පැදිය නතර කරගෙන ඉන්නා ජෝර්ජ් හමුවිණි. ඔවුහු එකිනෙකාට සුබපතා ගත්තෝය.

'මං යනකොට තමයි ඔයා එනව දැක්කෙ. ඉතිං ඔයත් ඒ පැත්තටම නං යන්නෙ ඔයාවත් මේකෙ එක්ක යනව කියල මං හිතා ගත්ත.'

' ඔය කියන්නෙ බොරු.' ඕල්ගා බැනවැදුනාය. 'ඔයා මං එනකම් තමයි මෙතන රැකගෙන හිටියෙ.'

'හරි, මං එහෙම හිටිය තමයි.' ජෝර්ජ් කීවේය. 'ඔයා කැමති විධිහකට හිතා ගන්නකො. මං අද උදේ ඔයාව බය කරපු එකට මට සමාවෙන්න. අර ඔයා ගේට්ටුව ලඟදි දැක්ක කොර නාකි මිනිහ තමයි මම. මං පෙරහුරුවකට එහෙම ඇඳල හිටියෙ. නගින්න මං ඔයාව ගෙදර ළඟන් බස්සන්නං.'

ඕල්ගා බැහැයි හිස වැනුවාය.

ඔහු එවිට ඇය අතවූ පොත මත මල් පොකුරක් තැබීය.

ඒ නම් ලස්සන මල් පොකුරකි. ඕල්ගා වියවුලින් රතු වූවාය. ඇය වහා මල් පොකුර බිම දැමුවාය.

ජෝර්ජ් කෙසේවත් එවන් ප්‍රතිචාරයක් අපේක්ෂා කළේ නැති.

'මේ බලන්න.' ජෝර්ජ් නොසතුටින් කතා කරන්නට විණි. 'ඔයා හොඳට වාදනය කරනව. ඒ වගේම ගායනා කරනව. අනික ඔයාට හරි ලස්සන කෙලින් බලන්න පුළුවන් ඇස් දෙකකුත් තියෙනව. මං මොනම විධිහකටවත් ඔයාව කේන්ති ගැස්සුවෙ නෑ. මම නං හිතන්නෙ හොඳටම අමාරු, බරපතල රස්සාවල් කරන අයවත් ඔහොම හැසිරෙන්න හොඳ නෑ කියලයි.'

'ඔයා මට මල් දෙන්න අවශ්‍ය නැනෙ.' තමන් විසින් කරන ලද දෙයින් තැතිගත් ඕල්ගා වරදකාරී හැඟීමකින් යුතුව කීවාය. 'ඔයා- ඔයාට ඔහොම මල් දෙන්නෙ නැතුව මාව ගෙදර ඇරලවන්න පුළුවන්නෙ.'

ඇය එසේ කියමින් යතුරු පැදියෙහි පිටුපස හිඳගත් පසුව එය වේගයෙන් ඉදිරියට ඇදී ගියේය.

එසේ යතුරු පැදිය මාර්ගයෙහි මංසන්ධියකට ළඟාවූ පසුව වතුයාය කරා විහිදි මාවත මගහැරි එය කෙලින්ම විවෘත ගම්බද පෙදෙස කරා දිවෙනා මාවතෙහි ඉදිරියට ඇදෙන්නට වීය.

'ඔයා යන්නෙ වැරදි පාරෙ.' ඕල්ගා කෑගැවාය. 'අපි යන්න තිබුනෙ දකුනු පැත්තට.'

'ඒ වුණාට මේක තමයි හොඳ පාර.' ජෝර්ජ් ඊට පිළිතුරු දුන්නේය. 'මේ පාරෙ යන එක හරි විනෝදයි.'

තවත් වංගුවකින් හැරුණ පසුව ඔවුහු සර සර නදින් පත් සැළුණු සෙවනැති තුරු අතරින් දිවූ මාවතක ඇදෙන්නට වූවෝය. තම රංචුවෙන් මිදුණ බල්ලෙක් බුරා හැලෙමින් යතුරුපැදිය පසුපස එලවගෙන යන්නට විය. එහෙත් ඒ වන විටද යතුරු පැදිය ඌ පසුකර බොහෝ දුර ගොස් හමාරය.

ඉන්පසුව ලොරියක් කාලතුවක්කු වෙඩිල්ලක් මෙන් නද දීගෙන පැමිණියේය. ජෝර්ජ් සහ ඔල්ගා ඉන් නැගී දූහුවිලි වලාවෙන් මිදෙන විට ඔවුන් හට දක්නට ලැබුණේ දුම් දමමින් පැවති මස් වේලන රාක්ක පෙලක් සහ වීදුරු සහ යකඩින් තිමැවුණ ගොඩනැගිලි පෙලකි. එය දිස්වූයේ කන්දක් පාමුල පිහිටි කිසියම් ආගන්තුක නගරයක් මෙනි.

'අර තියෙන්නෙ අපේ වැඩපොල.' ජෝර්ජ් කෑගැවේය. 'මීට තුන් අවුරුද්දකට කලින් මං මෙහෙට ආවෙ හතුයි වල් ස්ට්‍රෝබෙරියි නෙලන්න.'

වේගය මදකිනුදු බාල නොකරම යතුරුපැදිය යූ හැඩයේ වංගුවක් ගත්තේය.

'කෙලින්ම යමු.' ඔල්ගා අනතුරු අඟවන අයුරින් කෑගැවාය. 'කෙලින්ම ගෙදර යමු.'

හදිසියේම යතුරු පැදියේ එන්ජිම නතරවූයෙන් ඔවුන්ගේ ගමනද නතර විණි.

'මිනිත්තුවක් ඉන්න.' බිමට පනිමින් ජෝර්ජ් කීවේය. 'පොඩි ආබාධයක්.'

යතුරු පැදිය අසල වූ බර්ච් තුරක සෙවණට තල්ලු කරගෙන ගිය ඔහු යතුරක් ගෙන එන්ජිමෙහි මොනවාදෝ කරන්නට පටන් ගති.

'ඔයාට ඔයාලගෙ ඔපෙරාවෙ මොන චරිතෙද ලැබිල තියෙන්නෙ?' තණ පලස මත හිඳ ගනිමින් ඔල්ගා ඇසුවාය. ''ඇයි ඔයා ඔය තරං බය හිතෙන මහ සැර තාලෙට ඉන්නෙ?'

' මට ලැබිල තියෙන්නෙ වයසක සොල්දාදුවෙකුගෙ චරිතෙ.' ලහි ලහියේ එන්ජිම සමග ඔට්ටුවෙන අතරේ ජෝර්ජ් පිළිතුරු දුන්නේය. 'එයා හිටපු පාටිසාන් සෙබලෙක්. ටිකක් ඔළුව හොඳ මදි. එයා ජීවත්වෙන්නෙ දේශසීමාව කිට්ටුව. එයා හැම තිස්සෙම ඉන්නෙ සතුරා අපිව ආක්‍රමණය

කරයි කියන බයේ. ඒ වුණාට අනිත් සොල්දාදුවෝ තරුණ අය. එයාල විවේක වෙලාවට කරන්නෙ වොලිබෝල් ගහන එක. එහෙ තව ගැහැණු ළමයිනුත් ඉන්නවා.'

ඒ සමගම රැවුමක් මවා ගත් ජෝර්ජ් පහත් ස්වරයෙන් ගායනා කරන්නට පටන් ගති.

ආයෙම පාරක් හඳ වැහුණා වලාකුලෙන්
දවස් තුනක් මං උන්නා රැකවලේම
ඒ වුනාට ගුප්ත නිහැඬියාවකින්
සතුරා සැඟවිලා ගිහින්
ඒ වුණාට උන් ඉන්නේ මේ අත ළඟ
මං හොඳටම මහළුයි දුබලයි
නිදා නොගෙන ඉඳිනුය ඔබ
නිදා නොගෙන ඉඳිනුය මගෙ මව්බිම

ඉන්පසු වෙනත් තාලයක් ඇල්ලූ ඔහු අත්වැල් ගායනය අනුකරණය කරන්නට විය.

නිහඬවෙන්න සීයේ නුඹ නිහඬවෙන්න.

'ඔය නිහඬ වෙන්න කියන එකේ තේරුම මොකක්ද?' සිය දෙතොලෙහි තැවරී ඇති දුහුවිල්ල අත් ලේන්සුවකින් පිසදමමින් ඔල්ගා ඇසුවාය.

'ඒකෙ තේරුම...' තම අතවූ යතුර සමග ඔට්ටු වෙමින්ම ජෝර්ජ් ඇයට පැහැදිලි කරන්න විය. 'මෝඩ නාකියෝ සාමදානෙන් නිදාගන්න කියන එකයි. නිලධාරීනුයි එයාලගෙ සොල්දාදුවොයි නියම තැන්වල රැකවලේ ඉන්නවනෙ.... ඔල්ගා, ඔයාගෙ නංගි අපේ කතාව ගැන ඔයාට කිවුවද?'

'එයා කිවුවා. ඒත් මං එයාට ඒකට බැන්නා.'

'ඔයා එහෙම කරපු එක හරිනෑනෙ. එයා හරිම විනෝදෙට බර ළමයෙක්. මං ඔහ් කියනකොට එයා පුහ් කියනව.'

'ඔය කියන විනෝදෙට බර ළමය තමුන්ගෙ ජීවිතේ අමාරුවෙ දාගන්න ඉඩ තියෙනව.' ඔල්ගා කීවාය. 'තිමූර් කියල කොල්ලෙක් එයා වටේ කැරකෙනව. ඒකා ඉන්නෙ අර කච්කින් කියන රස්තියාදුකාරය

එක්ක. මට පේන්නෙ මිනිහව අපේ ගෙදරින් ඇත් කරන්න බැරිය කියලයි.'

'තිමූර්? හ්ම්.හ්ම්.' ජෝර්ජ් අසහනකාරී බවක් පාමින් කැස්සේය. 'මිනිහ ඒ රංචුවෙ ඉන්නව කියන එක ද කියන්නෙ? මම නං හිතන්නෙ නෑ මිනිහ ඒ රංචුවෙ එකෙක් කියල.... වෙන්න බෑ......හොඳයි! ඔයා විස්සෝප වෙන්න එපා. එය ආයෙ ඔයාලගෙ ගෙදර පැත්තෙ එන්නැතිවෙන තාලෙට මං වැඩේ කරන්නං. ඔල්ගා, ඔයා ඇයි සංගීතෙ ඉගෙන ගන්නෙ නැත්තෙ? අනික ඉංජිනේරුවෙක් කියන්නෙ කවුද? මේ මාත් ඉංජිනේරුවෙක් ඉතිං මං දිහා බලන්නකො.'

'එතකොට ඔයා හොඳ ඉංජිනේරුවෙක් නෙවෙයිද?'

'හොඳටම හොඳයි.' ඔල්ගා වෙත වඩාත් සමීප වෙමින් ඉදිරි රෝදයෙහි හබ් එකෙහි අළුත්වැඩියාව අරඹමින් ඔහු පිළිතුරු දුන්නේය. 'මං කොහොමටවත් නරක ඉංජිනේරුවෙක් නෙවෙයි. ඒ වුණාට ඔයා හරි ලස්සනට සිංදු කියනව වගේම වාදනයත් කරනවනෙ.'

'මේ බලනන ජෝර්ජ්.' ඔල්ගා මිමිණුවාය. ඇය වියවුලට පත්ව ඉවත ඇදුණාය. 'ඔයා මොන තාලෙ ඉංජිනේරුවෙක්ද කියන්න මං දන්නෙ නෑ. හැබැයි ඔයා ඔය එන්ජිම අළුත්වැඩියා කරන්නෙ නම් මහ අමුතුම තාලෙට.'

එසේ කියූ ඔල්ගා ඔහු අතවූ යතුරින් නිකරුණේ යතුරු පැදියට තට්ටු දමනා ආකාරය අනුකරණය කර පෙන්වූවාය.

'මේ කරන විධිහෙ කිසිම වරදක් නෑ. හැමදේම නියම තාලෙට කෙරෙනව.' එසෙ කියා සිටගත් ඔහු යතුරු පැදියෙහි රාමුවට තට්ටුවක් දෙකක් දැම්මේය. 'ඔන්න හරි. දූන් වැඩෙ ඉවරයි. ඔල්ගා, ඔයාගෙ තාත්තා හමුදා නිලධාරියෙක්ද?'

'ඔව්.'

'ඒක නං මරු. මාත් එහෙමයි.'

'ඒක නං හරියන්නෙ නෑ.' ඔල්ගා දෙවුර හැකිළුවාය. 'මුලින්ම ඔයා ඉංජිනේරුවෙක්. ඊට පස්සෙ නළුවෙක්. දූන් හමුදා නිලධාරියෙක්. සමහර වෙලාවට ඔයා ගුවන් නැවියෙක් වෙන්නත් බැරි නෑ. එහෙමද?'

'නෑ.' ජෝර්ජ් සිනහ වීය. 'ගුවන් නැවියො උඩ ඉඳල මිනිස්සුන්ගෙ ඔළුවට බෝම්බ අතාරිනව. ඒ වුණාට අපි කරන්නෙ යකඩ තලන එක. කොන්ක්‍රීට් දාන එක. කෙලින්ම හදවතට.'

ඉන්පසුව යළිත් රයි කෙත් යායන්, වනපෙත් සහ නදිය වේගයෙන් පසුවී ගියේය. ඉක්මනින්ම ඔවුහු ඔල්ගා ගේ නිවසට පැමිණියෝය.

යතුරු පැදියෙහි හඬ ඇසුණ විගසින් ජෙනී ඉස්තෝප්පුවට දිව ආවාය. ජෝර්ජ් දුටු සැණින් ඇගේ මුහුණ රතු විණි. එහෙත් ඔහු පිටව ගිය පසුව ඔල්ගා කරා පැමිණි ඇය ඔල්ගා වැළඳ සිප ගනිමින් ඉරිසියාවෙන් යුතුව මෙසේ කීවාය:

'ඔහෝ, අද ඔයා මොන තරං වාසනාවන්තද ඔල්ගා.'

පසුව ගෙවතු අංක විසිහතර ආසන්නයෙහිදී නැවත හමුවන්නට කතා කරගත් කොලු රැළ දේවස්ථානයෙන් විසිර ගොසිනි.

දූන් එහි ඉතිරිව සිටියේ එක් අයෙක් පමණි. ඔහු සිටියේ දේවස්ථානය තුළ පැවති නිහැඬියාව හමුවේ කෝපයට සහ වියවුලට පත්වෙමිනි. අත්අඩංගුවට පත් දෙදෙන කෑගැවේ නැති. දොරවලට පහර දුන්නේද නැති. වෙනකක් තබා ඔහුගේ ප්‍රශ්ණ සහ සරදම් කෙරේ ප්‍රතිචාර දක්වූයේද නැති.

අනතුරුව ඔහු උපායක් යොදා බල්න්න ට උත්සාහ දැරිය. පිටත දොර හරිමින් ඔහු දේවස්ථානයෙහි ගලින් බිත්ති බැඳි ආලින්දයට පිවිස මැඩගත් හුස්මින් එහි සිටගති.

යතුරු සිදුරට කන තබාගෙන එහි ඔහු සිටගෙන සිටින අතරේ කවුරුන් විසින් හෝ පොලු පහරක් දුන් විටක මෙන් පිටත දොර එක්වරම මහ හඬක් නගාගෙන වැසී ගියේය.

'කවුද ඔතන?' වහා දොර වෙත හැරෙමින් ඔහු කෝපයෙන් ඇසීය. 'නිකං සෙල්ලං දාන්න එන්නෙපා. මං හොක්ක පොඩි වෙන්න දෙනව හරිද.'

එහෙත් කිසිවකුත් පිළිතුරු දුන්නේ නැති. එහෙත් ඔහුට පිටත අමුතු කටහඬවල් නම් ඇසිණි. ඉන්පසු ඔහුට ජනෙල් පියන් කිරි කිරි ගානු ඇසිණි. කවුරුන් හෝ ජනෙල් පොලු අතරින් සිරකරුවන් සමග කතා කරමින් සිටින හැඩකි.

ඉන්පසුව දේවස්ථානය තුළ සිටි කොල්ලෝ දෙදෙන මහ හඬින් සිනහවෙන්නට ගති. ඒ සිනහ හඬ ඇසුණ නොම්මරයා අසහනයට පත්විය.

අවසානයේදී පිටත දොර විවර වූවේය. තිමූර්, සිමාකොව්, සහ ලැඩිගින් දොරකඩ පෙනී සිටියෝය.

'දෙවන දොර අරිනු.' තමන් සිටි තැනින් සෙලවෙන්නේ වත් නැතිව තිමූර් නියෝග කළේය. 'තමුන්ට කරදරයක් වෙනව දකින්න ඕන නැත්නම් වහාම දෙර අරිනු.'

නොම්මරයා අකමැත්තෙන් දොර බෝලය කරකැවීය. ඒ සමග නික් සහ ගෙයිකා දේවස්ථානයෙන් පිටතට ආවෝය.

'දැන් තමුසෙ යනව එතනට!' තිමූර් නියෝග කළේය. 'ඌරා, ඉක්මනට පලයං, කිව්වහම අහල ඉක්මනට.' සිය අත් මිටමොළවා ගනිමින් ඔහු කෑ ගැවේය. 'මට මෙතන උඹ එක්ක කතා කරකර නාස්ති කරන්න කාලයක් නෑ.'

නොම්මරයා ඇතුලෙහි සිරකර දොරවල් දෙකම වසා දමන ලද්දේය. දොරට බර යකඩ ඇණයක් හිර කර ඉබ්බෙක්ද දමන ලදී.

ඉන්පසුව කරදාසියක් ගත් තිමූර් නිල් පැහැ පැන්සලකින් එහි මේ වැකිය කුරුටු ගෑවේය.

'කව්කින්, මුර භටයන් යොදවන්නට අවශ්‍ය නැත. මම දොර අගුළු දමා යතුරද රැගෙන යමි. අද හැන්දෑවේ හමුවීම් ස්ථානයට පැමිණෙමි.'

අනතුරුව ඔවුහු පලා ගියෝය. ඉන් මිනිත්තු පහකට පසුව කව්කින් ගේට්ටුවෙන් ඇතුළු වීය.

සටහන කියවා බැලූ ඔහු දොර අගුල අතගා බලා විරිත්තා, ආපසු ගේට්ටුව බලා ගමන් කළේය. ඒ අතරේ නොම්මරයා ලවක් ඹෑවක් නැතිව සිය මිට මෙළවූ අතින් සහ පයින් යකඩ දොරට පහර දෙන්නට වූවේය.

ගේට්ටුව අසලදී ආපසු හැරුණු කව්කින් උදාසීන හඬින් කතා කළේය.

'හයියෙන් ගහපං ගෙයිකා! හැන්දෑවෙනකං ඔහොමා ඇතිවෙනකං දොරට තඩිබාලා බලාපන්.'

හිරු බැස යාමට ඔන්න මෙන්න කියා තිබියදී තිමූර් සහ සිමාකොව් එක්ව වෙළඳපල චතුරශ්‍රය කරා පියමැන්නෝය. සිසිල් බීම, එළවලු,

දුම්කොළ, සිල්ලර බඩු සහ අයිස් ක්‍රීම් අලෙවි කරනා කඩ පෙලක කෙලවර පොල දවසට සපතේරුවන් පාවහන් අළුත්වැඩියා කිරීමෙහි නිරත වන හිස් කුටියක් තිබිණි.

තිමූර් සහ සිමාකොව් එහි මිනිත්තු කිහිපයක් බලා සිටියෝය.

ගොම්මන් වැටෙද්දී මඩුවෙහි රෝදය කරකැවෙන්නට පටන් ගති. ඒ සමග නියමිත ස්ථානයන්ට නියමිත සංඥාව බැගින් යවමින් එකක් පසුපස එකක් බැගින් කම්බි තදව ගියේය. ආරක්ෂක විධි විධාන තර කරන ලද්දේය. ඒ වන විටත් සැලකිය යුතු කොල්ල රංචුවක් එහි රැස්ව සිටියෝය. කොල්ලන් විස්සක් තිහක් පමණ. තවත් කොල්ලෝ ශබ්ද නොනගා වැටෙහි කපොළු අතරින් රිංගා ආවෝය.

ටාන්යා සහ ඇන් ඉවත යවන ලදී. ජෙනීද නිවසෙහි නතරව සිටියාය. ඇයට පැවරී තිබූ රාජකාරිය වූයේ ඔල්ගාට නිවසින් පිටතට යාමට නොදී එහිම රඳවා ගැනීමයි.

තිමූර් රෝදය අසල නතර වූවේය.

'හයවෙනි මාර්ගයෙ සංඥාව ආයෙ යවන්න.' සිය හිස ජනේලයෙන් පිටට දමමින් සිමාකොව් මහත් කලබලයෙන් කීය. 'අපිට ඒකෙන් කිසිම ප්‍රතිචාරයක් ලැබෙන හඬක් නෑ.'

ඒ අතරේ කොල්ලෝ දෙදෙනෙක් ප්ලයිවුඩ් කැබැල්ලකින් කිසියම් සටන් පාඨයක් වැනි යමක් පිළියෙල කළෝය. ලැඩිගින්ගේ කණ්ඩායමද ඒ අතර එහි ළඟා වූවෝය.

අන්තිමේදී ඔත්තුකරුවෝ සිය වාර්තාද රැගෙන ආවෝය. කව්කින්ගේ රංචුව අංක 24 දරන නිවෙසට පිටතින් රැස්ව සිටිති.

'අන්තිමේ නියම වෙලාව ආවා.' තිමූර් පැවසීය. 'ලැස්ති වෙයල්ලා කොල්ලනේ.'

රෝදය අත හැරිය ඔහු කඹයක් ඇද්දේය. හෙමිහිට කණ්ඩායමේ ධජය ඉහල නැග අබලන් මඩුවට ඉහලින් වළා අතරින් වරින් වර මතුවෙමින් සහ සැඟව යමින් තිබූ සඳමඩලෙහි කිරණ අතරෙහි සැලෙන්නට විය. ඒ සටන සඳහා වන සංඥාවයි.

කොල්ලෝ දහදොළොස් දෙනෙක් අංක 24 දරණ නිවසෙහි වැට අද්දරින් එකා පසුපස එකා බැගින් පරීක්ෂාවෙන් ඇදුණෝය. මුවාවකට පැමිණි පසුව කව්කින් මෙසේ ඇසීය:

'හැම එකාම ඉන්නව නොම්මරයා ඇර.'

'මිනිහ දක්ෂයා.' කවුදෝ කීවේය. 'ඔන ඔට්ටුවක් මිනිහ දූනටමත් වත්තට පැනල ඇති. හැම වෙලාවෙම මිනිහ තමයි මුලින්ම පනින්නෙ.'

කල්තබා බුරුල් කරන ලද වැට ලෑලි දෙකක් ගැලවූ කව්කින් ඉන් ඇතුලට රිංගීය. අනෙක් පිරිස ඔහු පසුපස ගියෝය. ඇලෙක්ස් පමණක් මුර සේවය පිණිස පිටත නතර විණි.

ඒ අතරේ මාවතෙන් එහා පැත්තෙහි වූ කහඹිළියා සහ වල් පැල පිරි අගල මතින් ඔළුගෙඩි පහක් ඉහලට මතු විණි. ඉන් හතරක් යළිත් අතුරුදන් විණි. පස්වැන්න- ඒ නික් කොලොකොල්චිකොව්ගේ හිසයි- ඉක්මනින්ම අතුරුදන් වූයේ නැති. එහෙත් ඒ සමගම ඇදී ආ අතකින් දුන් පහරක්ද සමගින් එයද නොපෙනී ගියේය.

මුර රාජකාරියේ නියුතු ඇලෙක්ස් වටපිට බැලීය. සෑම දෙයම නිසලව පැවතිණි. එහෙයින් ගෙවත්ත තුළ කුමක් සිදුවන්නේද යන්න දූන ගැනීමට ඔහු වැටෙහි සිදුරකින් හිස ඇතුලට දැමීය.

ඒ සැණින් කොල්ලෝ තිදෙනෙක් අගලින් පිටට පැන්නෝය. ඊළඟ මොහොතේදී මුර සෙබලාට දූණුනේ සවිමත් අත්වලින් තම දෑත් සහ දෙපා අල්ලාගනු ලැබූ බවකි. කෑගසන්නට ඉඩක් ලැබෙන්නට පෙරම ඔහු වහා වැට වෙතින් ඉවත ඇදගනු ලැබිණි.

'ගෙයිකා!' සිය හිස ඔස්වමින් ඔහු මිමිණීය. 'උඹ කොහොමද මෙතනට ආවෙ?'

'ඒක අදාල නැනෙ.' ගෙයිකා කෝපයෙන් පිම්බේය. 'උඹ කටවහගෙන ඉන්න එක හොඳයි. එහෙම නොකළොත් උඹ අර වෙලාවෙ මං වෙනුවෙන් කතා කළාය කියන එක මං අමතක කරල දානව.'

'හරි.' ඇලෙක්ස් එකඟ විණි. 'මං කටවහගෙන ඉන්නං.'

එහෙත් ඔහු එක්වරම අනපේක්ෂිත ලෙස තියුණු සියුරුහන් නදක් පිට කළේය.

ඒ සමගම ගෙයිකාගේ පුළුල් අත්ලෙන් ඔහුගේ මුව තදව ගියේය. වහා ඔහු එතනින් ඉවත ඇදගෙන යනු ලැබිණි.

ගෙවත්තේ හුන් කොල්ලන්ට සියුරුහන් නාදය ඇසී තිබිණි. කව්කින් ආපසු හැරී බැලීය. එහෙත් සියුරුහන් නද නැවත නැගුණේ නැත. කව්කින් අන්ධකාරයට එබී බැලීය. එවේලේ ගෙවත්ත කෙලවර වූ පඳුරු සැලෙන බවක් පෙනුනේ යයි ඔහුට සිතිණි.

'නොම්මරයො!' ඔහු පහත් හඬින් කතා කළේය. 'ඔතන හැංගිලා ඉන්නෙ උඹද මෝඩයො?'

'කව්කින්, එළියක් පේනවා!' කවුදෝ හදිසියේම කෑගැවේය. 'බලාගෙන, ඔන්න උන් එනවා.'

ඔහුට පිටුපසින් වූ පඳුරෙහි සිට අවම වශයෙන් විදුලි පන්දම් දොළහක එළිය ඔහුවෙත පතිත වීය. කව්කින්ගේ රංචුවෙහි ඇස් නිලංකාර කරමින් සහ ඔවුන් වියවුලට පත් කරමින් ඔවුහු කඬා පැන්නෝය.

'ගහපල්ලා උන්ට, දුවන්න එපා,' සාක්කුවට අතයවා ඇපල් ගෙඩියක් ගෙන ආලෝකය දෙසට ඉන් පහර දෙමින් කව්කින් කෑගැවේය. 'ටෝච් ටික උදුරගෙන උන්ගෙ අත් අඹරවපල්ලා! ඔය ඇවිල්ලා ඉන්නෙ තිමූර්.'

'තිමූර් විතරක් නෙවෙයි මාත් ඉන්නවා.' පඳුරක් පිටුපස සිට ඉදිරියට පනිනා ගමන් සිමාකොව් කෑගැවේය.

ඒ අතරේ හැම පැත්තෙන්ම පාහේ කොල්ලෝ දහදොළොස් දෙනකු ඔවුන් මත කඩා පැන්නෝය.

'ඔහෝ!' කව්කින් මොර දුන්නේය. 'උන් මෙතනට හමුදාවක්ම ගෙනත්.' කොල්ලනේ දුවපල්ලා.'

කව්කින්ගේ රංචුව කලබලව වහා වැට කරා දිව ගියෝය. එකිනෙකාගේ ඇඟේ හැපෙමින් සහ පැටලෙමින් රංචුවූ පාරට පැන්න නමුදු ඒ සමග ඔවුන් කෙලින්ම ගෙයිකා සහ ලැඩිගින්ගේ අතටම හසුවූවෝය.

සඳමඬල එක්වරම වලාවක් පිටුපස සැඟව ගියාය. දූත් අඳුර අතරින් ඇසුණේ කටහඬවල් පමණි.

'මට යන්න දීපං.'

'මට ඉන්න දීපං.'

'අහකට ගනින් අත, ඒයි!'

'හැම දෙනාම නිස්සද්ද වෙයල්ලා!' තිමූර්ගේ හඬ උස්ව නැගුණේය. 'ඔය හිරකාරයන්ට ගහන්න එපා! කෝ ගෙයිකා?'

'මං මෙතන ඉන්නවා.'

'මුන්ව අරං යනු!'

'උන් ආවෙ නැත්නං?'

'බලෙන් අරං යනු!'

'වල් මීයනේ, මට යන්න දීපල්ලා.' කවුදෝ කෝපයෙන් පිම්බේය.

'කවුද ඒ?' තිමූර් කෝපයෙන් විමසීය. ''අහා, උඹට අනුන්ව විවේචනය කරන් පුළුවන්. හැබැයි තමුන්ට ඒකට මූණ දෙන්න බෑ. ගෙයිකා, නියෝගය දීලා මුන්ව අරං යනු!'

ඒ අනුව වෙළඳපල චතුරශ්‍රයෙහි කෙලවර පිහිටි හිස් කාමරය කරා සිරකරුවන් පිරිස රැගෙන යන ලද්දේය. එහිදී එකා පසුපස එකා බැගින් ඔවුන් එහි ඇතුළු කෙරිණි.

'කව්කින් මා වෙත රැගෙන එනු.' අනතුරුව තිමූර් නියෝග කළේය.

ඒ අනුව කව්කින් එහි රැගෙන එනු ලැබිණි.

'හරිද?' තිමූර් ඇසීය.

'ඔක්කොම හරි.'

අවසන් සිරකරුවාද කුටියට තල්ලු කළ පසුව දොරට අගුළු දමන ලදී.

'දූවන්නයි කිවුවෙ.' තිමූර් කව්කින්හට පැවසීය. 'තමුසෙ මහ විහිලුවක් ඕයි. කවුරුවත් තමුසෙට බයත් නෑ. කාටවත් තමුසෙගෙන් වැඩකුත් නෑ.'

පහර දීමක් අපේක්ෂාවෙන් කව්කින් බිම බලාගත්වනම පසුවූවේය.

'දූවන්නයි කිවුවෙ.' තිමූර් පුනරුච්ඡාරණය කළේය. 'මේ යතුර අරගෙන ගිහිල්ලා තමුසෙගෙ ගජයා නොම්මරයව එළියට අරගන්නව.'

කව්කින් සෙලවුණේවත් නැති.

'එක්කො මගෙ යාළුවන්ව එළියට දානව, නැත්නං මාවත් ඇතුලට දානව.' ඔහු ගෙරවීය.

'බෑ.' තිමූර් කීවේය. 'ඒ කතන්දරේ ඉවරයි. තමුසෙට උන් එක්ක ගනුදෙනු ඉවරයි. ඒ වගේම උන්ටත් තමුන් එක්ක මීට පස්සෙ ගනුදෙනු නෑ.'

බාගත් දෙවුරින් යුතුව කච්කින් හෙමිහිට එතනින් ඉවත ඇදෙද්දී සමච්චලය හඟවන සියුරුහන් සහ විවිධ නාද පැතිර ගියේය. එහෙත් පියවර දහයක් දොළහක් ගිය පසු ඔහු සිරුර ඍජු කරගති.

'මං තොට හොඳ පාඩමක් උගන්නනන්නං!' ඔහු තිමූර් හට නපුරු ලෙස බැනවැදුනේය. 'මං උඹව මගෙ තනි අතින් පොඩි කරල දානව දූන ගනිං. තලපයක් කරනව!' ඉන්පසුව ඔහු අඳුර තුළට අතුරුදහන් වූවේය.

'ලැඩිගින්, ඔයාට තමුන්ගෙ පස්දෙනා එක්ක යන්න පුළුවන්.' තිමූර් කීය. 'මොකක්ද තමුන්ට ඊළඟට තියෙන වැඩේ?'

'අංක 22 බොල්ශයා වසිල්කොව්ස්කයා- දර ගොඩගැසීම!'

'මරු. වැඩට බහිමු.'

අසල වූ දුම්රිය නැවතුම් පලෙන් නළාවක හඬ නැගී ආවේය. දුම්රියක් ඇදී ආ අතර ඉක්මනින්ම මගීහු පිටතට ඇදෙන්නට පටන්ගනු ඇත. තිමූර් ඉක්මන් කරන්නට වීය.

'සිමාකොව්, ඔයයි ඔයාගෙ පස්දෙනයි... මොකක්ද වැඩේ?'

'අංක 38, මලායා පෙට්‍රාකොව්ස්කයා....' ඔහු සිනහවක් පාමින් තවත් කියාගෙන ගියේය. 'වෙනද වගේම තමයි: බාල්දි, පීප්ප, වතුර. එහෙනං මෙන්න අපි ගියා.'

'මරු, වැඩට බහිමු! හොඳයි එහෙනං... මිනිස්සු මේ පැත්තෙන් එනව... ඉතිරි අයට ගෙවල්වලට යන්න පුළුවනි. ඉක්මනට!'

චතුරශ්‍රය කරා අලුතින් පිරිස් ඇදී එන්නට ගත්විට එහි මහා ගෝෂාවක් හටගති. ඔවුහු එක්වරම නැතිගෙන නතර වූවෝය. තවත් වරක් දොරට ගසන හඬ සහ කෑගෑම ඇසිණි. ආසන්නයේ වූ නිවෙස්වල විදුලි පහන් නිවී ගියේය. කවුදෝ වෙළඳ සැල්වලට ඉහලින් වූ විදුලි පහන් දැල්වූ අතර ඒ සමග එහි සවි කරන ලද පුවරුවක් කාහටත් දකගත හැකි විණි.

මගී ජනතාවෙනි, ඔවුන් ගැන අනුකම්පා නොකරන්න!

මෙහි රඳවා ඇත්තේ රාත්‍රියෙහි අහිංසක නිවැසියන්ගේ ගෙවතුවලට රිංගා හොරෙන් ඇපල් කඩා සොරකමෙහිද යෙදුන පිරිසකි.

ඉබ්බාගේ යතුර මේ දැන්වීම පිටුපස ඇත. තම ඥාතීන් හෝ මිතුරන් මේ පිරිස අතර නැති බව පළමුව සැකහැර දූනගන්නා මෙන් සිරකරුවන් නිදහස් කිරීමට ඉදිරිපත් වන්නාහට දූනුම් දෙනු ලැබේ.

දැන් හොඳටම රෑ බෝවී හමාරය. කළු පැහැ දාරයෙන් යුතු රතු තරුව තවදුරටත් දැකිය නොහැකිය. එහෙත් එය එහෙමම තිබේ.

යළිත් වරක් අප අර පුංචි දැරිය ඉන්නා ගෙවත්ත කරා යොමු විය යුතුය.

ගසක අත්තෙක සිට පහළට එල්ලෙන කඹ පොටවල් දෙකකි. කොල්ලෙක් එහි රළු කඳ දිගේ පහළට බඩගායි. කඹ පොටවල් දෙක යාවන සේ ඊට ලෑල්ලක් බඳියි. ඉන්පසු ඔංචිල්ලාව හරිදැයි එහි වාඩිවී බලයි. එය හොඳහැටි ශක්තිමත්ව බැඳ තිබේ.

ශක්තිමත් අත්ත මදක් කිරි කිරි ගායි. තුරුපත් සුළඟට හසුව සැලෙයි. සිය නින්දෙන් අවදි කරන ලද කුරුල්ලෙක් කිචි බිචි ගා අත්තටු ගසයි. දැන් හොඳටම රෑ වී හමාරය. ඕල්ගා නින්දට ගොස් බොහෝ වේලාවකි. ජෙනීද නින්දේය. කොලු සගයන්ද එසේමය. විනෝදකාමී සිමාකොව්, අල්පභාෂී ලැඩිගින්, විසුළුකාර තික් යන් මේ හැමෝම. නිර්භීත ගෙයිකා නම් ඇඳේ පෙරලෙමින් නින්දෙන්ම මොනවාදෝ මුමුණයි.

ඔරලෝසු කනුවෙහි ඇති සීනුව මැදියම් හෝරාව පසුවී පැය කාලක් ගෙවී ඇති බව අඟවයි. 'දවසක් ගෙවිලා-වැඩ ටික කෙරිලා! ඩිං ඩොං! එකයි දෙකයි!

සැබැවකි, වෙලාව හොඳටම පමාවෙලාය.

වහා ක්‍රියාතමක වූ කොලු රැළ හාත්පස තණබිම් සිසිරා වන මල් ගොන්නක් නෙලාගත්තෝය.

ජෙනී ඒවා මල් කළඹ ලෙස සකසා දුන්නාය.

නිදා සිටින්නන් බිය කර අවදි නොකරනු පිණිස පා ඇඟිලි තුඩින් ඇවිද ගිය ඔහු සඳ පහනින් නැහැව තිබූ නිවෙස්හි ඉදිරිපස ඉහලම පඩිය මත මල් කළඹ බැගින් තැන්පත් කළේය. එසේ කළ කොල්ලා අන් කවරකුවත් නොව තිමූර්ය.

ඒ ඉරිදා උදෑසනයි. ඈත පෙරදිග හසාන් විලෙහි රතු හමුදාවේ ජයග්‍රහණ සංවත්සරය සැමරීම පිණිස යෞවන කොමියුනිස්ට් ලීගය විසින් උද්‍යානයෙහි කදිම සැණකෙළියක් සහ ප්‍රසංගයක් සංවිධානය කරන ලද්දේය.

කෙල්ලෝ ඒ උදෑසනම සැණකෙළි බිම කරා දිව ගියෝය. සිය බිල්වුසය වහා මැදගත් ඔල්ගා අල්මාරිය වෙත ගියාය. ඈය ජෙනීගේ

ඇඳුම ගෙන ගසද්දී එහි සාක්කුවක තිබී කරදාසි කැබැල්ලක් බිම වැටුණේය.

ඔල්ගා එය අහුලාගෙන කියවන්නට වූවාය.

'ගෙදර ඉන්න කාටවත් බයවෙන්න අවශ්‍ය නෑ. හැමදේම හොඳින්. මං කාටවත් කියන්නෙ නෑ. තිමූර්.'

මෙයා මොනවද නොකිය ඉන්න හදන්නෙ? ජෙනී මොනවටද බයවෙන්න අවශ්‍ය නැත්තෙ? මේ කපටි ළමය මොනවද මගෙන් හංගන්න හදන්නෙ? නෑ! මේක ඉවරයක් කරන්න ඕනෑ. තාත්තා ගෙදරින් යද්දි කියල ගියේ... ඇය වහා ක්‍රියාත්මක විය යුතු යයි ඇයට හැඟී ගියේය.

ඒ අතරේ ජෝර්ජ් ජනේලයට තට්ටුවක් දැමීය.

'ඔල්ගා.' ඔහු කෑගැවේය. 'ඔයා මට උදව් කරන්න ඕනෑ. නියෝජිත කණ්ඩායමක් ඇවිත්. එයාල මට ප්‍රසංගෙදි වාදනයක් ඉදිරිපත් කරන්න කියනව. අද විශේෂ දවසක්- මට කොහොමටවත් ඒක බෑ කියන්න බෑ. ඔයා එකෝඩියන් එකත් අරං මාත් එක්ක එකතු වෙන්න ඕනෑ.'

'ඔව්-ඒත් ඇයි ඔය පියානෝ වාදකයෙකුට අඬගහන්නෙනැත්තෙ?' ඔල්ගා විමතියෙන් ඇසුවාය. 'ඔයාට එකෝඩියන් එකක්ම ඕනෑ ඇයි?'

'ඔල්ගා මට පියානෝ වාදකයෙකුගෙන් වැඩක් නෑ. මට ඕනෑ ඔයත් එක්ක සිංදු කියන්න. ඒක ලස්සනට තියෙයි. මං ජනේලෙන් පැනල ඇතුලට එන්නද? ඔය ඉස්තිරික්කේ පැත්තකින් තියල එකෝඩියන් එක ගන්න. මේ බලන්න මං මගෙ එකත් අරං ආව. ඔයා කරන්න ඕනෑ එකම දේ වාදනය කරන එක. මං සිංදු කියන්නං.'

'මේ බලන්න ජෝර්ජ්,' ඔල්ගා අසහනයෙන් කතා කරන්නට වූවාය. 'අර හොඳට දොරක් තියෙද්දි ඔයා මොන එහෙකටද ජනේලෙන් රිංගන්න හදන්නෙ?'

උද්‍යානයෙහි පිරිස ගෝෂා කරමින් පසුවූවෝය. නිවාඩු පිණිස එමින් සිටි පිරිස් පුරවාගත් කාර් වැල නොකැඩී එහි ඇදී ආවේය. සැන්ට්විච්, බනිස්, සිසිල් බීම, සොසේජස්, පැණිරස කෑම සහ කේක් පුරවාගත් වෑන් රථද එහි ඇදී ආවේය. මුළු භූමිය පුරාම අයිස්ක්‍රීම් වෙළෙන්දෝ සැරිසැරුවෝය.

තිවාඩුවට පැමිණි පිරිස් තණ බිම මත හිඳගෙන සිය දිවා ආහාර බඳුන් සකසන්නට පටන් ගෙන සිටි ප්‍රදේශය පුරා ග්‍රැමපෝන් හඬ පැතිර ගියේය.

වාද්‍ය කණ්ඩායම සිය හඬ පැතිරෙව්වෝය. විවෘත රඟමඩලෙහි ප්‍රවේශය අසල වියපත් මුරකරුවෙක් සිය ආම්පන්නද රැගෙන එහි ඇතුලු වීමට- අඬු,යතුරු, පටි, යකඩ කූරු ආදිය- තැත් කළ දුරකථන අළුත්වැඩියාකරුවකු සමග වාදයක පැටලී සිටියේය.

'මේ අහපං යාළුවා, තමුසෙට ඔය ආම්පන්න අරං ඇතුලට යන්න දෙන්න බෑ.අද තිවාඩු දවසක්. තමුසෙ ඉස්සෙල්ලම ගෙදර යනව. ඇඟපත හෝදගෙන, ඔළුව හෙම පීරල පිලිවෙලකට ඇඳුමක් ඇඳගෙන එනව.'

'ඒ වුනාට මේක නොමිලේ පෙන්නන එකක්නෙ. හොඳයි නැද්ද? මට ටිකට් ගන්න ඕනැ වෙන්නෙ නෑනෙ.'

'ඒකෙ ඇති දෙයක් නෑ. ඒ අය මෙහෙ සිංදු කියනව. තමුසෙට අඩුවකට තියෙන්නෙ තමුසෙ අර ටෙලිපෝන් කණුවකුත් අරං නාපු එක විතරයි. පුරවැසියා, තමුන් මෙතනින් ගියා නං හොඳයි.' ඔහු ඒ අතර තවෙකකුට එසේ කීවේය.

'මෙතන ප්‍රසංගයක් තියෙනවය, සංගීතෙයි සිංදුයි තියෙනවය කියල තමුසෙට ඇහෙන්නෙ නැද්ද? අතික තමුසෙගෙ සාක්කුවෙන් බෝතලේකුත් එලියට පැනල.'

'මෙහෙ බලනව නාකි ඉලන්දාරියා! ' අනෙකා ගොතගැසීය. 'මං යන්න ඕනැ. මම තමයි උච්චස්වරයෙන් ගයන්න ඉන්නෙ.'

'ඉතිං එහෙනං යන එකනෙ.' මහළු මුරකරුවා සැරෙන් කීවේය. අනතුරුව ඔහු දුරකථන රැහැන් අළුත්වැඩියා කරන්නා දෙසට අත දිගු කළේය. 'මෙයත් එහෙමට කරදර කරන්නෙ නෑ. තමනුත් නිස්සද්දව ඉන්නව හොඳයි.'

සිය එකෝඩියනයද ගෙන ඔල්ගා වේදිකාව පිටුපසට ගිය බව කොල්ලන් විසින් ජෙනීට පවසන ලදී. ඇය සිය අසුනෙහි ඇඹරෙමින් බලා සිටියාය.

අවසානයේදී ඔල්ගා වේදිකාව මතට ගොඩවූවාය. ජෙනී හට ඒ සමග මහත් බියක් හටගති. ප්‍රේක්ෂකයන් සිය සහෝදරියට සිනහවනු ඇතැයි ඇයට බියක් දැණිනි.

එහෙත් කිසිම කෙනෙක් ඇය සිනහවූයේ නැති.

ජෝර්ජ් සහ ඔල්ගා ඉතා කදිමට දිස්වූවෝය. තාරුණ්‍යයේ ජවයෙන් පිරි දෙදෙන වේදිකාව මත සිටගෙන සිටියදී ජෙනීට වහා දිවගොස් දෙදෙනාම බදා වැළඳගැනීමට මහත් ආශාවක් ඇති විණි.

ඔල්ගා සිය එකෝඩියනය අතට ගත්තාය.

ජෝර්ජ්ගේ නළල මත ගැඹුරු රැල්ලක් නැගිණි. සිය දෙවුර වකුටු කරගත් ඔහු හිස පහත් කරගති. දැන් ඔහු මහල්ලෙකි. ටිකකින් ඔහු ගැඹුරු පහත් හඬකින් ගායනය ඇරඹිය.

තුන් දවසක් මං මුරකාවල් කෙරුවා
අඳුර එබෙනා හැමවිට පාහේ
මට ඇහුණේ ඇවුරුණු හඬවල්මයි
සැකමුසු ඇවුරුණු නෙක නෙක හඬවල්
මා අත වූ ගිනි අවියත් ගිනියම්
විසි වසකට පෙර තිබුණා වාගෙම
මගෙ හද ඉල්ලයි රකිනට මගෙ රට

ඒ යුද සමයේ රැයවල් වාගේ
අදත් රැකවලෙහි හිඳිනෙමි පෙර ලෙස
මගෙ රට වෙනුවෙන් කැඳවුම ලැබුණොත්
සතුරට එරෙහිව සටනට යන්නට

මා දැන් සිටියද මහළු වියේ
නැගෙමි අදත් විසි වසකට පෙර මෙන්
නොබා මගේ රට රැකගනු අටියෙන්

'හරිම ලස්සනයි! අනේ නිර්භීත නාකියා! මොන තරං ලස්සන කටහඬක්ද!' ජෙනී තනිවම කියා ගත්තාය. 'අන්න ඒක තමයි ඔල්ගා නියම විධිහ. මෙයාලා ගෙ දක්ෂකම් බලන්න අනේ තාත්තා අද මෙතන හිටිය නං.'

ප්‍රසංගයෙන් පසුව ජෝර්ජ් සහ ඔල්ගා අතිනත ගෙන උද්‍යානය තුළින් පියමැන්නෝය.

'හැමදේම හොඳට කෙරුණා.' ඔල්ගා කියත්තට වූවාය. ''ඒ වුණාට මම මේ කල්පනා කරන්නෙ ජෙනී හිටියෙ කොහෙද කියලයි.'

'එයා අර පුටුවක නැගලා හුරේ දදා හිටියෙ.' ජෝර්ජ් පැවසීය. 'ඊට පස්සෙ-' ජෝර්ජ් පැකිළුණේය. 'ඊට පස්සෙ එය ළඟට කොල්ලෙක් ආවා, එයා මිනිහත් එක්ක අතුරුදහන් වුණා.'

'මොන කොල්ලද?' ඔල්ගා කාන්සාබරව ඇසුවාය. 'ජෝර්ජ් ඔයා මට වඩා වැඩිමල්. මං එයා ගැන මොකද කරන්නෙ කියල කියා දෙන්න. මේ බලන්න මට අද උදේ එයා ළඟ තිබිල මේ කොල කෑල්ල හම්බවුණා.'

ඒ සටහන කියවන අතරේ ජෝර්ජ් කල්පනාකාරී බවක් පාමින් රැවුවේය. 'බය වෙන්න එපා කියන එකේ තේරුම තමුන්ට කියන විධිහට වැඩ කරන්න එපා කියන එක.' ඔල්ගා කීවාය. 'අනේ, අනේ මට ඔය කොල්ලව අල්ලගන්න තිබුණ නං මං ඌට දෙකක් කියනව.'

ඔල්ගා සටහන සාක්කුවේ රුවා ගත්තාය. මද වේලාවක් දෙදෙනාම නිහඬව පසුවූවෝය. එහෙත් සංගීතය කෙතරම් ප්‍රාණවත්ව පැවතියේද යත් ඔවුන් වටා සිටි සැවොම සතුටින් පසුවූවෝය. එහෙයින් යළි අතිනත පටලාගත් දෙදෙන ගමන් ඇරඹූවෝය.

හදිසියේම මංසන්ධියකින් ඒ අයුරින්ම මිත්‍රශීලී ලෙස අතිනත පටලා පැමිණි දෙදෙනෙක් ඔවුන්ට හමුවිණි. ඒ තිමූර් සහ ජෙනීය.

මේ යෞවන ජෝඩු දෙක කෙතරම් තක්කු මුක්කු වීද යත් එකිනෙකාට සුබ පතා නොනැවතී සිය මගෙහිම ගියෝය.

'අන්න මිනිහා!' ජෝර්ජ් ගේ කමිස අත තදින් අල්ලා ගනිමින් ඔල්ගා කීවාය. 'ඒ තමයි මම කියපු කොල්ලා.'

'ඔව්.' ජෝර්ජ් අසහනයට පත්වෙමින් කීවේය. 'මෙතන තියෙන නරකම දේ ඒ ඉන්නෙ තිමූර් වෙච්ච එකයි. ඒ කියන්නෙ යකෙකුටවත් බය නැති මගෙ බෑනපොඩ්ඩ වෙච්ච එකයි.'

'එතකොට ඔයා එයාව දන්නව!' ඔල්ගා කේන්තියෙන් කෑගැවාය. 'එහෙම අඳුරද්දිත් ඔයා මට නිකමටවත් වචනයක් තරම කිවුවෙ නෑ!'

ඔහුගේ අත මුදා හැර ඇය මාවත දිගේ පහලට දිව ගියාය. එහෙත් තිමූර් හෝ ජෙනී පෙනෙන්ට සිටියේ නැති. වංගු සහිත කුඩා මාවතකට හැරුණ ඇයට අවසන නොම්මරයා සහ කව්කින්ට මුහුණ ලා සිටගෙන සිටි තිමූර් හමුවිණි.

'මෙහෙ බලනව.' ඇය කෙලින්ම ඔහු කරා යමින් කීවාය. 'තමුසෙට අනුන්ගෙ වතුවලට රිංගල ගස් කඩා දාල, වෙන එකක් තියා වයසක

ආච්චිල විතරක් නෙවෙයි අනාථ පුංචි ගෑණු ළමයින්ගෙ වතුවලට පැනලත් ඇතිවෙලා නෑ. තමුසෙව දකිනකොට බල්ලොත් බයවෙලා දුවනව දැකලත් තමුසෙ හැදිල නෑ. තමුසෙ මගෙ නංගිව රවට්ටගෙන යනව මඩිවට එයාව මාත් එක්ක තරහ කරවනවත් එක්ක. ඒ වුණාට මහලොකුවට බැඳගෙන ඉන්නෙ නං යෞවන පුරෝගාමීන්ගෙ ටයි එකක්. හැබැයි තමුසෙ නිකං තක්කඩියෙක් විතරයි!'

තිමූර් සුදුමැලිව ගියේය.

'ඒක ඇත්ත නෙවෙයි.' ඔහු කීය. 'ඔයා මේ කිසි දෙයක් දන්නෙ නෑ.'

නොඉවසිල්ල පල කරන අංග චලනයක් පෑ ඔල්ගා ජෙනී සොයා දිව ගියාය.

තිමූර් එහි සිටගෙන සිටියා මිස කිසිදු වදනක් දෙඩුවේ නැති.

සිදුවූ කිසිවක් වටහා ගත නුහුණු කව්කින් සහ නොම්මරයා නිහඬව බලා සිටියෝය.

'ඉතිං කොමිසාර්තුමා?' කව්කින් කතා කරන්නට ගති. 'තමුසෙටත් කෙලවෙන වෙලාවල් එනව වගේ.'

'එහෙම තමයි ලොක්කා.' හෙමිහිට සිය දෑස් ඔසවමින් තිමූර් කීය. 'දැන් නම් මගෙ හිතට හරි නෑ. තමුසෙල කරපු වැඩ වලට මෙහෙම බැණුම් අහනවට වඩා තමුසෙට අහුවෙලා ගුටිකාලා මැරෙන එක දාහෙන් සම්පතයි.'

'එහෙනං මොන එහෙකටද කට වහගෙන හිටියෙ.' කව්කින් විරිත්තීය. ''ඒවා කළේ අපි මිසක් තමුසෙ නෙවෙයි කියල කියන්න තිබුණනෙ. මොකද අපි මෙතනටම වෙලා හිටිය මිසක් පැනල ගියේ නෑනෙ.'

'ඇත්ත තමයි.' නොම්මරයාද මහත් සතුටින් එකඟ විය. 'අනික එහෙම කියල ඔත්තං අපි තමුසෙගෙ හොක්කට ඇන්න කියලත් කියන්න තිබුණනෙ.'

එහෙත් නොම්මරයාගෙන් මෙවන් ආකාරයේ උපකාරයක් අපේක්ෂා නොකළ කව්කින් සිය මිතුරා දෙස සැර බැල්මක් හෙලීය. මේ අතර තිමූර් හෙමිහිට එතනින් ඉවත පිය නගන්නට වූවේ එසේ යන අතර සිය අත්ලෙන් මග දිගට වූ ගස්වලට පහර දෙමිනි.

'මිනිහ ආඩම්බරකාරයා.' කව්කින් පහත් හඬින් කීවේය. ' මිනිහට ඇඬෙන්න එනව ඒත් පෙන්නන්නෙ නෑ.'

'අපි මිනිහට අඬන්න වැඩක් දෙමුකො.' තොම්මරයා කීවේය. එසේ කියනා ගමන් ඔහු ෆර් ගෙඩියකින් තිමූර්ට දමා ගැසීය.

'මිනිහ ආඩම්බරකාරයා.' කව්කින් යළිත් කීවේය. 'එතකොට උඹ, උඹ මහ ගඳයා.' එසේ කියූ ඔහු මිට මෙළවූ අත තොම්මරයා දෙසට දිගු කළේය.

කට බලියාගත් තොම්මරයා එකවරම විලාපයක් දුන්නේ දුවන්නට විණි. ඔහු පසුපස එලවා ගිය කව්කින් දෙවරක්ම ඔහුගේ පිටට පහර දුන්නේය.

අන්තිමේදී කව්කින් නතර විණි. ගිලිහී වැටුන සිය තොප්පිය අහුලාගත් ඔහු එය දණහිසෙහි ගසා දුහුවිලි හැර අයිස් ක්‍රීම් වෙළෙන්දකු කරා ගියේ අයිස් කෝන් එකක් මිලට ගෙන ගසකට හේත්තුවී හති දමමින් කෑදර කමින් එය කන්නට වූවේය.

ඈතට යමින් සිටි තිමූර් හට ගෙයිකා සහ සිමාකොව් හමුවිණි.

'තිමූර්.' සිමා කෑගැවේය. 'අන්න මාමා ඔයාව හොයනව. ජේන හැටියට නං එයාට හොඳටම කේන්ති ගිහිල්ලා.'

'මං දන්නව. මම මේ ගෙදර යනගමන්.'

'ඔයා ආයෙ එනවද?'

'මං දන්නෙ නෑ.'

'තිමූර්.' ගෙයිකා අනපේක්ෂිත සංවර කමක් පාමින් සිය මිතුරාගේ අත ගෙන කතා කළේය. 'මොකද වෙලා තියෙන්නෙ? අපි කාටවත් වරදක් කළේ නැනෙ. අනික ඔයා දන්නවනෙ මිනිහෙක් හරි......'

'ඔව් මං දන්නව. හරියට වැඩ කරන කෙනා ලෝකෙ කිසිම දේකට බය නෑ. හැබැයි එහෙම වුණා කියල එයාගෙ හිත නොරිදී තියෙන්නෙ නෑ.'

එසේ කියූ තිමූර් යන්නට ගියේය.

මේ අතර ජේනී සිය එකෝඩියනය රැගෙන නිවස බලා යමින් සිටි ඔල්ගා කරා දිව ගියාය.

'ඔල්ගා!'

'යනව යන්න!' ඔල්ගා සිය නැගණිය දෙස නොබලාම කෑ ගැවාය. 'මං තවත් ඔයා එක්ක කතා කරන්නෙ නෑ. මං මේ දැන්ම මොස්කව් වලට යනව. ඊට පස්සෙ ඔයාට කැමති කෙනෙක් එක්ක එළිවෙනකං රස්තියාදු ගහන්න පුළුවනි. මං නෙවෙයි ඇහැක් ඇරල බලන්නෙ.'

'ඒ වුනාට ඔල්ගා.....'

'මට ඔයත් එක්ක කතාවක් නෑ. අනිද්දට අපි ආයෙ මොස්කව් වලට යනව. අපි එහෙට වෙලා තාත්ත එනකම් බලා ඉන්නව. එච්චරයි.'

'ඔව්! මමයි තාත්තට කියන්නෙ ඔයා නෙවෙයි- මං එයාට හැමදේම කියන්නං.' කෝපය නිසා දෑසට කඳුලු පිරෙද්දී ඇය තිමූර් සොයා දිව ගියාය.

ඇයට ගෙයිකා සහ සිමාකොව් හමුවූ අතර ඇය ඔවුන්ගෙන් තිමූර් දුටුවේදැයි ඇසුවාය.

'එයාට ගෙදරින් අඬගහල ගියා.' ගෙයිකා කීවේය. 'එයත් එක්ක මොකක් හරි දෙයක් හින්දා එයාගෙ මාමට හොඳටම කේන්ති ගිහිල්ල ඉන්නෙ.'

දුන් හුදෙකලාව සිටි ජෙනී අත් මිටමොළවාගෙන කකුල් පොලවේ හැප්පුවාය.

'හොඳ වැඩේ උඹට.'

ඇය ඒ අසල වූ ෆර් ගසක කඳ දෑතින්ම බදා ගනිද්දී ටානියා සහ ඇනී ඇය කරා වහා දිව ආවෝය.

'ජෙනී!' ටානියා කෑගැවාය. 'මොකද වෙලා තියෙන්නෙ? මෙහෙ එන්න ජෙනී. එකෝඩියන් වාදකයෙක් ඇවිත් දැන් නැටුම් පටන්ගත්තා විතරයි. ගෑනු ළමයි ඔක්කොම එතන.'

ඇයගේ අතින් අල්ලා ඇදගෙන ඔවුහු ඇය අනෙක් ගැහැණු ළමුන් සිටි තැනට කැටුව ගියෝය. එහි මල් මෙන් දිස්වුණ ගවුම් සහ බ්ලවුසයන් එක පොදියට රවුමට කැරකෙමින් පැවතියේය.

'අඬන්න එපා ජෙනී!' දත්මිටි කාගත්වනම වුවද ඇනී වේගයෙන් එහෙත් සාමාන්‍ය හඬින් කියාගෙන ගියාය. 'අපේ අත්තම්මත් මට ඉඳල හිටල ගහනව. හැබැයි මම නං අඬන්නෙ නෑ. කෙල්ලනේ අපි ඇතුලට යමු. මෙන්න අපි එනවෝ!'

'යමු යමූමූ.....' ඇනී අනුකරණය කරමින් ජෙනීද සිනහ වෙන්නට ගත්තාය.

එහි රැස්ව සිටි පිරිසෙන් සැදි කවය බිඳගෙන ගිය ඔවුහුද අන් අය හා එක්ව නටන්නට පටන් ගත්තෝය.

තිමූර් නිවසට ආ වහාම මාමා ඔහු අල්ලා ගති.

'මට තමුසෙගෙ රාත්‍රී වීර ක්‍රියා ඇතිවෙලා!' ජෝර්ජ් කතාව ඇරඹීය. 'තමුසෙගෙ ඔය කෙහෙල්මල් සංඥා, කඹ ඔක්කොම ඇතිවෙලා. මොකක්ද අර පොරෝණාවක කතාව?'

'ඒක අත්වැරදීමක් විතරයි.'

'අත්වැරදීමක්! මං මේ තමුසෙට කියන්නෙ අර ගෑනු ළමටය පාඩුවෙ ඉන්න අරිනව. එයාගෙ අක්ක තමුසෙට කැමති නෑ.'

'ඇයි?'

'මං දන්නෙ නෑ. මං හිතන්නෙ තමුසෙට එහෙම තමයි සලකන්නත් ඕනැ. මොනවද මේ තමුසෙ ලියන තුණ්ඩු කෑලි? තමුසෙ මහ පාන්දර එළියෙ දාගන්න විශේෂ හමුවීම් මොනවද? ඔල්ගා කියන හැටියට තමුසෙ ඒ ගෑනු ළමයව නරක් කරනවළු.'

'එයා බොරු කියන්නෙ.' තිමූර් කෝපයෙන් කීවේය. 'ඒ වුණාට කොම්සොමොල් සාමාජිකයෙක්ලු. එයාට නොතේරෙන දෙයක් තිබුණ නං එයා කරන්න ඕනැ මගෙන් අහන එකනෙ. මං කියල දෙනවනෙ.'

'හොඳයි. හැබැයි එහෙම එයාට තේරුම් කරල දෙනකං තමුසෙට ඒ ගේ පැත්ත පලාතෙ යන්න තහනම්. අනික තමුසෙ මං කියන විදිහට වැඩ කරන්නෙ නැත්තං මං වහාම තමුසෙව අම්ම ළඟට යවනව.'

එසේ කියා ඔහු පිටතට යාමට හැරුණේය.

'මාමෙ.' තිමූර් ඔහු ඇමතීය. 'ඔයා පොඩි කොල්ල කාලෙ ඔයා මොනවද කළේ? මොනවද ඔයා කරපු සෙල්ලම්?'

'අපි? අපි දිව්වා පැන්නා වහලවල් වලට නැග්ගා. සමහර වෙලාවට අපි රණ්ඩු කළා. හැබැයි අපේ සෙල්ලම් හරිම සරලයි. කාට වුනත් ඒවා තෙරෙනව.'

ජෙනී හට දඬුවම් කරනු පිණිස ඔල්ගා එදාම සවස තවත් ඇයට වදනක් හෝ නොපවසා මොස්කව් බලා පිටත් වූවාය.

ඇයට මොස්කව් හී කරන්නට කිසිදු කාර්යයක් තිබුණේ නැති. එහෙයින් කෙලින්ම නිවෙසට යනු වෙනුවට ඇය තම යෙහෙළියක්ගේ නිවෙස බලා ගියාය. අවසානයේදී ඇය නිවෙසට එනවිට දහය පමණ වී තිබූ අතර ඇය නිවසේ දොරට අමුණා තිබූ ටෙලිග්‍රාෆ් පණිවුඩයක් දුටුවාය.

ඔල්ගා ඒ කෙටි පණිවුඩය කියවූවාය. එය ඇගේ පියාගෙනි.

සන්ධ්‍යාව එළඹී වැන් රථ උද්‍යානයෙන් පිටව යන්නට පටන් ගනිද්දී ජෙනී සහ ටානියා නිවෙස් බලා දිවුවෝය. ජෙනී හට අවශ්‍යව තිබුණේ වොලිබෝල් ක්‍රීඩාවට සහභාගිවීම පිණිස ක්‍රීඩා සපත්තු යුවළක් පැළඳ ගැනීමටය.

ඇය තම සපත්තුවේ ලේස් පටිය ගැටගසනා විට පැහැපත් හිස කෙස් සහිත කුඩා දැරියගේ මව කාමරයට ඇතුළු වූවාය. කුඩා දැරිය ඇගේ දැතේ නින්දේ පසුවූවාය.

ඔල්ගා නිවසේ නොමැති බව දැනගත් මොහොතේදී කාන්තාවගේ මුහුණ මැලවී ගියේය.

'මං මෙහෙට ආවෙ ඔයාගෙ අක්කට මගෙ කෙලි පොඩ්ඩිව තියාගන්න පුළුවන්ද කියල අහන්නයි.' ඇය කීවාය. 'ඒත් එයා ගෙදර නෑ කියල මං දැනගෙන හිටියෙ නැතෙ. කෝච්චිය අද රෑ එනව. ඔයාට පේනවනෙ මං මගෙ අම්මව මුණගැහෙන්න මොස්කව්වල ඉන්න ඕනැ.'

'ඉතිං එයාව මගෙ ළඟ තියල යන්න.' ජෙනී කීවාය. 'ඔල්ගා නොහිටියට මොකද- මං හොඳ නැද්ද? මෙයාව මගෙ ඇඳෙන් තියන්න. මට අනිත් ඇඳේ නිදාගන්න පුළුවන්නෙ.'

'දැන් එයා හොඳටම නිදි. ආයෙ හෙට එළිවෙනකං එයා නැගිට්ටෙ නෑ.' සිය මුහුණට එළිය වැටෙද්දී මව කීවාය. 'ඔයාට කරන්න තියෙන්නෙ සැරෙන් සැරේ පොඩ්ඩක් එයා ගැන බලල කොට්ටෙ හරිගස්සන එක විතරයි.'

කුඩා දැරියගේ ඇඳුම් මාරු කර ඔවුහු ඇය ඇඳ මතින් තැබුවෝය. ඉන්පසු ඇගේ මව පිටව ගියාය. පිටත සිට තමන්ට ඇඳ දෙස බැලීමට හැකිවන සේ ජනෙල් තිරය ඇද්ද ජෙනී දොර වසා දැම්මාය. ඉන්පසු මාරුවෙන් මාරුවට දැරිය ගැන බැලීමට පැමිණීමට එකඟ වෙමින් කෙල්ලෝ දෙදෙන වොලිබෝල් ක්‍රීඩාව පිණිස දිවුවෝය.

ඔවුන් පිටත්ව ගිය සැණින් තැපැල්කරුවා නිවස කරා පැමිණියේය. බොහෝ වේලාවක් දොරට තට්ටු කරමින් පසුවූ ඔහු කිසිවකුත් ඊට පිළිතුරු නොදුන් හෙයින් නිවසේ පදිංචිව සිටි අය නැවත නගරය බලා ගොසින්දැයි දැන ගැනීම පිණිස අසල්වැසි නිවසට ගියේය.

'නෑ.' අසල්වැසියා කීවේය. 'ගෑනු ළමය මේ දැන් ඩිංගකට කලින් හිටියනෙ. මං එයාට ඔය විදුලි පණිවුඩේ දෙන්නං.'

අත්සන් කර විදුලි පණිවුඩය භාරගත් අසල්වැසියා එය තම සාක්කුවේ රුවා ගත්තේ බංකුවක් මත හිඳගෙන පයිප්පය දල්වා ජෙනී එනතුරු බලා සිටින්නට වූවේය.

ඉන් හෝරා එකහමාරකට පසුව තැපැල්කරුවා නැවතත් එහි පැමිණියේය.

'මෙන්න තවත් එකක්.' ඔහු කීවේය. 'මොන එහෙකටද මේ තරං කලබලයක්? අනේ හොඳ එක්කෙනා වගේ මේකත් අත්සන් කරල බාරගත්තනං.'

අසල්වැසියා පොතෙහි අත්සන තැබීය. ඒ වන විට හොඳටම අඳුරුවැටී හමාරය. ගේට්ටුව විවෘත කළ ඔහු යාබද නිවසෙහි ඉදිරි පඩිපෙල නැග ජනේලයෙන් ගෙතුලට එබිකම් කළේය. එහි කුඩා දැරියක් නිදමින් පසුවූවාය. ඇගේ හිස අද්දර අසලම තැඹිළි පැහැ බැළලියක්ද ගුලිව සිටියාය. එහි අරුත නිවසේ උදවිය එතරම් ඈතක ගොස් නැති බවයි. එහෙයින් ජනේලයේ ඉහල පියන විවෘත කළ ඔහු විදුලි පණිවුඩ දෙකම එතුළින් රිංගවීය. ඒවා ඉතා කදිමට ජනෙල් පඩිය මත පතිත විණි. ජෙනී එක්වරම ඒවා දකිනු නිසැකය.

එහෙත් ජෙනී ඒවා දුටුවේ නැති. නිවසට පැමිණි ඇය සඳ එළියේ ආධාරයෙන් දැරියගේ කොට්ටය හරිගස්සා බැළලියද එතනින් පන්නා දමා ඇඳුම් මාරු කර ඇඳට ගියාය. එසේ ඇය ජීවිතය ගැන කල්පනා කරමින් බොහෝ වේලාවක් අවදියෙන් පසුවූවාය. මෙය ඇගේ වරද නොවේ. පෙනෙන හැටියට ඕල්ගාගේ වරදද නොවේ. නමුත් දෙදෙනාම තමන් අතර වූ ප්‍රථම දරුණු රණ්ඩුවට පැටලී සිටියෝය.

ජෙනී ගේ සිතට දුකක් දැණුනි. ඇයට කෙසේවත් නින්ද ගියේ නැති. ඇය ජෑම් තවරා පාන් කෑල්ලක් කන්නට තීරණය කළාය. ඇඳෙන් බිමට පැන්න ඇය කබඩය කරා දිව ගියා විදුලි පහන දැල්වූ අවස්ථාවේදී ජනෙල් පඩිය මත වූ විදුලි පණිවුඩ දුටුවාය.

ඇයට දැණුනේ තම හදගැස්ම නතර වන්නට යන සෙයකි. වෙවුලන ඇඟිලි වලින් ඇය විදුලි පණිවුඩ විවෘත කළාය.

ඉන් පළමුවැන්නෙන් කියවුණේ මෙයයි:

'ගමනක් යන අතර රෑ දොළහේ ඉඳල තුන වෙනකං ගෙදර ළඟ බහිනවා. මං එනකං ගෙදර ඉන්න.'

දෙවැන්නෙන් කියවුණේ මෙයයි:

'වහාම ගෙදර එන්න. තාත්තා අද රෑ මෙහෙ එනවලු. ඔල්ගා.'

ජෙනී සැලෙන හදින් ඔරලෝසුව දෙස බැලුවාය. ඒ වන විටත් වෙළාව දොළහට කාලකි. වහා ඇඳුම් ඇඳගෙන නිදන දූරියද වඩාගත් ජෙනී පරල වූ එකියක පරිද්දෙන් ආලින්දයට දිව ගියාය. එහෙත් ඒ සමගම ඇය සිත වෙනස් කරගත්තාය. නැවතත් දූරිය ඇඳ මත තැබූ ඇය නිවසින් පිටට දිව කිරිකාරියගේ නිවෙස කරා දිවුවාය. කිරිකාරියගේ අසල්වැසිනිය ජනෙලයෙන් හිස පිටට රුවා බලන තෙක්ම ඇය මිට මෙලවූ අතින් සහ පයින් දොරට ගසන්නට වූවාය.

'මොන ඒහෙකටද ඔය දොරට තඩිබාන්නෙ?' නිදිබර හඬින් අසල්වැසිනිය ඇසුවාය. 'ඔයා මොනවටද මේ ආරදින්නෙ?'

'අනේ මං මොනවටවත් අරාදිනව නෙවෙයි.' ජෙනී පින්සෙන්ඩු වූවාය. 'මට කිරි නැන්දා මාෂාව මුණගැහෙන්න ඕනැ. මට පුංචි දරුවෙකුව එයා ළඟ තියල යන්න ඕනැ.'

'විකාර!' මහ හඬින් සිය ජනේලය වසා දමමින් අසල්වැසිනිය කෑගැවාය. 'නාකි උන්දූ අද පාන්දරම ගමේ ඉන්න එයාගෙ සහෝදරයව බලල එන්න ගියා.'

දුම්රිය නැවතුම් පලට ඇදී එමින් තිබූ දුම්රියකින් නලා හඬ පිට වූවේය. පාරට දිව ගිය ජෙනී වියපත් මහතකු එනම් වෛද්‍යවරයාගේ ඇගේ හැපුණාය.

'සමාවෙන්න!' ඇය හති දැම්මාය. 'කරුණාකරල මට අර කෝච්චිය මොකක්ද කියල කියනවද?'

වියපත් මහතා සිය අත්ඔරලෝසුව දෙස බැලීය.

'එකොළහයි පනස් පහ.' ඔහු පිළිතුරු දුන්නේය. 'මොස්කව් වලට යන අන්තිම කෝච්චිය.'

'ඔයා කොහොමද අන්තිම එක කියල කියන්නෙ?' සිය උගුරේ මොනවාදෝ සිරවෙන්නාක් මෙන් දනෙද්දී ජෙනී ඇසුවාය. 'ඊළඟ කෝච්චිය කීයටද තියෙන්නෙ?'

'ඊළඟ කෝච්චිය පිටත් වෙන්නෙ උදේ තුනයි හතලිහට. ඔයාට මොකද දරුවො වෙලා තියෙන්නෙ?' ඇඹරෙමින් සිටි ගැහැණු ළමයාගේ දෙවුරින් අල්ලා ගනිමින් වියපත් මහතා සුහද ලෙස ඇසීය. 'ඔයා අඬනවද? මට පුළුවන්ද මොනව හරි උදව්වක් දෙන්න?'

'බෑ, බෑ, ඔයාට බෑ.' සිය කඳුළු වලකාගෙන වහා ඉවත්ව යන ගමන් ජෙනී කීවාය. 'දැන් නං මේලෝකෙ ඉන්න කාටවත්ම මට උදව් කරන්න බෑ.'

නිවෙසට ගිය ඇය ඇඳට වැටුණා ඊළඟ මොහොතේදී නැවත නැගිට නිදනා දූරිය දෙස බැලුවාය. නැවත හිඳ දිරිමත් කරගත් ඇය දූරියගේ පොරෝණාව සකසා බැළලියද කොට්ටය මතින් එලවා දැම්මාය. ආලින්දයෙහි, මුළුතැන්ගෙයෙහි සහ විසිත්ත කාමරයෙහි පහන් දැල්වූ ඇය සෝපාව මත හිඳගෙන හිස වනන්නට වූවාය. විශේෂයෙන් යමක් පිළිබඳව කල්පනා නොකර ඇය බොහෝ වේලාවක් එලෙස හිඳ සිටියාය. ඒ අතර හදිසියේම ඇගේ අත ඒ අසල වූ එකෝඩියනයෙහි වැදුණි. ඉබේටම මෙන් එය අතට ගත් ඇය එහි යතුරු පිරිමදින්නට වූවාය. ඉන් විහිදී ගිය දුක්බර හඬකින් කාමරය පිරී ගියේය. වහා එකෝඩියනය පසෙක තැබූ ඇය ජනේලය කරා ගියාය. එවේලේ ඇගේ දෙවුර ගැහෙමින් පැවතියේය.

නැත! ඇයට තවත් නම් මෙසේ හුදෙකලාවෙහි හිඳගෙන මේ වදය උහුලා සිටිය නොහැකිය. ඉටිපන්දමක් දල්වාගත් ඇය ගෙවත්ත හරහා මඩුව දෙසට ඇදුණාය.

ඒ මඩුව තුළ කඹ, සිතියම්, ගෝනි සහ කොඩි එහෙමම තිබුණේය. ලන්තෑරුම දැල්වූ ඇය රෝදය කරා ගියා කඹ කොණ එහි අමුණා රෝදය ගස්සා කරකැවූවාය.

රීටා සිය ඉදිරි ගාතයෙන් තමන්ගේ උරහිස පහුරු ගානා විට තිමූර් තද නින්දේ පසුවූවේය. ඔහුට ඒ මුදු ස්පර්ශය දැනුනේ නැති. රීටා ඉන්පසු සිය දතින් අල්ලා පොරෝණාව බිමට ඇද දැමුවාය.

ඒ සමග තිමූර් නැගිට ඇඳ මත හිඳ ගති.

'මොකද වෙලා තියෙන්නෙ?' වියවුලට පත් ඔහු ඇසීය. 'මොනව හරි ප්‍රශ්ණයක්ද?'

ඔහු දෙස බලාගත්වනම බැල්ලිය වල්ගය වනන්නට වූවා හිසද ගැස්සුවාය. ඒ අවස්ථාවේදී පිත්තල සීනු නාදය තිමූර්ගේ සවන් වැකුණේය.

වහා ආලින්දයට දිව ගිය ඔහු රිසීවරය අතට ගත්තේ රාත්‍රියෙහි මේ වෙලාවට කතා කරනා පුද්ගලයා කවුදැයි කල්පනා කරමිනි.

'හෙලෝ. තිමූර් සවන් දෙමින් ඉන්නෙ. කවුද මේ අමතන්නෙ? ජෙනී ඒ ඔයාද?'

මුලදී තිමූර් ඉවසිල්ලෙන් සවන් දුන්නේය. අනතුරුව ඇඹරෙන්නට ගත් ඔහුට සිය මුහුණට ලේ පුරා එනු දැණිනි. දැන් ඔහු සිටියේ තදින් හුස්ම ගනිමිනි.

'ඒ කියන්නෙ තව පැය තුනක් විතරයි?' ඔහු චකිතයෙන් ඇසීය. 'ජෙනී ඔයා අඬනවද? මට ඔයා කියන දේ ඇහෙනව- ඔයා අඬනව තමයි. අඬල හරියන්නෙ නෑ. අඬන්න එපා, මං මේ දැන්ම එනව.'

වහාම රිසීවරය තැබූ ඔහු රාක්කයෙන් කාල සටහනක් ඇද ගති.

'ඔව්, මේ තියෙන්නෙ , අන්තිම කෝච්චිය 23.55 ට. ඊළඟ එක පිටත් වෙන්නෙ පාන්දර 3.40ට.' ඔහු දෙතොල සපාගත්වනම එහි බලා සිටියේය. 'හොඳටම පරක්කුයි. මොකුත්ම කරන්න බැරිද? බෑ. හොඳටම පරක්කුයි.'

එහෙත් ජෙනීගේ නිවසෙහි ගේට්ටුවෙහි දිවා රෑ දෙකෙහිම රතු තරුවක් එල්ලෙමින් පැවතියේය. සියතින්ම එය ඇන්දේ ඔහුය. දැන් එය ඔහුගේ දෑස් ඉදිරිපිට දිදුලන්නට විය.

හමුදා නිලධාරියකුගේ දියණියක් කරදරයක වැටී සිටින්නීය. හමුදා නිලධාරියකුගේ දියණියක් උපකාර අවශ්‍ය තත්වයක පසුවන්නීය.

වහාම ඇඳුම් හැඳගත් ඔහු නිවසින් පිටවිණි. මිනිත්තු කිහිපයක් ගෙවෙද්දී ඔහු සිටියේ මහළු මහතාගේ නිවසෙහි දොරකඩය. වෛද්‍යවරයාගේ කාමරයෙහි එවිටද ආලෝකය දැල්වෙමින් පැවතිණි. තිමූර් දොරට තට්ටු කළේය. විස්මයපත් වෛද්‍යවරයා විසින් දොර විවෘත කරනු ලැබිණි.

'මේ මොකද?' ඔහු වියලි හඬින් ඇසීය.

'මට ඔයත් එක්ක කතා කරන්න ඕනැ.' තිමූර් කීය.

'මගෙත් එක්ක?' මද වේලාවක් කල්පනා කළ මහළු මහතා අනතුරුව දොර සම්පූර්ණයෙන්ම හැරදමා මෙසේ පැවසීය. එහෙනං ඇතුලට එන්න.'

එහෙත් ඔවුන් වැඩි වේලාවක් කතා කරමින් පසුවූයේ නැති.

'අපි කලේ අන්න ඒ වගේ දේවල්.' තිමූර් දිදුලන දෑසින් කතා කරන්නට විණි. 'අපි කළේ අන්න එච්චරයි. ඒක තමයි අපි කරපු සෙල්ලම. මට මේ දූන් ඔයාගෙ නික්ව මුණගැහෙන්න ඕනැ අන්න ඒ නිසයි.'

මහළු මහතා වදනකුදු නොදොඩා නැගී සිටියේය. එක්වරම තිමූර්ගේ නිකටින් අල්ලා මදක් ඔහුගේ හිස පසුපසට තල්ලු කර දෑමූ මහළු මහතා තිමූර්ගේ දෑසට එබී බලා කාමරයෙන් පිටවුණේය.

නික්ගේ නිදන කාමරයට ඇතුළු වූ ඔහු නිදා සිටින කොලුවාගේ දෙවුරින් අල්ලා සෙලවීය.

'නැගිටිනව.' ඔහු කීය. 'නැගිටල එනව.'

'මං කිසි වරදක් කළේ නෑ.' බියෙන් දෑස් කරකවමින් නික් ගොත ගැසීය. 'ඇත්තමයි සීයෙ, මං කිසි වරදක් කළේ නෑ.'

'නැගිටිනව කිව්වහම.' මහළු මහතා කෙටියෙන් කීවේය. 'තමුසෙගෙ සගය අන්න තමුසෙව හොයාගෙන ඇවිත්.'

ජෙනී මඩුවෙහි පිදුරු ගොඩක් මත හිඳ සිටියාය. ඇගේ දෑත් දෙදණ වටා පැටලැවී ගොසිනි. ඇය බලා සිටියා තිමූර් පැමිණෙන තුරුය. එහෙත් තිමූර් වෙනුවට ජනෙල් කවුළුව තුළින් එබුණේ නික්ගේ කැරළි කැරළි කොණ්ඩය සහිත හිසය.

'ඔයා?' ජෙනී කෑගෑවාය. 'ඔයා මොකද මේ?'

'මං දන්නෙ නෑ.' නික් බියපත් ස්වරයකින් පැවසීය. 'මං නිදාගෙන හිටියෙ. එයා ආවා. මං නැගිට්ටා. එයා මාව මෙහාට එවුවා. ඔයාට ගේට්ටුව ළඟට එන්න කියල කියන්න කිවුවා.'

'මොකටද?'

'මං දන්නෙ නෑ. මට හොඳටම නිදිමතයි. මට නං මේකෙ මුලක් අගක් තේරෙන්නෙ නෑ ජෙනී.'

අවසර ගැනීම සඳහා එහි කිසිවෙක් සිටියේ නැති. ඔහුගේ මාමා ඒ වනවිට සිටියේ මොස්කව්හිය. ලන්තෑරුමක් දල්වාගත් තිමූර් පොරවක්ද ගෙන බැල්ලටද කතා කර ගෙවත්තට ගියේය. මඩුවෙහි දොර අසලට ගිය ඔහු එහි නතර වීය. ඔහුගේ දෑස් පොරව වෙතින් දොරට දමා තිබූ ඉබ්බා වෙත මාරුවිණි. ඔව්! එය වැරදි ක්‍රියාවක බව ඔහු දනී. එහෙත් අන් කිසිදු විකල්පයක් ඉතිරිව නැති. හොඳින් ඉලක්කය ගත් ඔහු ඉබ්බාට පොරවෙන් පහරක් එල්ල කළේ දොර විවර කර යතුරු පැදිය මඩුවෙන් පිටතට තල්ලු කරගෙන ආවේය.

'රීටා!' බැල්ලගේ හොම්බ ඉඹින්නට දණගසා ගනිමින් ඔහු දුක්බරව කෑගෑවේය. 'කේන්ති ගන්න එපා. මට වෙන කරන්න දෙයක් තිබුණෙ නෑ.'

ජෙනී සහ නික් ගේට්ටුව අසල බලා සිටියෝය. දුරින් එක්වරම ඔවුන් මත ආලෝක දහරාවක් පතිත වූවේය. ඒ සමග යතුරු පැදියක එන්ජිමෙහි හඬද ගලා ආවේය. ගිනිකන වට්ටන ආලෝක දහරාව දෑස් වලට වැදුනෙන් ඔවුහු දෑස් සිහින් කරගෙන වැටට හේත්තු වූවෝය. එක්වරම ආලෝකය නිවී ගියේය. එන්ජිමද නතර විණි. ඔව්හු පැමිණ සිටින්නා තිමූර් බව ඒ අවස්ථාවේදී හඳුනාගත්තෝය.

'නික්.' අනෙක් අයට ආමන්ත්‍රණය කිරීමකින් හෝ ප්‍රශ්ණ ඇසීමකින් තොරව ඔහු කෙලින්ම කතාව ඇරඹීය. 'ඔයා මෙහෙ නතර වෙලා ගෙදර නිදා ඉන්න පුංචි නංගිව බලාගන්න ඕනැ. එයා ගැන ඔයා

අපේ කට්ටියට වගකියන්න ඕනැ. ජෙනී නගින්න. අපි පිටත්වෙන්නයි හදන්නෙ. මොස්කව්වලට!'

මහත් සතුටින් හඬනැගූ ජෙනී මුලු වැර යොදා තිමූර් වැළඳගෙන ඔහුට හාදුවක් දුන්නේය.

'නගින්න ජෙනී, නගින්න!' දැඩි බවක් පාන්නට තැත් දරමින් තිමූර් කෑගැවේය. 'හයියෙන් අල්ලගන්න! ඔන්න අපි යනවා! හරි!'

එන්ජිමෙන් හඬ නැගුණේය. නළාවඳ නාද විණි. ඉක්මනින්ම රතු පැහැ පිටුපස පහනේ ආලොකය නොපෙනී ගියේය.

එහෙම පිටින්ම අන්දුන් කුන්දුන්ව ගිය තික් කෝට්ටුවක් අතට ගෙන රයිෆලයක් මෙන් අමෝරාගත්තේ හොඳින් ආලෝකවත්ව පැවති නිවෙස වටා ඇවිදින්නට වූවේය.

'ඔව්.' ඒ පැත්තට සහ මේ පැත්තට පිය මනිමින් ඔහු කෙඳිරීය. 'සොල්දාදුවෙකුගෙ ජීවිතේ හරිම අමාරු තමයි. දවල් රෑ කියල වෙනසක් නෑ. කිසිම සහනයක් නෑ.'

උදෑසන තුනට ලඟාවෙමින් පැවතියේය. සලාමි සොසේජස් කැබලි කිහිපයක්, චීස්, පාන් සහ ඇල්ව ගිය තේ පෝච්චියක් තබන ලද මේසයක් අසල කර්නල් ඇලෙක්සැන්ඩ්‍රොව් හිඳ සිටියේය.

'මං තව පැය භාගෙකින් යන්න ඕනැ.' ඔහු ඔල්ගාට කීවේය. 'අපරාදෙ මට ජෙනීව දැකගන්න වෙලාවක් ලැබිච්ච නැති එක. ඔල්ගා ඔයා අඬනව නේද?'

'එයා ආවෙ නැත්තෙ ඇයි කියල මට තේරෙන්නෙ නෑ. මට එයා ගැන හරිම දුකයි. එයා ඔයාව දැකගන්න හරිම ආශාවෙන් හිටියෙ. දැන් ඉතිං එයාට පිස්සු හැදෙයි. කොහොමත් එයාට නං පිස්සු තමයි.'

'ඔල්ගා.' ඇගේ පියා නැගිටිමින් කතා කළේය. 'ඔයා මොනව කිවුවත් ජෙනී නරක රංචුවක් එක්ක එකතු වෙයි කියල මට විශ්වාස කරන්න බෑ. එහෙමත් නැත්නං එයා රස්තියාදුවට වැටෙයි කියලවත් වෙන කාටවත් එයාට එහෙම කරන්න අණ දෙන්න පුළුවන්වෙයි කියලත් මං හිතන්නෙ නෑ. නෑ! එයා එහෙම තාලෙ කෙනෙක් නෙවෙයි.'

'ඔය කියන්නෙ.' ඔල්ගා දොස් පවරන තියායෙන් කීවාය. 'ඔයා ඊළඟට එයාටම එහෙම කියයි. මං දැනටමත් ඇතිවෙනකං අහල තියෙනවනෙ එයා යන්නෙ ඔයාගෙ ආරෙට කියල. හැබැයි මෙදා පාර නං ඔයාට වැරදිලා. එයා දුම් කවුළුවෙන් කඹයක් පහලට දායි කියල ඔයා විශ්වාස කරනවද? මං රෙදි මදින්න ගත්ත ගමන් ඉස්ත්‍රික්කෙ මගෙ අතින් පැනල මෙන්න දුම් කවුළුව දිගේ උඩට යනව. තාත්තෙ, ඔයා යනකොට ජෙනීට ගවුම් හතරක් තිබුණා. දැනටමත් දෙකක් රැල් වෙලා. තුන්වෙනි එක එයාට මදි. මං හතරවෙනි එක නං එයාට අඳින්න දෙන්නෙ නෑ. මං එයාට අලුත් ගවුම් හතරක් හදල දුන්න. ඒත් ඒවා දවස් කීපෙකට වඩා තිබුණෙ නෑ. හැම වෙලාවෙම එයාගෙ ඇඟ පුරා සීරිච්ච තැලිච්ච් පැල්ලම්.'

'අනික ඔන්න එයාට කතා කරන්න ගත්තගමන් එයා කරන්නෙ කට අකුලගෙන ඇස්දෙක පලල් කරල බලන්න ගන්න එක. හැමෝම හිතන්නෙ එයා හරිම ලස්සන මලක් කියල. ගෑනු ළමයෙක් කියල නෙවෙයි. හැබැයි එයාට කිට්ටු කරල බලන්න එපායැ. මාර මලක් තමයි. හරියට කටු අත්තක් වගෙයි. තාත්තෙ ඔයා හිතන්නෙ එයා ඔයාගෙ ආරෙට යනව කියල නේද? ඔයා එයාට ඕක කිවුවොත් එයා දවස් තුනක්ම දුම් කවුළු වටේ නට නටා ඉඳියි.'

'හරි, හරි.' ඔල්ගා වැළඳ ගනිමින් පියා කීවේය. 'මං එයාට අවවාද කරන්නංකො. මං පස්සෙ එයාට ලියුමක් එවන්නං. හැබැයි ඔල්ගා ඔයා එයාට ඕනවට වඩා සැරට ඉන්න එපා. මං එයාට හරියට ආදරෙයි කියන්න. මං එයා ගැන හැම වෙලාවෙම හිතනව කියන්න. ඉක්මනටම අපිට ආයෙ එකතු වෙන්න ලැබෙන නිසා අඬන්නෙ නැතුව ඉන්න කියන්න. අඬල හරියනවයැ, මොකද එයා හමුදා නිලධාරියෙකුගෙ දුවක්නෙ.'

'මොනව කිවුවත් එයා අඬයි.' පියාට තුරුළු වෙමින් ඔල්ගා කීවාය. 'ඉතිං මමත් නිලධාරියෙකුගෙ දුවෙක්නෙ. මේ මාත් අඬන්නෙ.' ඇගේ පියා ඔරලෝසුව දෙස බැලීය. කැටපත අසලට ගිය ඔහු සිය ඉණ පටිය බැඳ ටියුනික් කබාය හරිගස්සා ගත්තේය.

හදිසියේම ඉදිරි දොර මහ හඬින් ඇරී යළි වැසී ගියේය. තිර රෙදි දෙපසට ඇදී ඒ අතරින් ජෙනීගේ රුව මතුවූවේ ඉදිරියට ඉදිරියට පනින්නට තැත් දරනා විටක මෙන් ඇගේ දෙවුර හැකිළී ගියේය.

එහෙත් හඬාවැටෙනු නැතිනම් ඉදිරියට පනිනු වෙනුවට ඇය කාමරය හරහා නිහඬව ඇදී ආවා කිසිදු හඬක් නොනගා සිය පියාගේ ළයෙහි මුහුණ හොවා ගත්තාය.

ඇගේ නළලෙහි මඩ තැවරී ගොසිනි. පොඩිව ගිය ඇඳුම පුරාද පැල්ලම් දක්නට ලැබිණි.

'ජෙනී මොකක්ද මේකෙ තේරුම?' ඔල්ගා වියවුලට පත්ව ඇසුවාය. 'ඔයා කොහොමද ආවෙ?'

සිය හිස හරවන්නේවත් නැතිව ජෙනී මෙසේ කියන්නාක් මෙන් අත වැනුවාය. 'ටිකක් ඉන්න! මට පාඩුවෙ ඉන්න දෙන්න! මගෙන් ප්‍රශ්ණ අහන්න එන්නෙපා!'

ඇයව තමන් සමීපයට ගත් පියා සෝෆාවෙහි හිඳගෙන ඇය තම උකුලට ගති. අනතුරුව ඇයගේ මුහුණ දෙස බැලූ ඔහු සිය අත්ලෙන් ඇගේ නළල මත තැවරී තිබූ මඩ පිසදැමීය. 'බොහොම හොඳයි ජෙනී! හොඳ කෙල්ල.'

'ඒ වුණාට ඔයාව මඩෙන් නැවිලා. ඔයාගෙ මූණ කලු පාට වෙලා. ඔයා කොහොමද මෙහෙට ආවෙ?' ඔල්ගා නැවතත් ඇසුවාය.

ජෙනී එවිට දොර දෙස අත දිගු කළාය. ඒ දෙස බැලූ ඔල්ගා තිමූර් එහි සිටගෙන සිටිනු දිටීය.

ඔහු සිටියේ යතුරු පැදිය පදිනා විට පළඳින අත්වැසුම් ඉවත් කරමිනි. ඔහුගේ නළලෙහි කහ පැහැති ග්‍රීස් තැවරී තිබිණි. ඔහුගේ මුහුණ තෙත්බරය. එසේම එය විඩාබරය. එය සිය කාර්යය මැනවින් ඉටුකළ කම්කරුවකුගේ බඳුය. ඔහු ඔවුන්ට සුභ පතන්නාක් මෙන් හිස වැනීය.

'තාත්තෙ!' සිය පියාගේ උකුලෙන් බිමට පැන තිමූර් කරා දිව යමින් ජෙනී කෑගැවාය. 'ඔයා කවුරුවත් කියන ඒවා පිළිගන්න එපා! එයාල කිසි දෙයක් දන්නෙ නෑ. මේ ඉන්නෙ තිමූර්. මගෙ හොඳම සහෝදරයා.'

ඇගේ පියා හුන් තැනින් නැගිට කිසිදු චකිතයකින් තොරව තිමූර් හට අතටත දුන්නේය. ඒ සමග ජෙනී ගේ මුහුණ මත ජයග්‍රාහී මදහසක් ඇඳී ගියේය. ඇය ඔල්ගා දෙස ක්ෂණික බැල්මක් හෙළුවාය. තවමත් තක්කු මුක්කුව සිටි ඔල්ගා තිමූර් කරා ගියාය.

'හොඳයි. එහෙනං ඉතිං.... හලෝ....'

ඉක්මනින්ම තුනේ කණිසම නාද වීය.

'තාත්තෙ.' ජෙනී සංකාසහගතව කතා කළාය. 'ඔයා යන්නද හදන්නෙ? අපේ ඔරලෝසුව ඉක්මනින් යනව.'

'නෑ ජෙනී, වෙලාව හරි.'

'තාත්තෙ ඔයාගෙ අත් ඔරලෝසුවත් ඉක්මනින් යනව.' දුරකථනය කරා ගිය ඇය වෙලාව දැනගැනීමට අංකය කරකැවූවාය. ඒ සමගම ඒකතානමය, දැඩි ස්වරයකින් පිළිතුරු ලැබිණි.

'දැන් වෙලාව තුන පසුවී මිනිත්තු තුනයි.'

බිත්ති ඔරලෝසුව දෙස බැලූ ජෙනී සුසුමක් හෙළුවාය.

'ඉක්මන් තමයි, හැබැයි එක මිනිත්තුවයි. තාත්තෙ අපිවත් ස්ටේෂන් එකට එක්ක යන්න. ඔයා යනව බලන්න අපිත් එන්න ඕනැ.'

'කනගාටුයි ජෙනී, ඒක කරන්න බෑ. මට වැඩ ගොඩක් තියෙනව.'

'ඇයි? ඔයා දැනටමත් ඔයාගෙ ටිකට් එක අරගෙනනෙ. නැද්ද?'

'ගත්තා තමයි.'

'පළමු පංතියෙ නිදන මැදිරියක?'

'ඔව්, පළමු පංතියෙ නිද මැදිරියක.'

'ඔහ්, අනේ මාත් දුර යන්න මොන තරං ආසද. පළමු පංතියෙ නිදන මැදිරියක ඔයත් එක්ක දුර, දුරම ගමනක් යන්න.'

ඒ සාමාන්‍ය දුම්රිය ස්ථානයක් නොවේ. බැහැර සිට පැමිණෙන දුම්රිය නියම මාර්ගයට මාරුවීම සඳහා කටයුතු සලසනු ලබනා මං සන්ධියකි. එහි දුම්රිය මාවත්, පීලි මාරු කරන ස්ථාන, දුම්රිය සහ දුම්රිය මැදිරි යන මේ සියල්ලම තිබුණද මගීන් සිටියේ නැති. හමුදා දුම්රියක් වේදිකාව කරා පදවාගෙන එනු ලැබිණි. යකඩ කවුළුවක් විවර වී එක් තත්පරයකට දුම්රිය රියදුරාගේ මුහුණ දිස්වූවේය.

කර්නල් ඇලෙක්සැන්ඩ්‍රොව් එනම් ජෙනී ගේ පියා සිය හම් කබායෙන් සැරසී පදික වේදිකාව මත සිටගෙන සිටියේය. ඔහු කරා පැමිණි ලුතිනන්වරයෙක් හමුදා ආචාර පිරිනමා කතා කළේය.

'කර්නල් සහෝදරයා, අපි ගමන අරඹමුද?'

'ඔව්.' කර්නල්වරයා අත් ඔරලෝසුව දෙස බැලීය. වෙලාව තුනයි පනස් තුනයි. 'අපිට පිටත් වෙන්න නියෝග තියෙන්නෙ තුනයි පනස් පහට.'

සිය මැදිරිය කරා ගිය කර්නල්වරයා වටපිට බැලීය. ආලෝකය වැටෙමින් පැවතියද අහස තවමත් වලාවෙන් බරය. ඔහු තෙත්ව පැවති දොර හැඬලය අල්ලා කරකැවීය. බරැති දොර විවර විණි. සිය පය පාපුවරුවෙහි තබන ගමන් මදහසක් පෑ ඔහු තමාටම මෙසේ කියා ගති.

'පළමු පංතියෙ නිදන මැදිරියක?'

'ඔව්, පළමු පංතියෙ නිදන මැදිරියක.'

උස් හඬක් නගමින් බරැති යකඩ දොර ඔහු පිටුපසින් වැසී ගියේය.

කිසිදු කිරි කිරියක් නොනගා, ගැස්සීමකින් තොරව ඉතා කදිමට යෝධ හමුදා දුම්රිය සිය ගමන් වේගය වැඩි කරමින් ගමන ඇරඹීය.

ඒ සමග එන්ජිම පසුවී ගියේය. ඉන්පසු කාලතුවකු ගැල්ද පසුවී ගියේය. දුන් මොස්කව් ඇත්තේ පසුපසිනි. මිහිදුම නැගෙමින් පැවතියේය. දවස උදාවෙමින් තිබිණි.

උදෑසන නගරයේ සිට පැමිණි අවස්ථාවේදී තිමූර් සහ යතුරු පැදිය යන දෙකම දක්නට නැති බව දුටු මොහොතේදී ජෝර්ජ් වහාම තිමූර් ඔහුගේ මව වෙත යැවීමට තීරණය කළේය.

ඔහු ඒ බව කියමින් ලිපියක් ලිවීමට හිඳගත් විගසම වාගේ ජනේලයෙන් පිටත බැලුවේ බොරළු පාර දිගේ නිවෙස කරා එන සොල්දාදුවෙකුගේ රුව දිටීය.

එසේ පැමිණි සොල්දාදුවා ඔහු අතට ලියුම් කවරයක් දිගු කළේය.

'ගරායෙව් සහෝදරයද?' ඔහු ඇසීය.

'ඔව්.'

'කරුණාකරල අත්සන් කරල මේක බාරගන්න.'

සොල්දාදුවා පිටව ගියේය. ලියුම් කවරය පරීක්ෂා කළ ජෝර්ජ් වැදගත් බවක් පාමින් සියුරුහන් බාන්නට විය.

ඔව්, එය ලැබී තිබේ. මෙතරම් කාලයක් ඔහු අපේක්ෂාවෙන් සිටි දෙය අවසන ලැබී තිබේ.

ලියුම් කවරය විවෘත කළ ඔහු එහි වූ ලිපිය කියවා තමන් ලියන්නට පටන් ගත් කරදාසිය පොඩිකර දැමීය. දැන් ඔහුට තිමූර් ඔහුගේ මව වෙත යැවිය නොහැකිය. ඒ වෙනුවට ඔහු ඇයට මෙහි එනමෙන් දන්වා විදුලි පණිවුඩයක් යැවිය යුතුය.

හරියටම ඒ මොහොතේදී තිමූර් කාමරයට ඇතුළු විය. ඔහු දුටු විගස ජෝර්ජ් මිට මෙලවූ අතින් මේසයට දැඩි පහරක් දුන්නේය. එහෙත් තිමූර් පසුපසින් ඔල්ගා සහ ජෙනී පැමිණියෝය.

'කෑගාන්න එපා.' ඔල්ගා කීවාය. 'ඔය විදිහට කෑගාන්නයි මේසෙට තඩිබාන්නයි ඕන නෑ. මේක තිමූර්ගෙ වරද නෙවෙයි. ඒක ඔයාගෙ වරද මේ මගෙත්.'

'අන්න හරි.' ජෙනී කීවාය. 'එයාට නං බණින්න එපා. ඔල්ගා ඔය මේසෙ අල්ලන්න එපා. එයාලගෙ රිවොල්වරේ පත්තු වෙනකොට මහ සද්දයක් එනව.'

ජෙනී දෙසත් රිවෝල්වරය දෙසත් බැලූ ජෝර්ජ් ඉන්පසුව පතුරු ගැලවී ගිය අළු බඳුන දෙසද බැලීය. දැන් ඔහුට සියල්ල පැහැදිලි වන්නට පටන් ගති.

'ජෙනී, එහෙනං ඔයාද එදා රෑ මෙහෙ නිදාගෙන හිටියෙ?' ඔහු ඇසීය.

'ඔව්, ඒ මං තමයි. මායි තිමූරුයි බූමිතෙල් ටිකකුයි පාන්කඩ කෑල්ලකුයි හොයාගෙන මෝටර්සයිකලේ පිහදාන අතරෙ ඔල්ගා ඔයා මෙයාට කතාව කියන්න.'

හමුදා නිලධාරියෙකු පසුදින ගේට්ටුවෙන් ඇතුළු වන අවස්ථාවේදී ඔල්ගා ආලින්දයෙහි හිඳ සිටියාය. ඔහු විශ්වාසී පියවරින් ඉදිරියට පැමිණියේ තම නිවසට එන්නකු පරිද්දෙනි. විමතියට පත් ඔල්ගා ඔහු පිළිගැනීමට නැගිට්ටාය.

ජෝර්ජ් දැන් යුධ ටැංකි බලකායේ කපිතාන්වරයකුගේ නිල ඇඳුමින් සැරසී ඔහු ඉදිරියේ සිටගෙන සිටියේය.

'මේ මොකද?' ඔල්ගා පහත් හඬින් ඇසුවාය. 'ඔයාගෙ ඔපෙරාවෙ අලුත් කොටසක්වත්ද?

'නෑ.' ජෝර්ජ් පිළිතුරු දුන්නේය. 'මං මේ ආවෙ ඔයාලට ගිහිල්ල එන්නං කියන්න. මේක අලුත් කොටසක් නෙවෙයි. මේක අලුත් නිල ඇඳුමක් විතරයි.'

'එහෙනං එදා...' ඔහුගේ නිල ඇඳුමෙහි වූ ලාංඡනය දෙස බලා මදක් මුහුණ රතු කරගනිමින් ඔල්ගා ඇසුවාය. 'අපි යකඩ විනිවිද කොන්ක්‍රීට් විනිවිද හදවතටම පහර දෙන්නෙමු කියල ඔයා කියපු කතාවෙ තේරුම මේකද?'

'ඔව්, ඒක තමයි. මොනව හරි මට ඇහෙන්න ගායනා කරන්න ඔල්ගා. මගෙ දිග, දිගම ගමනෙදි මතක තියාගෙන යන්න වටින මොනව හරි ගායනා කරන්න.'

ඔහු එසේ කියා එහි හිඳ ගති. ඔල්ගා සිය එකෝඩියනය අතට ගත්තාය.

ගුවන් නැවියනි, ගුවන් නියමුවනි
ප්‍රහාරකයිනි, සටන්කරුවනි
දුන් ඔබ සැම නික්ම ගොසිනි බෝ දුර
නැවත මා වෙත එන්නෙ කෙදිනද?
කිව නොහැක මට කවදාද ඒ
එකම දේ එනුමැනවි ආපසු
කවරදා හෝ කවර මොහොතක
ජයම වේවා කොහේ සිටියත්
ගොඩබිමෙහි, සමුදුර මතින් වුව
විදෙස් අහසෙහි සරන කල වුව
කොහේ සැරුවද ඔබ ගුවන් නැව
පියාපත් නිදුකින් තිබේවා
රතු තරුව හැම විට දිලේවා
ජයම ලැබ නිදුකින් දිනෙක ඔබ
නැවත මා වෙත රැගෙන ඒවා...

'ඔන්න.' ඇය කීවාය. 'හැබැයි ඒකෙන් කියවෙන්නෙ ගුවන් නැවියන් ගැන. මං ඉතිං යුද ටැංකි බලකායෙ අය ගැන කියන්න ගීතයක් දන්නෙ නෑනෙ.'

'ඒකට කමක් නෑ.' ජෝර්ජ් කීවේය. 'මගෙ හිතට අල්ලන මොනව හරි කිවුවොත් ඇති. ඔය සිංදු අමතක කරල දාන්න.'

කල්පනාවට වැටුණු ඔල්ගා ගැලපෙන වදන් සොයන්නට වූවා නිහඬව, මහත් අවධානයෙන් ඔහුගේ අළු පැහැ, තවදුරටත් මදහසින් තොරව පැවති දෑස දෙස බලාසිටින්නට වූවාය.

ජෙනී, තිමූර් සහ ටාන්යා ගෙවත්තෙහි සිටියෝය.

'මේ අහන්නකො.' ජෙනී කීවාය. 'ජෝර්ජ් යන්නයි හදන්නෙ. අපි ඔක්කොම එකතු වෙලා එයාට සමුදෙමු. අපි අංක එක දරණ පෙලපාලි සංඥාව නිකුත් කරමු. ඒක ගාලගෝට්ටියක් වෙයිද?'

'අපි එහෙම නොකරන එක හොඳයි.' තිමූර් කීවේය.

'ඇයි ඒ?'

'එහෙම නොකරන එක හොඳයි. අපි කවුරුවත් එහම යනව දැකල නෑනෙ.'

'ඔහ්, අපි එහම කරන එක හරි නැත්නම් එහෙම නොකර ඉමු.' ජෙනීද එකඟ වූවාය. 'මං ගිහිල්ල බොන්න මොනව හරි අරන් එනකං මෙතන වාඩිවෙලා ඉන්න.'

ඇය පිටත්ව ගියවිට ටාන්යා හිනාවෙන්නට පටන් ගත්තාය.

'මොකද වෙලා තියෙන්නෙ?' තිමූර් ඇසීය.

ටාන්යා තවත් හයියෙන් හිනාවෙන්නට පටන් ගත්තාය. 'අන්න ඔයාටම ගැලපෙන දක්ෂ කෙල්ලෙක්. එයා නං මාර කපටියි. මං කිවුවෙ අපේ ජෙනී. මං ගිහිල්ල බීම අරන් එන්නං, එහෙම තමයි එයා කිවුවෙ.'

'ඇටෙන්ෂන්!' මඩුවෙන් ජෙනීගේ ජයග්‍රාහී හඬ ගලා ආවේය. 'මෙන්න අංක එක දරණ පෙලපාලි සංඥාව.'

'ඔයාට නං පිස්සු.' තිමූර් වහා නැගිට්ටේය. 'දැන් මෙතනට සිය ගානක් පිරෙයි. ඔයා ඔය මොනවද කරන්නෙ?'

එහෙත් ඒ වනවිටද අර බයනි රෝදය කරකැවෙන්නට පටන්ගෙන හමාරය. කඹ ගැස්සී තදව ගියේය. ඒ සමග මඩුවල වහල යටින්, අට්ටාල කාමර තුළින්, කුකුළු කූඩු තුළින්, විවිධ සංඥා හඬවල්, ටින් බෙලෙක්ක සහ බෝතල් එකිනෙක ගැටෙන හඬ පැතිර යන්නට වූවේය.

ඒ වහාම සියයක් නොආවද අවම තරමින් යෞවනයෝ පණහක් පමණ සංඥාවට ප්‍රතිචාර දක්වමින් ගෙවත්තට දිව ආවෝය.

'ඔල්ගා.' ජෙනී ආලින්දයට පැන්නාය. 'අපිත් ජෝර්ජ්ට සමුදෙන්නයි හදන්නෙ. මෙතන අපි ගොඩක් ඉන්නව. ටිකක් බලන්නකො.'

'ඔහෝ!' විමතියට පත් ජෝර්ජ් කෑගැවේය. 'ඔයාල මෙතනට හුග දෙනෙක්ව ගෙන්නලනෙ. මං කියන්නෙ කෝච්චියක තශ්ගවල යුද පෙරමුණට වුනත් යවන්න තරම් කට්ටියක් මෙතන ඉන්නවනෙ.'

'ඒක හරියන්නෙ නෑ.' සුසුමක් හෙළු ජෙනී තිමූර් ගේ වදන්ම පැවසුවාය. 'සියළුම කොළුගැටවුන්ව එළවා දැමීම සඳහා තිළධාරීන් සහ ප්‍රධානීන්හට දැඩි නියෝග ලැබී තිබේ. මේක මහ ලැජ්ජාවක්. මටත් ඔය කොතන හරි ඉන්න පුළුවන්. මං කියන්නෙ සටනක, ප්‍රහාරයක කොතන හරි... මැෂින් තුවක්කු පෙරට ගමන් කරනු! අංක එක!'

'මේ තමයි ලෝකෙ ඉන්න පම්පෝරිකාරයන්ගෙ අංක එක.' ඔල්ගා ඇයට සරදම් කළාය. අනතුරුව එකෝඩියනයේ පටිය උරමත දමාගත් ඇය මෙසේ කීවාය.

'හොඳයි අපි එයාට සමුදෙන්නනං හදන්නෙ අපි ඒක නියම පිලිවෙලට කරමු. සංගීතයත් එක්කම.'

ඔවුහු ඒ අනුව මාවතට අවතීර්ණ වූවෝය. ඔල්ගා සිය එකෝඩියනය වාදනය කළාය. ඒ සමගම බෝතල්, බෙලෙක්ක, ටින්, වීදුරු, බරණි සහ කෝටු අතින් ගත් වාද්‍ය කණ්ඩායමක්ද ඉදිරියට ඇදී ඔල්ගාගේ වාදනයට සජීවී ලෙස තාලය අල්ලන්නට වීය.

එසේ ඔවුහු හරිත පැහැයෙන් දිලි වීදි දිගේ ගමන් කරන්නට වූවෝය. ඉදිරියට ඇදෙනවිට ඔවුන්ගේ සංඛ්‍යාවද ඉහල යන්නට විය. මුලදී නම් මිනිසුන්ට මේ ගෝෂාව සහ ගායනා කුමක් නිසා සිදු කෙරෙන්නේදැයි වටහාගත නොහැකි විණි. එහෙත් ඊට හේතුව පවසන ලද සැනින් මදහස පාමින් ඔවුහු ජොර්ජ් හට සුබපතන්නට ඉදිරිපත් වූවෝය.

ඔවුන් එසේ දුම්රිය පදික වේදිකාවට ගොඩවන විටම හමුදා දුම්රියක් ඇදී ගියේය.

එහි වූ මුල් මැදිරි සොල්දාදුවන්ගෙන් පිරී තිබුණි. රැස්ව සිටි පිරිස අත වනා ඔවුන්ට ආචාර කළෝය. ඉන්පසුව ආවේ කොල පැහැයෙන් යුතු හමුදා උපකරණ පටවන ලද ගැල් පෙලකි. ඊටත් පසුව ආවේ සතුන් ප්‍රවාහනය කරනු ලබනා ගැල්ය. අශ්වයෝ එතුළ හිඳ පිදුරු බුදිමින් හිස ගස්සනු දක්නට ලැබිණි. ජනතාව උන්ටද හුරේ දැමීය. අන්තිමටම ආවේ අළු පැහැ ටාර්පෝලින් රෙද්දකින් ආවරණය කරන ලද විසල් කෝණාකාර උපකරණයක් පටවන ලද විවෘත ගැලකි. එහි නැග දුම්රියේ පැද්දීමට අනුව පැද්දෙමින් මුරසෙබලෙක් ගමන් කළේය.

එසේ හමුදා දුම්රිය නොපෙනී ගිය අතර ඉන්පසු මගී දුම්රියක් එහි ඇදී ආවේය. තිමූර් සිය මාමාගෙන් සමුගති.

ඔල්ගා ද ජෝර්ජ් කරා ගියාය.

'එහෙනං සමුගනිමු.' ඇය කීවාය. 'හුඟ කාලෙකටද?'

සිය හිස සැලූ ඔහු ඇගේ අත තදින් අල්ලාගති.

'මං දන්නෙ නෑ. එහෙම නොවෙන්නය කියල ප්‍රාර්ථනා කරමු.'

නළා හඬක් නැගුණි. වාද්‍ය කණ්ඩායම වාදනය ඇරඹීය. දුම්රිය ඉවත ඇදී ගියේය.

ඔල්ගා කල්පනාබරව එහිම පසුවූවාය.

ජෙනීගේ දෑස් මහත් ප්‍රීතියකින් බැබලෙමින් පැවතියේය. එහෙත් ඇය ඊට හේතුව දැන සිටියේ නැති.

තිමූර් පසුවූයේ සිත් වේදනාවෙනි. එහෙත් ඔහු සිය හැඟීම් සඟවා ගන්නට වෙර දැරීය.

'ඉතිං.' ඔහු තමන්ගේදැයි හඳුනාගැනීමට බැරි හඬකින් කතා කරන්නට වූවේය. 'දැන් ඉතිං මං තනිවෙලා වගෙයි.' අනතුරුව සිය දෙවුර ගස්සාලමින් ඔහු මෙසේද එකතු කළේය. 'මොනව වුනත් හෙට අම්ම එනවනෙ.'

'එතකොට මේ මට මොකද වෙන්නෙ?' ජෙනී කෑගැවාය. අනතුරුව 'අරගොල්ලන්ට?' කියමින් සිය සගයන් පෙන්වා ඉන්පසු තිමූර් පැළඳ සිටි රතු තරුවද පෙන්වූවාය. 'මේකට මොකද වෙන්නෙ?'

'ඔයා දුක්වෙන්න එපා.' ඔල්ගා සිය කල්පනා ලෝකයෙන් මිදෙමින් තිමූර් ඇමතුවාය. 'ඔයා හැමවෙලාවෙම අනුන් ගැන කල්පනා කරනවනෙ. ඒ වගේම ඒ අයත් ඔයා ගැන කල්පනා කරාවි.'

තිමූර් සිය හිස ඔසවා බැලීය.

සැමවිටම සිටි පරිද්දෙන් මෙවරද ඔහු අභිමානවත් සහ සෘජු යෞවනයකු පරිද්දෙන් ඊට පිළිතුරු දුන්නේ ය. ඉදිත් දැස් සිය සගයන් වෙත යොමු කර මදහසක්ද පා ඔහු කීවේ මෙයයි.

'හැමෝම සතුටින් ඉන්නව කියල මට පේනව. ඉතිං මටත් එතකොට සතුටුයි තමා.'

අතීතයෙහිදී අසරු සේනාංක නික්මෙන්නට පෙර ඔත්තු බැලීම පිණිස පෙරමගට යවන ලද පුද්ගලයා හඳුන්වන ලද්දේ ගයිදාර් නමිනි. ඉදින් සිය දිවියෙහිදීද දේශය වෙනුවෙන් ඔත්තු සේවා සෙබලකු ලෙසද මෙහෙ කළ ඔහු ගයිදාර් යන්න තම නමට ඈඳා ගැනීමෙහි අරුමයක් නැති බව ඒ අනුව අපට පෙනෙයි. අර්කාදි සිය ළමා විය ගෙවනුයේ සිය පියා පළමු ලෝක මහා සංග්‍රාමයට නික්මෙන අයුරු දකිමිනි. සිය පියා අනුව යමින් යුදබිමට යාම පිණිස අර්කාදිද කරනුයේ නිවසින් පලා යාමය. එහෙත් නිවසින් කිලෝ මීටර් අනුවක් දුරදී ඔහු නතර කරනු ලැබ නැවත නිවෙස කරා එවනු ලැබිණි. මෙයින් අපට අර්කාදිගේ දිවිය තුළ හුන් නිර්භීත සටන්කරුවා හඳුනාගත හැකිය. මේ නිර්භීත යෞවනයාගේ සෙවනැළි අපට ඔහුගේ නිර්මාණ දිවිය පුරාම දකින්නට ලැබෙයි.

බෙදාහැරීම: දයිෂෙන් ... 076 900 5931

රුසියාව
ප්‍රකාශකයෝ

මිල රු. 720.00
Layout, Cover Design | PRAMUDITHA GRAPHICS
Print | NEO GRAPHICS

9 789550 745579